# (ඒ) විදේශීය වෙළඳාම

## පොදු උපනතීන්

1968 දී මුළු දේශීය අපනයන ඉපයීම් ඉකුත් වර්ෂය හා සසඳන විට රුපියල් වටිනාකමින්, කැපී පෙනෙන ලෙස වැඩි වී, මෙතෙක් සඳහන් වී ඇති ඉහලම මට්ටමට පත් විය. ඉපයීම් හි මෙම වැඩිවීම 1965 දී සිට දක්නට ලැබුණ පහල වැටීමේ උපනතිය තියුණු ලෙස හා කැපී පෙනෙන ලෙස වෙනස් කිරීමට ද උපකාරී විය. 1968 සඳහා වූ අපනයන සහ ආනයන වටිනාකම ඉකුත් වර්ෂයේ එම සංඛ්‍යාවන් සමග සසඳන කල, 1967 නොවැම්බරයේදී, රුපියල අවප්‍රමාණ කිරීම නිසා ඉහල නැගි වටිනාකම් සඳහා ඉඩහල යුතුය.

1968 වර්ෂය තුළදී ප්‍රති අපනයන ඇතුළු අපනයන වල වටිනාකම රු. දශ ලක්ෂ 2035 ක් වූ අතර, ආනයන වල වටිනාකම රු. දශ ලක්ෂ 2173[1] ක් වූයෙන් භාණ්ඩ වෙළඳාමෙන් රු. දශ ලක්ෂ 138 ක හිඟයක් ඇති විය.

1963 වර්ෂයේ සිට දිගටම ඉහලයමින් පැවැති අපනයන ඉපයීම්, 1966 සහ 1967 යන වර්ෂ යන්හි දී පහත වැටුනි. 1968 දී ලංකාවේ අපනයන වල වටිනාකම 1967 වර්ෂයේදී සටහන් වූ වටිනාකමට වඩා රු. දශ ලක්ෂ 345 ක නැතහොත් සියයට 20 ක වැඩිවීමක් පෙන්නුම් කරමින්, රු. දශ ලක්ෂ 2035[2] ක් විය.

1967 වර්ෂය තුළදී රු. දශ ලක්ෂ 290 කින් නැතහොත් සියයට 14 කින් තියුණු ලෙස පහලට වැටුණු අපනයන වල වටිනාකම, 1968 වර්ෂයේ දී තියුණු ලෙස ප්‍රසාරණය වී රු. දශ ලක්ෂ 2173 ක් වූයෙන්, රු. දශ ලක්ෂ 435 කින් නැතහොත් සියයට 25 කින් ඉකුත් වර්ෂයේ මට්ටම ඉක්ම විය.

1968 දී, මුළු වෙළඳ තත්වයෙහි, භාණ්ඩ වෙළඳාමෙන් රු. දශ ලක්ෂ 138 ක හිඟයක් සටහන් විය. මේ අනුව ආනයනයන්හි රුපියල් වටිනාකම බොහෝ සෙයින් වැඩිවී තිබියදීත්, 1967 දී වූ රු. දශ ලක්ෂ 48 ක වෙළඳ හිඟය හා මෙය සැසඳේ. ලංකාවේ විදේශීය වෙළෙඳාම පිළිබඳ දත්තයන්, රේගු වාර්තාවල සඳහන්ව ඇති අයුරු II (ඒ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි සපයා ඇත.

### II (ඒ) 1 සංඛ්‍යා සටහන

### විදේශීය වෙළෙඳාම 1964—68

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංක ( 1958 = 100 ) | | | | වෙළෙඳ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | | මිල | | |
| | අපනයන* (නැ.වි.ස.) | ආනයන (මි.ර.ගැ.) | වෙළෙඳ ශේෂය | මුළු අපනයන | මුළු ආනයන | මුළු අපනයන | මුළු ආනයන | |
| 1964 | 1,876 | 1,975 | — 99 | 119 | 105 | 93 | 107 | 86 |
| 1965 | 1,949 | 1,474 | +475 | 125 | 77 | 95 | 109 | 88 |
| 1966 | 1,700 | 2,028 | —328 | 114 | 107 | 90 | 119 | 76 |
| 1967 | 1,690 | 1,738 | — 48 | 119 | 85 | 85 | 132 | 69 |
| 1968 | 2,035 | 2,173 | —138 | 121 | 83 | 101 | 160 | 64 |

* ප්‍රති අපනයනයන් ඇතුළත්ය.

මූලය: ලංකා රේගු වාර්තා ; ශ්‍රී ලංකා මහ බැංකුව.

1. මුළු අපනයන වල සංඛ්‍යා ප්‍රවේසමෙන් විවරණය කළ යුතුය. ඉකුත් වර්ෂ වල වාර්ෂික වාර්තාවල දක්වූ පරිදි, ආනයන කල භාණ්ඩ රේගුවෙන් ඉවත් කිරීමත්, ඒ බව රේගු වාර්තාවල ලේඛන ගත වීමත් අතර සැලකිය යුතු කාල පරතරයක් ඇති වුවහොත්, ඇත්ත වශයෙන් ආනයන කල භාණ්ඩයන්ගේ වටිනාමෙහිත්, එම කාලසීමාව තුල රේගුවෙන් ඉවත් කල බවට වාර්තාවල සඳහන් වන භාණ්ඩයන්ගේ වටිනාකමෙහිත් වෙනසක් ඇතිවිය හැකිය. රජයේ ආනයන වලටත්, විශේෂයෙන්ම මුළු ආනයනයන්ගෙන් සැලකිය යුතු සමානුපාතයක් වන සහල්, පිටි සහ සීනි වලටත් අවශේෂයන්ම මෙය අදල වෙයි. මෙම භාණ්ඩයන් තුන ඇත්ත වශයෙන්ම ආනයන කොට ඇති ප්‍රමාණ හා රේගු වාර්තාවල සඳහන්ව ඇති ආනයන ප්‍රමාණ අතර ඇති වෙනස පිළිබඳව මතු ඡේදයක තරමක් දුරට සාකච්ඡා කෙරෙනු ඇත.
2. කෙසේ වෙතත් එක්සත් ජනපද ඩොලර් වලින් ලංකාවේ අපනයන ඉපැයීම් වල මුළු වටිනාකම 1968 දී ඩොලර් දශ ලක්ෂ 342 ක් වූයෙන් 1967 මුළු අපනයන ඉපයීම් හා සැසඳීමේදී ඩොලර් දශ ලක්ෂ 13 ක පිරිහීමක් සඳහන් විය.

ඉකුත් වර්ෂයේදීට වඩා 1967 වර්ෂයේ දී සියයට 4 කින් ප්‍රසාරණය වූ මුළු අපනයන පරිමාව, 1968 වර්ෂය තුළ දී ආන්තික වශයෙන් ප්‍රසාරණය වීය. මහ බැංකුවේ 1968 අපනයන පරිමා දර්ශකය ( පාදය 1958 = 100 ) ප්‍රතිශත අංක 121 ක් වීමෙන්, ඉකුත් වර්ෂයේ දීට වඩා සියයට 2 ක පමණ වැඩිවීමක් දැක්වීය. 1965 වර්ෂයේ දී සියයට 2 ක ඉහළ යාමක් දැක් වූ සියළු ම අප නයනවල සාමාන්‍ය මිලෙහි 1966 සහ 1967 යන වර්ෂ තුළ දී පහළ වැටීමක් සඳහන් වීය. අප නයනවල සාමාන්‍ය මිලෙහි පහළ වැටීමේ ප්‍රවනතාවය 1968 දී පුනරාවර්තනය වූ අතර, සියළු ම අපනයනවල සාමාන්‍ය මිල දර්ශකය ( පාදය 1958 = 1000 ) 1967 වර්ෂයේ දීපත් වුන මට්ටමට වඩා සියයට 19 කින් වැඩි වූයෙන්, ප්‍රතිශත අංක 102 ක් විය. රුපියල අවප්‍රමාණ කිරීම හේතු කොට ගෙන අපනයන මිලෙහි වැඩිවීම් සිදු වීය. එහෙයින්, 1968 වර්ෂයේ දී අපනයන අගයෙහි තියුණු වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සියළු ම අපනයනවල සාමාන්‍ය මිල කැපී පෙනෙන ලෙස වැඩිවීමයි ; අපනයන පරිමාව පුලුල්වීමෙන් ම එම බලපෑම තවත් ශක්තිමත් කෙරුණි. ( මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයන් ගෙන් මැනෙන අයුරු ( පාදය 1959 = 100 ) 1966 වර්ෂයේ ආනයන පරිමාව, ඉකුත් වර්ෂයේ පරිමා දර්ශකය හා සැසැඳීමේ දී සාපේක්ෂ වශයෙන් වැඩිවීමක් දැක්විය. 1966 දී සඳහන් වූ මුළු ආනයන පරිමාවෙහි වැඩිවීම 1967 දී පුනරාවර්තන වූයෙන්, මහ බැංකුවේ දර්ශකය 85 දක්වා සියයට 21 කින් පහළ වැටුණි. 1968 දී ද මුළු ආනයන පරිමාවෙහි තවදුරටත් පිරිහීමක් දැක් වුනු අතර, 1967 දර්ශකය හා සැසැඳීමේ දී සමස්ත පරිමා දර්ශකය, සියයට 2 ක සංකෝචනයක් දක්වමින් සියයට 83 ක් ව පැවතුණි. 1963 දී සිට නොනැවතී ඉහළ යමින් පැවති සියළු ආනයනවල සාමාන්‍ය මිලෙහි, ඉහළ යෑමේ උපනතිය සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී ද නොකඩවා පැවතුන අතර, මහ බැංකුවේ සියළුම ආනයන දර්ශකය ( පාදය 1950 = 100 ) 1967 පත් වූ මට්ටමට වඩා සියයට 30 කින් වැඩිවීමෙන් 168 ක් විය. එහෙයින්, 1968 දී ආනයනවල වටිනාකම කැපී පෙනෙන ලෙස වැඩිවීමට මුළුමනින් ම හේතු වී ඇත්තේ සියළු ම ආනයනවල සාමාන්‍ය මිලෙහි තියුණු ඉහළ යෑම් වූ අතර, ආනයන පරිමාවෙහි සුළු පහළ වැටීමකින් එහි බලපෑම තරමක් දුරට අඩු වීය.

ලංකාවේ භාණ්ඩ වෙළෙඳාම් අනුපාතිකය මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයන්ගෙන් මැනෙන අයුරු ඉකුත් වර්ෂ දෙකෙහි දී, එනම් 1966 දී සියයට 13 කින් ද 1967 දී සියයට 9 කින් ද පිරිහීමට පත් වූ අතර සමාලෝචනයට භාජන වන වර්ෂයේ දී තවදුරටත් අහිතකරව පැවතුනි. බැංකුවේ විදේශීය වෙළෙඳ දර්ශකය (1967 දී) 69 සිට (1968 දී) 64 දක්වා, එනම් සියයට 7 කින් පහළ වැටුණි.

රේගු වාර්තාවල සඳහන් වී ඇති මුළු ආනයන සංඛ්‍යා 1968 වර්ෂය තුළ දී ඇත්ත වශයෙන් ම ලැබී ඇති ආනයනවල වටිනාකම වැඩි කොට දක්වයි. 1967 දී ආනයන කොට ඇති සහල්, පිටි සහ සීනි ආදියෙහි ප්‍රමාණය, ආහාර කොමසාරිස්වරයා විසින් ඇත්තවශයෙන් ම ආනයන කොට ඇති එම ද්‍රව්‍යවල ප්‍රමාණයට වඩා රුපි. දශ ලක්ෂ 35 කින් අඩු කොට, රේගු වාර්තාවල සටහන් වී ඇති අතර, 1968 දී ආනයනය කොට ඇති මෙම ද්‍රව්‍යවල ප්‍රමාණය ආහාර කොමසාරිස් වරයාගේ සංඛ්‍යාවලට වඩා රුපි. දශ ලක්ෂ 34 ක් වැඩියෙන් රේගු වාර්තාවල සටහන් වී ඇත.

රේගු වාර්තාවල සඳහන් වී ඇති, 1967 සහ 1968 වර්ෂවල මුළු ආනයන ප්‍රමාණය ආහාර කොමසාරිස්වරයා විසින් නියත වශයෙන් ආනයන කොට ඇති සහල්, පිටි සහ සීනි වල ප්‍රමාණය දැක්වීමට නැවත සකස් කළහොත්, 1967 වර්ෂයේ මුළු ආනයන වල වටිනාකම රුපි. දශ ලක්ෂ 1738 සිට රුපි. දශ ලක්ෂ 1773 දක්වා වැඩි වන අතර, 1968 වර්ෂයේ ආනයනවල වටිනාකම රුපි; දශලක්ෂ 2173 සිට රුපි. දශ ලක්ෂ 2130 දක්වා අඩු වනු ඇත. එසේ නැවත සකස් කරන ලද ආනයන දත්තයන් අනුව, 1968 වර්ෂයේ ආනයනවල වටිනා කම රුපි. දශ ලක්ෂ 366 කින් නැතහොත් සියයට 21 කින් ඉකුත් වර්ෂයේ මට්ටම ඉක්මවීය.

රේගු වාර්තාවල සඳහන් වන අයුරු, භාණ්ඩ වෙළෙඳාම් ශේෂයෙහි 1968 දී රුපි. දශ-ලක්ෂ 138 ක හිඟයක් දැක්වුණු අතර, ඉකුත් වර්ෂයේ හිඟයවූ රුපි. දශ ලක්ෂ 48 හා සැසැඳේ. ආහාර කොමසාරිස්වරයා විසින් නියත වශයෙන් ආනයන කොට ඇති ප්‍රමාණය අනුව නැවත සකස් කරන ලද ආනයන දත්තයන් අනුව 1967 වර්ෂයේ භාණ්ඩ වෙළෙඳ ශේෂයෙහි හිඟය රුපි. දශ ලක්ෂ 48 සිට රුපි. දශ ලක්ෂ 83 දක්වා වැඩි වුන අතර, 1968 වර්ෂයේ හිඟය රුපි. දශ ලක්ෂ 138 සිට රුපි. දශ ලක්ෂ 104 දක්වා අඩු වනු ඇත.

**අපනයන**

1968 වර්ෂයේ අපනයන ඉපැයීම්වල රුපි. දශ ලක්ෂ 345 කින් වූ තියුණු ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ප්‍රධාන පොල් නිෂ්පාදන තුනෙහි ඉපැයීම්වල ඇති වූ කැපී පෙනෙන වැඩිවීමය. එතරම් කැපී පෙනෙන ලෙස නොවුවද, තේ, රබර් සහ වෙනත් දේශීය නිෂ්පාදන

වලින් ලද අපනයන ඉපැයීම් ද වැඩි වූ අතර, ප්‍රති අපනයනවලින් ලද ඉපැයීම්වල තරමක වැඩිවීමක් සඳහන් විය. අපනයනවල සැකැසුම ද, මුළු අපනයන ඉපැයීම්වලින් ඒවායේ සාපේක්ෂ ප්‍රතිශත කොටස් ද II (ඒ) 2 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්නුම් කෙරේ.

II (ඒ) 2 සංඛ්‍යා සටහන

**අපනයන සැකසුම. 1964 — 1968**

| භාණ්ඩ | වටිනාකම රුපියල් දශ ලක්ෂ* | | | | | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
| තේ ... ... ... ... | 1,148 | 1,210 | 1,027 | 1,061 | 1,162 | 61 | 62 | 60 | 63 | 57 |
| රබර් ... ... ... ... | 290 | 304 | 337 | 282 | 331 | 15 | 16 | 20 | 17 | 16 |
| ප්‍රධාන පොල් නිෂ්පාදන තුන ... | 273 | 275 | 196 | 167 | 331 | 15 | 14 | 12 | 10 | 16 |
| එය සැදුනේ ... ... ... | | | | | | | | | | |
| (අ) කොප්පරා ... ... | 55 | 49 | 25 | 18 | 34 | 3 | 3 | 2 | 1 | 2 |
| (ආ) පොල්තෙල් ... ... | 154 | 144 | 108 | 88 | 133 | 8 | 7 | 6 | 5 | 7 |
| (ඉ) කපාපු පොල් ... ... | 64 | 82 | 63 | 61 | 164 | 4 | 4 | 4 | 4 | 8 |
| අනෙකුත් දේශීය අපනයන ... | 137 | 127 | 116 | 121 | 152 | 7 | 6 | 7 | 7 | 8 |
| මුළු දේශීය අපනයන ... ... | 1,842 | 1,916 | 1,676 | 1,631 | 1,976 | 98 | 98 | 99 | 97 | 97 |
| ප්‍රති අපනයන ... ... ... | 34 | 33 | 24 | 59 | 60 | 2 | 2 | 1 | 33 | 3 |
| එකතුව ... ... ... | 1,876 | 1,949 | 1,700 | 1,690 | 2,035 | 100 | 100 | 100 | 100 | 100 |

මූලය: ලංකා රේගු වාර්තා.

* අපනයන ලැබීම් පිළිබඳ සංඛ්‍යා ලඟම දශ ලක්ෂයට ගණන් ගෙන තිබේ.

1968 දී තේ වලින් ලද අපනයන ඉපැයීම් 1967 ඉපැයීම්වලට වඩා රුපියල් දශ ලක්ෂ 101 කින්, නැතහොත් සියයට 10 කින් වැඩි වීය. ඉපැයීම්වල වැඩිවීමට මුළු වශයෙන් ම හේතු වූයේ ලබා ගන්නා ලද නැ. වි. ස. මිලෙහි ඇති වූ වැඩිවීම වූ අතර, අපනයන පරිමාවෙහි පහළ වැටීමක් ඇති වූයෙන්, එහි ප්‍රතිවිපාක තරමක් දුරට මැකී ගියේය. ඉකුත් වර්ෂයන් තුනෙහි දී පහළ වැටුණු තේ වල සාමාන්‍ය නැ. වි. ස. මිලෙහි, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී වැඩිවීමක් සටහන් විය. 1967 වර්ෂයේ දී ලද මිලට වඩා රාත්තලකට ශත 30කින් නැතහොත් සියයට 14 කින් ඉහළ යාමක් ඇති වූයෙන්, රාත්තලක මිල රු. 2.52 ක් වීය. 1968 වර්ෂයේ දී අපනයන කළ තේ ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 460 ක් වීය. මේ වූකලී, 1967 වර්ෂයේ දී අපනයන කළ ප්‍රමාණයට වඩා රාත්තල් දශ ලක්ෂ 18 ක නැතහොත් සියයට 4 ක අඩුවීමකි. මුළු අපනයන ඉපැයීම්වල තේ අපනයන ඉපැයීම්වලට හිමි කොටස, ඉකුත් වර්ෂයේ ප්‍රතිශතය හා සසඳන විට සියයට 6 ක පහළ වැටීමක් දක්වමින් සියයට 57 ක් ව පැවතුනි.

අනෙක් අතට, රබර්වලින් ලද ඉපැයීම් ඉකුත් වර්ෂය හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 49 කින් නැතහොත් සියයට 17 කින් වැඩි වීය. මෙයට හේතු වී ඇත්තේ, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී අපනයන ප්‍රමාණයේ වූ වැඩිවීම හා සාමාන්‍ය නැ. වි. ස. මිලෙහි ඇති වූ ඉහළ යෑමය. අපනයන කළ රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 37 කින් නැතහොත් සියයට 37 කින් වැඩි වූ අතර, සෑම වර්ගයකම රබර්වල සාමාන්‍ය නැ. වි. ස. මිල රාත්තලක් රු. 1.01 ක් වූයෙන් ඉකුත් වර්ෂයේ මිල හා සසඳන විට රාත්තලකට ශත 4 ක වැඩිවීමක් දක්වීය. මුළු අපනයන ඉපැයීම්වල රබර් අපනයන විසින් ලබාගත් කොටස සියයට 16 දක්වා පහළ වැටුණි. මේ වූ කලී 1967 වර්ෂයේ ලබාගත් කොටසට වඩා සියයට 1 ක අඩුවීමකි.

ප්‍රධාන පොල් නිෂ්පාදන තුනෙන් ( කොප්පරා, පොල් තෙල් සහ කපාපු පොල් ) ලද අපනයන ඉපැයීම් ඉකුත් වර්ෂයේ ඉපැයීම්වල වටිනාකම හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 164 කින් නැතහොත් සියයට 98 කින් තියුණු ලෙස වැඩි වීය. මෙම වැඩිවීමට හේතු වී ඇත්තේ මුළු අපනයන පරිමාව සියයට 17 කින් ඉහළයාම හා ( මහ බැංකුවේ වෙළෙඳ දර්ශකවලින් මැනෙන අයුරු ) ඒවායේ සාමාන්‍ය අපනයන මිලෙහි ඇති වූ සියයට 60 ක කැපී පෙනෙන වැඩිවීම වීය. මුළු අපනයන ඉපැයීම්වලින්, පොල් නිෂ්පාදන තුන විසින් ලබාගත් කොටස සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී සියයට 16 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ දී එය සියයට 10 ක් වීය.

1967 දී රුපියල් දශ ලක්ෂ .5 කින් නැතහොත් සියයට 4කින් වැඩි වූ අනෙක් දේශීය අපනයන ඉපැයීම් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී රුපියල් දශ ලක්ෂ .31 කින් නැතහොත් සියයට 26 කින් තවදුරටත් වැඩි වීය. 1967 දී සැලකිය යුතු වැඩිවීමක් දක් වූ ප්‍රති අපනයනවල වටිනාකම 1968 දී රුපියල් දශ ලක්ෂ 1 කින් තවදුරටත් වැඩි වීය.

තෝරාගත් සුළු අපනයන කිහිපයක අපනයන පරිමාව, මිල ගණන් සහ වටිනාකම පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් 242 වැනි පිටුවෙහි දක්වේ.

තේ,

1968 දී තේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 496 ක් විය. 1967 වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලද ප්‍රමාණයට වඩා රාත්තල් දශ ලක්ෂ 9 ක නැතහොත් සියයට 2 ක වැඩිවීමකි. කෙසේ වෙතත්, 1966 දීට වඩා වූ වැඩිවීම රාත්තල් දශ ලක්ෂ 6 ක් නැතහොත් සියයට 1 ක් විය. 1968 දී නිෂ්පාදනය ඉහළ මට්ටමකට පත්වීමට මුළුමනින් ම හේතු වී ඇත්තේ, වර්ෂයේ දෙවන සහ හතර වන කාර්තුවලදී පැවති සතුටුදායක කාලගුණය විය.[1] ඉකුත් වර්ෂයේ දීට වඩා ඉහළ මිලකින් නිෂ්පාදකයන් ලද අනුබලය, මුළු නිෂ්පාදනයේ වැඩිවීමට හේතු වූ තවත් සාධකයක් විය හැකිය. මෙම නිරීක්ෂණය නියත වශයෙන් තහවුරු කිරීමට නොහැකිවුවත්, නිරන්තර ලෙස ඉහළ නගිමින් තිබූ මිලෙහි බලපෑම, නිෂ්පාදනයෙහි ප්‍රසාරණයක් ඇති කිරීමට පෙළඹවීමට ඉඩ ඇත. 1967 නොවැම්බර් මස ලංකා රුපියල අවප්‍රමාණ කිරීම, නිෂ්පාදන මිල ඉහළ යෑමට හේතු විය. නිෂ්පාදනයෙහි වැඩිවීම බිම් මට්ටම් තුනෙහි තේ වගාව අතර බෙදී ගියේ ය. 1967 වර්ෂය හා සසඳන විට, උස් බිම්, මැදි බිම් හා පහත් බිම් වගාවල තේ නිෂ්පාදනය පිළිවෙලින් රාත්තල් දශ ලක්ෂ 2.7 කින්, 4.1 කින් හා 2.0 කින් වැඩි වී ඇත. නිෂ්පාදනය, අපනයන, කොළඹ වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණය, ලංඩන් වෙන්දේසිය සඳහා නැව්ගත කළ ප්‍රමාණය සහ පුද්ගලික ගිවිසුම් යටතේ විකුණූ ප්‍රමාණය II (ඒ)3 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## II (ඒ) 3 වැනි සංඛ්‍යා සටහන

නිෂ්පාදනය, අපනයන හා කොළඹ වෙන්දේසියේ විකුණූ තේ ප්‍රමාණය සහ
ලංඩන් වෙන්දේසි වලට නැව්ගත කරන ලද ප්‍රමාණයන්

රාත්තල් දශ ලක්ෂ

| වර්ෂය | නිෂ්පාදනය | අපනයන: රේගු සංඛ්‍යා | අපනයන: නියම නැව්තොග | කොළඹ වෙන්දේසියේ විකුණූ ප්‍රමාණය | කෙළින්ම ලංඩනයට නැව්ගත කෙරුන ප්‍රමාණය | පුද්ගලික විකිණීම් * |
|---|---|---|---|---|---|---|
| 1965 ... | ... 503 | 495 | 474 | 368 | 125 | — |
| 1966 ... | ... 490 | 441 | 441 | 359 | 108 | — |
| 1967 ... | ... 487 | 478 | 480 | 369 | 110 | 5 |
| 1968 ... | ... 496 | 460 | 446 | 369 | 111 | 5 |

මූලය: තේ පාලක තැනගේ පාලන වාර්තාව
ලංකා රේගු වාර්තා
කොළඹ බ්‍රෝකර්වරුන් ගේ සංගමය.

* පෞද්ගලික තේ විකුණුම් 1968 මාර්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක විය. මෙකී විකුණුම් ඇ. එ. ජ. සහ කැනඩාවට සීමා විය.

1968 දී අපනයන කළ තේ ප්‍රමාණය 1967 ප්‍රමාණයට වඩා රාත්තල් දශලක්ෂ 18කින් නැතහොත් සියයට 4 කින් අඩු විය. අපනයනය කළ තේ ප්‍රමාණයේ අඩුවීමට බොහෝ දුරට හේතු වූයේ 1968 ජනවාරි සහ අප්‍රේල් යන මාසවල දී වාණිජ අංශයේ පැවැති වැඩ වර්ජන තත්වයයි. 1968 දී කොළඹ වෙන්දේසියේ විකුණනු ලැබූ තේ ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 369 ක් වූ අතර, ලංඩන් වෙන්දේසිය සඳහා කෙළින් ම නැව්ගත කළ තේ ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 111 ක් විය. 1967 වර්ෂයට අදාල වන ඒ ඒ සංඛ්‍යා පිළිවෙලින් රාත්තල් දශ ලක්ෂ 369 ක් සහ රාත්තල් දශ ලක්ෂ 110 ක් විය. පුද්ගලික විකිණීම් මාර්ගයෙන් රාත්තල් දශ ලක්ෂ 5 ක් විකුණන ලදී. ඉකුත් වර්ෂයේ මේ ආකාරයෙන් නැව්ගත කරනු ලැබූ තේ ප්‍රමාණය ද රාත්තල් දශ ලක්ෂ 5 ක් විය. නිෂ්පාදනය කරන ලද තේ තොග 1967 දී රාත්තල් දශ ලක්ෂ 47 සිට 1968 දී රාත්තල් දශ ලක්ෂ 63 දක්වා වැඩි වීම ලබාගත හැකි දත්තයන් ගෙන් දැක්වෙයි.

1. තේ වගා කරන දිස්ත්‍රික්කයන්හි පැවති නියඟය 1968 මුල් කාර්තුවේ තේ නිමැවුම කෙරෙහි විෂම බලපෑමක් ඇති කරන ලදී.

රාත්තල් දහස් ගණනින්

| | පළමුවැනි කාර්තුව 1968 | 1967 | 1966 |
|---|---|---|---|
| උඩරට ... ... ... ... | 40.3 | 44.7 | 51.7 |
| මැද-රට ... ... ... ... | 39.9 | 41.8 | 42.7 |
| පහත-රට ... ... ... ... | 28.3 | 29.4 | 34.3 |
| සියළුම තේ ... ... ... ... | 108.5 | 116.0 | 128.8 |

මූලය: තේ පාලක දෙපාර්තමේන්තුව.

රේගු වාර්තා සපයන සංඛ්‍යා තොරතුරු අනුව, ලංකාවේ තේ සම්බන්ධයෙන් හොඳම ගනුදෙනු කාරයා එක්සත් රාජධානිය විය. 1968 දී ඇය විසින් මිලට ගෙන ඇති ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 163 ක් වූ අතර, 1967 දී ලබා ගෙන ඇති ප්‍රමාණය වූ රාත්තල් දශ ලක්ෂ 183 හා සැසැඳේ. 1968 දී එක්සත් රාජධානිය වෙත අපනයනය කළ තේ ප්‍රමාණය අපනයනය කරන ලද මුළු තේ ප්‍රමාණයෙන් සියයට 35 ක් වූ අතර, 1967 දී මෙය සියයට 38 ක් විය. දෙවන ස්ථානයට පත්ව ඇත්තේ තේ රාත්තල් දශ ලක්ෂ 42 ක් මිලට ගත් ඉරාකයයි. 1967 දී ඇය විසින් මිලට ගෙන ඇති ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 29 කි. ඉරාකයට අපනයනය කළ තේ ප්‍රමාණයෙහි ප්‍රතිශත කොටස 1968 දී 9 ක් වූ අතර, 1967 දී එය 6 ක් විය. තුන් වැනි ස්ථානයට පත්ව ඇත්තේ රාත් තල් දශ ලක්ෂ 38 ක් ( මුළු අපනයනවලින් සියයට 8 ක් ) මිලට ගත් ඇමෙරිකා එක්සත් ජනපද යයි. 1968 දී ඇය විසින් මිලදී ගත් තේ ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 46 ක් ( මුළු අපනයන වලින් සියයට 10 ක්) විය. රාත්තල් දශ ලක්ෂ 36 ක් (එනම් සියයට 8 ක්) මිලට ගනු ලැබූ ඕස්ට්‍රේලියාව හතර වන ස්ථානයට පත් විය. වසරකට ඉහත දී ඇය විසින් මිලට ගෙන ඇති ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 41 ක් ( එනම් සියයට 9 ක් ) විය.

**කොළඹ වෙන්දේසි**

1967 හතර වැනි කාර්තුවේ දී පටන් ගත් වෙළෙඳ පොලේ තේ මිල වැඩිවීම 1968 මුල් කාර්තු තුන තුළ දී නොකඩවා පැවතුනි. බිම් මට්ටම් තුනෙහි ම වගා කළ තේ වල මිලෙහි පහළ වැටීමක්, 4 වැනි කාර්තුව තුළ දී දක්නට ලැබුණි. මෙසේ මිල පහලයාමට හේතු වූයේ මෙම කාලසීමාව තුලදී අස්වැන්න[1] ලබාගත් වගාවන්ගේ සංඛ්‍යාව වැඩිවීම නිසා තත්වයෙහි වාරික පහත වැටීමත් අධික සැපයුමෙන් ඇතිවූ පීඩනයත් නිසාය. කොළඹ වෙන්දේසියේ විකුණනු ලැබූ තේවල සාමාන්‍ය මිල 1967 දී එයට කලින් වර්ෂයට වඩා රාත්තල ශත 7 කින් හෙවත් සියයට 4 කින් පහළ වැටුනු අතර, 1968 දී රාත්තල ශත 25 කින් හෙවත් සියයට 16 කින්, ඉහල ගොස් රාත්තල රු. 1.75 දක්වා වැඩි විය. මෙම මිල ඉහළ යාම තේ තෙවර්ගය අතර බෙදී ගියේය. තේ වර්ග තුනෙහි ම මිල මට්ටම් ඉහළ ගිය ද, එක් එක් වර්ගයේ තේ මිල ඉහළ යාමේ ප්‍රමාණයන් හී සැහෙන තරම් වෙනස්කම් දක්නට තිබුණි. උඩරට තේවල සාමාන්‍ය මිල, අඩු ප්‍රමාණයකින් ඉහළ ගියේ ය; එනම්, රාත්තල ශත 11 කින් හෙවත් සියයට 6 කින් වැඩිවූ අතර, මැදරට තේ රාත්තල ශත 20 කින් හෙවත් සියයට 14 කින් ඉහළ ගියේ ය. කෙසේ වුවද, වැඩිම ඉහළ යාම දක්නට තිබුනේ පහත රට තේ සම්බන්ධයෙනි. මේවායේ සාමාන්‍ය මිල රාත්තල රු. 1.63 ක් වූ අතර, 1967 ට වඩා රාත්තල ශත 43 කින් හෙවත් සියයට 36 කින් වැඩි විය. II (ඒ) 4 වැනි සංඛ්‍යා සටහනින් තේ නිෂ්පාදනය, අපනයන සහ මිල දැක්වේ :—

**II (ඒ) 4 වැනි සංඛ්‍යා සටහන**

තේ — නිෂ්පාදනය, අපනයන සහ මිල 1964 — 1968

| වර්ෂය | | නිෂ් පාදනය | අපනයන | | කොළඹ වෙන්දේසියේ රාත්තලක සාමාන්‍ය ශුද්ධ මිල | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය රා. දශ ලක්ෂ | ප්‍රමාණය රා. දශ ලක්ෂ | රාත්තලක නැ.වි.ස. මිල රු. ශත | උඩරට | මැදරට | පහත රට | සියළුම තේ වර්ග |
| 1964 | ... ... | 482 | 456 | 2.51 | 1.93 | 1.58 | 1.49 | 1.68 |
| 1965 | ... ... | 503 | 495 | 2.45 | 1.93 | 1.66 | 1.64 | 1.75 |
| 1966 | ... ... | 490 | 441 | 2.33 | 1.84 | 1.46 | 1.37 | 1.57 |
| 1967 | ... ... | 487 | 478 | 2.22 | 1.82 | 1.47 | 1.20 | 1.80 |
| 1968 | ... ... | 496 | 460 | 2.52 | 1.93 | 1.67 | 1.63 | 1.75 |
| 1967 | 1 වැනි කාර්තුව ... | 116 | 121 | 2.31 | 1.89 | 1.46 | 1.10 | 1.48 |
| | 2 වැනි කාර්තුව ... | 143 | 118 | 2.17 | 1.66 | 1.33 | 1.04 | 1.34 |
| | 3 වැනි කාර්තුව ... | 104 | 137 | 2.10 | 1.80 | 1.44 | 1.20 | 1.48 |
| | 4 වැනි කාර්තුව ... | 124 | 102 | 2.34 | 1.97 | 1.70 | 1.49 | 1.72 |
| 1968 | 1 වැනි කාර්තුව ... | 109 | 108 | 2.48 | 1.97 | 1.67 | 1.61 | 1.75 |
| | 2 වැනි කාර්තුව ... | 157 | 89 | 2.51 | 1.92 | 1.67 | 1.69 | 1.76 |
| | 3 වැනි කාර්තුව ... | 91 | 156 | 2.52 | 1.97 | 1.73 | 1.67 | 1.79 |
| | 4 වැනි කාර්තුව ... | 139 | 107 | 2.58 | 1.86 | 1.60 | 1.58 | 1.68 |

මූලය : තේ පාලකගේ පාලන වාර්තා ;
ලංකා රේගු වාර්තා ;
කොළඹ තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය.

1. 1968 දෙසැම්බර් 31 වනදයින් අවසන් කාර්තුව සඳහා සීමාසහිත ෆෝබ්ස් සහ වෝකර් වෙළඳ වාර්තාවේ දෙවැනි සහ පස්වැනි පිටු.

1968 මුල් කාර්තුව තුළ දී උඩරට තේවල සාමාන්‍ය ශුද්ධ මිල 1967 අනුරූප කාර්තුව හා සැසැඳීමේ දී රාත්තලකට ශත 8 ක ඉහළ යාමක් පිළිබිඹු කළාය. දිඹුල සෘතුව දික්ඔය අවසන්වීමත් සමග ම, දෙ වැනි කාර්තුව තුළ දී වෙළෙඳ මිල සාමාන්‍ය වශයෙන් පූර්ව කාර්තුව තුළ දී පැවැති මට්ටමින් රාත්තල ශත 5 කින් අඩු වී රාත්තල රු. 1.92 ක් විය. 1967 අනුරූප කාර්තුව හා සැසැඳීමේ දී තේ මිල, රාත්තල ශත 26 කින් වැඩි විය. තුන්වැනි කාර්තුව තුළ දී උඩරට තේවල වෙළෙඳ මිල රාත්තල රු. 1.97 ක් වූ අතර, එය පසුගිය වර්ෂයෙහි අනුරූප කාලඡෙදය තුළ දී පැවැති මිලට වඩා රාත්තල ශත 17 කින් වැඩි විය. කෙසේ වුවද, අවසන් කාර්තුවේ දී ඌව තේවල තත්වයෙහි වාරික පහළ වැටීමක් සහ මෙම කාලඡෙදය තුළ දී නිෂ්පාදනය වැඩිවීමෙන් ඇති වූ අතිරික්ත සැපැයුමෙහි පීඩනය ද හේතු කොට ගෙන,වෙළෙඳ මිල පහළ දැමීමේ පීඩනයක් ඇති වී එම කාර්තුව තුළ දී සාමාන්‍ය මිල රාත්තල රු. 1.86 දක්වා පහළ වැටුනේ ය; කාර්තුවේ මිල සාමාන්‍යය රාත්තලට ශත 11 කින් අඩු වූ අතර, 1967 අනුරූප කාර්තුව හා සැසැඳීමේ දී ද එම ප්‍රමාණයෙන් ම අඩු වූ යේ ය.

මැද රට තේවල සාමාන්‍ය මිල, උඩරට තේවල වෙළෙඳ මිලෙහි උපනතියම අනුගමනය කරමින් වර්ෂයෙහි මුල් කාර්තු තුන තුළ දී වේගයෙන් ඉහළ යාමක් පෙන්නුම් කළාය. 1968 මුල් කාර්තුව තුළ දී සාමාන්‍ය මිල 1967 අනුරූප කාර්තුව හා සැසැඳීමේ දී රාත්තල ශත 21 කින් වැඩි වූ අතර, දෙ වැනි හා තුන් වැනි කාර්තුවල දී, රාත්තල ශත 34 කින් සහ රාත්තල ශත 29 කින් ඉහළ ගියේ ය. කෙසේ වුව ද, වර්ෂයේ අවසන් කාර්තුවේ දී, උඩරට තේ මිල අනුව යමින්, සාමාන්‍ය මිල රාත්තල ශත 10 කින් පහළ වැටුනේ ය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී පහත රට තේ සඳහා වෙළෙඳ ඉල්ලුම සැලකිය යුතු අන්දමින් වර්ධනය වීමෙන්, එක් එක් කාර්තුව තුළ දී වූ සාමාන්‍ය මිල මට්ටම් 1967 අනුරූප කාර්තුන් හා සැසැඳීමේ දී තියුණු ලෙස ඉහළ ගියහ. මෙම ප්‍රතිඵලයට ප්‍රධාන හේතුව වූයේ විශේෂයෙන් ඉරාකය වැනි මැද පෙරදිග මිල දී ගනුවන් ගේ ඉල්ලුම් වර්ධනය වීමය. ඉරාකයට අපනයනය කළ තේ ප්‍රමාණය 1968 දී වඩා තියුණු අන්දමින්, රාත්තල් දශ ලක්ෂ 42 දක්වා වැඩි විය. එනම්, 1967 දී අපනයනය කළ තේ ප්‍රමාණය හා සැසැඳීමේ දී රාත්තල් දශ ලක්ෂ 13 ක හෙවත් සියයට 46 ක වැඩිවීමක්, මුල් කාර්තු තුන තුළදී සාමාන්‍ය මිල මට්ටම් පිළිවෙලින් රාත්තල ශත 51 කින්ද, රාත්තල ශත 45 කින් ද, රාත්තල ශත 47 කින් ද, 1967 අනුරූප කාර්තු වලට වඩා ඉහළ ගියේය. කෙසේ වුවද, තෙවැනි සහ සිව් වැනි කාර්තුන් තුළදී පූර්ව කාර්තුන්ට වඩා මිල මට්ටම් අඩු වූ අතර, මෙය වැඩිවීමේ අනුපාතයෙහි පහළ වැටීමක් විද්‍යාමාන කෙළේය. රාත්තල 1.58 ක් වූ සිව්වැනි කාර්තුවෙහි සාමාන්‍ය ශුද්ධ මිල 1967 එම කාර්තුවෙහි මිලට වඩා රාත්තල ශත 9 කින් වැඩි විය. 1968 තුන්වැනි සහ සිව්වැනි කාර්තුන් තුළදී පහල වූ පහත රට තේ මිලෙහි සුලු ඉහල යාම් වලට බොහෝ වශයෙන් හේතු වූයේ, සැප්තැම්බර් මාසයේ දී, විශේෂයෙන් ඉරාකය ඇතුළු මැද පෙරදිග රටවල් තමන් කරන මිලදී ගැනීම් සීමා කිරීම සහ නොවැම්බර් 23 වැනි ද සිට සති තුනක කාලයකට ඉරාක රජයේ ගැනුම් මණ්ඩලය කොළඹ වෙළෙඳ පොලෙන් ඉවත් වීමය.1

1967 නොවැම්බරයේ දී ලංකා රුපියල අවප්‍රමාණය කිරීමත් සමගම, 1966 සැප්තැම්බරයේ දී පිහිටුවනු ලැබූ අපනයන තීරුබදු ප්‍රතිදන ක්‍රමය අහෝසි කළ අතර, තේ රාත්තලක් වෙනුවෙන් වූ අපනයන තීරු බද්ද ශත 35 කින් ශත 40 දක්වා වැඩි කරනු ලැබීය. අවප්‍රමාණය කිරීමේ හේතුවෙන් නිෂ්පාදන වියදම් ඉහළ ගිය තේ නිෂ්පාදකයින්ට සහණයක් දීමේ අදහසින් 1968 ජනවාරියේ සිට, සංශෝධනය කළ තේ අපනයන තීරුබදු ප්‍රතිදන ක්‍රමයක්,නැවත රජය විසින් ඇති කරන ලදී. ආරම්භයේ දී, මෙම වැඩ පිළිවෙලෙහි අභිප්‍රාය වූයේ, කොළඹ වෙන්දේසිය මගින් මිල කෙරුනු සියළුම මැද රට සහ පහත රට තේ වෙනුවෙන් රාත්තලකට ශත 5 ක ප්‍රතිදනයක් ගෙවීමය. 1968 ඔක්තෝබර් 29 වැනි දින වෙන්දේසියෙහි සිට මෙම ප්‍රතිදන ක්‍රමය, කොළඹ වෙන්දේසියෙහි මිල කෙරුනු උඩරට තේ සම්බන්ධයෙන් ද යොදනු ලැබීය.

II (ඒ) 5 වැනි සංඛ්‍යා සටහනින් 1968 දී ප්‍රතිදනය ගෙවනු ලැබූ තේ ප්‍රමාණයන් ද, ප්‍රතිදනය ලෙස ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය ද දැක්වේ.

---

1. සීමාසහිත ෆෝබ්ස් සහ වෝකර් සමාගම : 1968 සැප්තැම්බර් අවසන් කාර්තුව වෙනුවෙන් නිකුත් කළ වෙළඳ වාර්තාව, පිටු 4 සහ 1968 දෙසැම්බර් අවසන් කාර්තුව අවසානයේ දී, පිටු 3.

## II (ඒ) 5 වැනි සංඛ්‍යා සටහන

කොළඹ වෙන්දේසියේ තේ අපනයන තීරුබද්ද ප්‍රතිදන ක්‍රමය

| | ප්‍රතිදනය ගෙවූ (තේ) ප්‍රමාණයන් (රාත්තල්) | ගෙවන ලද ප්‍රතිදනයේ වටිනාකම (රුපියල්) |
|---|---|---|
| උඩරට තේ ... ... ... ... | 22,123,996 | 1,106,180 |
| මැද රට තේ ... ... ... | 129,133,760 | 6,456,688 |
| පහත රට තේ ... ... ... | 113,743,537 | 5,687,177 |
| සියලුම තේ වර්ග ... ... ... | 265,000,893 | 13,250,045 |

මූලය: තේ පාලක දෙපාර්තමේන්තුව.

1968 කොළඹ වෙන්දේසියෙහි ඉදිරිපත් වූ රාත්තල් දශ ලක්ෂ 368.8 ක මුළු තේ ප්‍රමාණයෙන් තේ රාත්තල් දශ ලක්ෂ 265.0 කට ශත 5 ගේ අපනයන තීරුබද්ද ප්‍රතිදනය ලැබුණි. 1968 දී මෙම වැඩ පිළිවෙල යටතේ ප්‍රතිදනයන් වෙනුවෙන් කළ මුළු වියදම රුපි. දශ ලක්ෂ 13.3 ක් වූ අතර, මැද රට තේ වෙනුවෙන් රුපි. දශ ලක්ෂ 6.5 ක් හෙවත් සියයට 49 ක්ද, පහත රට තේ වෙනුවෙන් රුපි. දශ ලක්ෂ 5.7 ක් හෙවත් සියයට 43 ක්ද ගෙවනු ලැබීය. කෙසේ වුවද, උඩරට තේ වෙනුවෙන් වූ ප්‍රතිදනය රුපි. දශ ලක්ෂ 1.1 ක් හෙවත් සියයට 8 කට පමණක් සීමා වූයේ, මෙම තේ වර්ගය ප්‍රතිදන ක්‍රමය යටතට පත් වූයේ ඔක්තෝබර් 29 වැනි ද සිට වූ බැවිනි. ගෙවන ලද ප්‍රතිදනයේ සාමාන්‍ය වටිනාකම, එක් වෙන්දේසියකදී රුපි. 294,445 ක් විය.

### ලන්ඩන් වෙන්දේසි[1]

ලන්ඩන් තේ වෙළෙඳ පොලෙහි වෙන්දේසි මිල පහල වැටීම 1967 දී තාවකාලික වශයෙන්, මැඩලී ගිය නමුදු, 1968 දී තවදුරටත් පහළ වැටුනි. රාත්තල සිලිං 3 පැන්ස 11.63 ක්වූ මෙම මධ්‍යස්ථානයෙහි විකුණනු ලැබූ තේ වල සාමාන්‍ය මිල ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී රාත්තලකට පැන්ස 2.18 ක පහල වැටීමක් පෙන්නුම් කළේය. මෙම මිල පහල වැටීම ඉකුත් වර්ෂයෙහි මිල ඉහළ යාම වූ පැන්ස 0.95 හා සැසඳේ. වර්ෂයේ මුල් භාගය තුළදී තේ මිලෙහි තියුණු උච්චාවචනයන් පැවතුන අතර, 1968 මුල් භාගයේදී මෙම මධ්‍යස්ථානයෙහි මිල කරන ලද සියළුම තේ වර්ගවල සාමාන්‍ය මිල රාත්තල සිලිං 3 පැන්ස 11.51 ක් විය; මෙය පසුගිය වර්ෂයේ අනුරූප කාලච්ඡේදයෙහි වූ මිලට වඩා රාත්තල පැන්ස 0.38 කින් වැඩි විය. ජූලි මාසයෙහි ආරම්භ වූ මිල පහළ වැටීම, 1968 දෙවැනි භාගය මුළුල්ලේම පැවතුනි. ලන්ඩන් වෙළඳ පොලෙහි මිල පහළ යාමට හේතු වූ සාධක අතර පොදු වශයෙන් අතිරික්ත නිෂ්පාදනයක් පැවැති අවස්ථාවකදී සාමාන්‍ය තේ වැඩියෙන් පැවතීම, නිෂ්පාදන රටවල වැඩ වර්ජන පැවතීමේ හේතුවෙන් තේ අපනයනයන් ප්‍රමාද වී ඒවායේ අළුත් බව අඩු වීම, පසුගිය වාරයට වඩා උතුරු ඉන්දියානු තේවල තත්වය පහළ වැටීම, ලන්ඩන් වෙන්දේසියෙහි මිල කෙරුන තේ ප්‍රමාණය වැඩි වීම, එක්සත් රාජධානියෙහි තොග ප්‍රමාණය 1967 ට වඩා උස් මට්ටමක පැවතීම සහ වරණාත්මක මිල දී ගැණුම් යනාදිය වූහ.

II (ඒ) 6 වැනි සංඛ්‍යා සටහනින්, ආරම්භක රටවල් සහ ලැබූ සාමාන්‍ය මිල මට්ටම් අනුව, ලන්ඩන් වෙන්දේසියෙහි විකුණනු ලැබූ තේ ප්‍රමාණයන් දැක්වේ.

1. මෙම විශ්ලේෂණය පදනම් වී ඇත්තේ ලන්ඩන් තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමයෙන් සතිපතා නිකුත් වන තේ වෙළෙඳ වාර්තා සහ ඉන්වෙස්ටර්ස් ගාර්ඩියන්, පබ්ලික් ලෙජර් යනාදිය මතය.

## II (ඒ) 6 වැනි සංඛ්‍යා සටහන

### මුල් රට සහ මිල සාමාන්‍යයන් අනුව ලංඩන් වෙන්දේසිවල දී විකුණන ලද තේ ප්‍රමාණය

| | ලන්ඩන් වෙන්දේසිවල දී විකුණූ ප්‍රමාණයන් (රා. දශ ලක්ෂ) | | | සාමාන්‍ය මිල (රාත්තලකට සි. පැ.) | | |
|---|---|---|---|---|---|---|
| | 1966 | 1967 | 1968 | 1966 | 1967 | 1968 |
| 1. උතුරු ඉන්දියාව ... ... | 141.3 | 113.3 | 131.4 | 4–4.14 | 4–5.71 | 4–0.66 |
| 2. දකුණු ඉන්දියාව ... ... | 20.0 | 12.1 | 15.5 | 3–5.04 | 3–6.48 | 3–6.26 |
| 3. සමස්ථ ලංකා ... ... | 107.1 | 96.2 | 103.9 | 4–2.88 | 4–4.33 | 4–1.30 |
| 4. සමස්ථ අප්‍රිකානු ... ... | 57.5 | 56.0 | 72.9 | 3–6.06 | 3–4.60 | 3–8.12 |
| 5. එකතුව ... ... ... | 337.0 | 284.3 | 328.4 | 4–0.86 | 4–1.81 | 3–11.63 |

මූලය: ලංඩන් තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී ලන්ඩන් වෙන්දේසියේදී විකුණනු ලැබූ සියළුම වර්ගයේ තේවල සාමාන්‍ය මිල රාත්තල, සිලිං 4 පැන්ස 1.30 ක්වූ අතර, ඉකුත් වර්ෂයේ මිලට වඩා රාත්තල පැන්ස 3.03 කින් පහළ වැටුණි. මෙම මිල පහළ වැටීම උඩරට සහ මැද රට තේවලට සීමාවූ අතර, පහත රට තේ මිලෙහි සුළු ඉහළ යාමක් සටහන් විය. 1967 වර්ෂය හා සැසඳීමේදී 1968 දී උඩරට සහ මැද රට තේවල සාමාන්‍ය මිල, පිළිවෙලින් රාත්තල සිලිං 4 පැන්ස 2.61 සහ සිලිං 4 පැන්ස 0.77 ක් වූ අතර, සිලිං 3 පැන්ස 7.72 ක්වූ පහත රට තේ රාත්තලක සාමාන්‍ය මිල රත්තල පැන්ස 0.51 කින් ඉහළ ගියේය. උතුරු ඉන්දියානු තේ සැපයුම පහළ ගිය විටදී මිල කළ හැකිවූ සාමාන්‍යයෙන් දිවයිනෙන් යැවෙන තේ ප්‍රමාණය, වෙළඳ අංශයෙහි පැවති වැඩ වර්ජනයන් හේතු කොට ගෙන අඩුවීම සහ නොයෙකුත් ප්‍රමාදවීම් නිසා තේවල තත්වය හීනවීම යන කරුණු හේතුවෙන් මෙම මධ්‍යස්ථානයේදී මිල කෙරුණු ලැබූ ලාංකික තේවල සාමාන්‍ය මිල පහළ වැටීමට හේතු විය. 1968 දී ලාංකික තේවල සාමාන්‍ය මිල පැන්ස 3.03 කින් අඩු වූ අතර, ඒ සමගම උතුරු සහ දකුණු ඉන්දියානු තේවල සාමාන්‍ය මිලද පහළ වැටුනි. රාත්තල සිලිං 4 පැන්ස 0.55 ක්වූ උතුරු ඉන්දියානු තේවල සාමාන්‍ය මිල 1967 හා සැසඳීමේදී රාත්තල පැන්ස 5.05 ක වඩා තියුණු පහළ වැටීමක් සටහන් කළ අතර, සිලිං 3 පැන්ස 6.26 ක්වූ දකුණු ඉන්දියානු තේවල සාමාන්‍ය මිල රාත්තලකට පැන්ස 0.22 ක පහළ වැටීමක් සනිටුහන් කෙළේය. උතුරු ඉන්දියානු තේ සඳහාවූ ලන්ඩනයේ සාමාන්‍ය වෙළඳ මිල තියුණු ලෙස පහල ගියේ වර්තමාන යුගය තුළදී[1] මෙම මධ්‍යස්ථානයෙහි මිල කෙරුනු දෙවැනි වර්ගයේ තේවල තත්ත්වය පහළ වැටීමේ හේතුවෙනි. අනිකුත් රටවල තේ සම්බන්ධයෙන් සලකා බැලීමේදී මලාවි, මොසැම්බීක්, ආර්ජන්ටිනියා සහ වියට්නාම් තේවල මිල මට්ටම් ඉහළ ගිය අතර කීනියා, උගන්ඩා, ටැන්සේනියා, මුරිසි සහ මලයානු තේ මිල පහළ වැටුනි. නැගෙනහිර අප්‍රිකානු රටවල තේ මිල මට්ටම් පහළ වැටුනේ මෙම මධ්‍යස්ථානයෙහි මිල කෙරුනු තේ වර්ගවල තත්ත්වය හේතු කොට ගෙනය. ඉකුත් වර්ෂයෙහි නිෂ්පාදනය හා සැසඳීමේදී මෙම තේ වර්ග, තත්වය අතින් සාමාන්‍ය සහ බාල වර්ගයේ ඒවා විය.

1968 දී ලන්ඩන් වෙන්දේසියෙහි මිල කරන ලද මුළු තේ ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 328 ක්වූ අතර[2] මෙය 1967 දී මිල කළ ප්‍රමාණයට වඩා රාත්තල් දශලක්ෂ 44 ක හෙවත් සියයට 15 ක වැඩිවීමක් පළ කෙළේය. පරිමාවෙහි ඇතිවූ මෙම ඉහළ යාම තේ නිෂ්පාදනය කරන සියළුම ප්‍රධාන රටවල් අතර බෙදී ගියේය. මේ වර්ෂය තුළ ලන්ඩන් වෙළඳ පොළේදී මිල කෙරුනු උතුරු ඉන්දියානු සහ දකුණු ඉන්දියානු තේ ප්‍රමාණය, පිළිවෙලින් රාත්තල් දශලක්ෂ 131 ක් සහ රාත්තල් දශලක්ෂ 15 ක් වූ අතර, පිළිවෙලින් රාත්තල් දශලක්ෂ 18 කින් සහ රාත්තල් දශලක්ෂ 3 කින් ඉහළ ගියේය ; මේ අතර ලංකාවේ සහ අප්‍රිකානු දේශයන්ගේ තේ ප්‍රමාණය, පිළිවෙලින් ඉකුත් වර්ෂයෙහි මට්ටමට වඩා රාත්තල් දශ ලක්ෂ 8 කින් සහ රාත්තල් දශලක්ෂ 17 කින් වැඩිවී, රාත්තල් දශලක්ෂ 104 සහ රාත්තල් දශලක්ෂ 73 ක් විය.

1. 1968 සැප්තැම්බර් 27 වැනි දින '' ඉන්වෙස්ටර්ස් ගාර්ඩියන්. ''
2. ලන්ඩනයේ තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය මගින් නිකුත්වූ 1969 ජනවාරි 3 වැනි දින නොම්මර 845 දරණ තේ වෙළඳ වාර්තාව.

1968 වර්ෂය මුළුල්ලේ එක්සත් රාජධානියෙහි පැවති තේ තොග ප්‍රමාණය ඉකුත් වර්ෂයේ පැවැති මට්ටමට වඩා වැඩි විය. 1968 වර්ෂයේ මුල් භාගයේදී පැවති සාමාන්‍ය තේ තොග ප්‍රමාණය, ඉකුත් වර්ෂයට වඩා රාත්තල් දශලක්ෂ 8 — 10 කින් පමණ වැඩි වුනි. වර්ෂයේ දෙවන භාගය මුළුල්ලේ පැවති තොග ප්‍රමාණය, කලින් වර්ෂයේ අනුරූප කාලච්ඡේදයේදී පැවැති තොග ප්‍රමාණයට වඩා ඉහල මට්ටමක පැවතින. වර්ෂය අවසානයේදී තොග ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 196ක්[1] හෙවත් 1967 වර්ෂය අවසානයෙහි පැවතියාට වඩා රාත්තල් දශලක්ෂ 61 කින් වැඩිවිය.

ලෝක තේ නිෂ්පාදනය පිළිබඳ ඇති සංඛ්‍යා තොරතුරු අනුව 1968 තේ නිෂ්පානය, රාත්තල් දශලක්ෂ 1,610[2] ක්වු අතර, 1967 නිෂ්පාදිත තේ ප්‍රමාණයට වඩා රාත්තල් දශලක්ෂ 63 කින් වැඩි විය. මෙය, 1967 වර්ෂයේ රාත්තල් දශලක්ෂ 7 ක වැඩිවීමත් සමග සැසැඳේ. තේ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් අතුරින් පකිස්ථානයෙහි පමණක් නිෂ්පාදනයේ බැසීමක් සටහන් වූ අතර, අනිකුත් ප්‍රමාණ තේ නිෂ්පාදක රටවල නිෂ්පාදනය ඉහළ ගියේය.

## රබර්

1968 දී රබර් නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 328 ක් වූ අතර, 1967 දී නිෂ්ාදනය වූ රබර් ප්‍රමාණයට වඩා රාත්තල් දශ ලක්ෂ 12 ක් වැඩියෙන් නිෂ්පාදනය වීමට හේතු වූයේ, නැවත වගා කළ ඉඩම් ඵල දැරීමෙන් ඒවායින් වැඩි ඵලදාවක් ලබා ගැනීමට හැකිවීමයි. කෙසේ වුවද, 1968 ජනවාරි මස සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ දී වූ මුළු නිෂ්පාදනය, ඉකුත් වර්ෂයේ එම කාලඡේදය හා සැසැඳීමේ දී දශ ලක්ෂ 3.4 කින් අඩු වීය.[3] මෙලෙසින් නිෂ්පාදනය අඩුවීමට හේතු වී ඇත්තේ, වර්ෂයේ වැඩි කාලයක් තුළ දී තද වර්ෂාව පැවතීම හා ඒ හේතුවෙන් කිරි කැපීමේ කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවීමය. ෂීට් රබර් සහ ක්‍රෙප් රබර් නිෂ්පාදනය, පිළිවෙළින් රාත්තල් දශ ලක්ෂ 7.4 කින් හා රාත්තල් දශ ලක්ෂ 4.8 කින් වැඩි වී ගියේය. 1967 දේශීය රබර් පරිභෝජනය රාත්තල් දශ ලක්ෂ 1.9 කින් වැඩි වූ අතර, 1968 වර්ෂයේ දී එය තවදුරටත් රාත්තල් දශ ලක්ෂ 1.3කින්, රාත්තල් දශ ලක්ෂ 7.2 දක්වා වැඩි වීය. 1967 දී නිර්යාත කළ රබර් පරිමාව රාත්තල් දශ ලක්ෂ 7 කින් හෙවත් සියයට 2 කින් පහළ වැටුනු අතර, 1968 දී රාත්තල් දශ ලක්ෂ 37 කින් හෙවත් සියයට 13 කින් රාත්තල් දශ ලක්ෂ 328 දක්වා තියුණු ලෙස ඉහල ගියේ ය.[4] ෂීට් රබර්, ක්‍රෙප් රබර් ( සෑම වර්ගයේ ම ) සහ රබර් කිරි අපනයන කළ ප්‍රමාණය, පිළිවෙළින්, රාත්තල් දශ ලක්ෂ 26.4 කින් ( හෝ සියයට 16.2 ක් ), රාත්තල් දශ ලක්ෂ 10.4 කින් ( හෝ සියයට 8.2 ) සහ රාත්තල් දශ ලක්ෂ 0.5 කින් වැඩි වී ගියේය.

රේගු වාර්තා අනුව ලංකාවේ හොඳම රබර් ගැනුම්කරුවා නැවත වරක් මහජන චීන සමූහාණ්ඩුව වූ අතර, 1967 දී මිල දී ගත් රබර් රාත්තල් දශ ලක්ෂ 131 ක ( මුළු රබර් අපනයනයන්ගෙන් සියයට 45 ක් ) හා සසඳන කල, 1968 දී රාත්තල් දශ ලක්ෂ 183 ක ( මුළු රබර් අපනයනයන් ගෙන් සියයට 56 ක් ) රබර් ප්‍රමාණයක් මිල දී ගෙන ඇත. 1967 සහ 1968 යන වර්ෂයන් දෙකෙහි දී ම රාත්තල් දශ ලක්ෂ 23 ක් මිල දී ගැනීමෙන් ඇමෙරිකා එක්සත් ජනපදය දෙ වැනි ස්ථානය ගෙන ඇත. ජර්මන්පෙඩරල් සමූහාණ්ඩුව, ඉකුත් වර්ෂයේ දී මිල දී ගත් රාත්තල් දශ ලක්ෂ 17 හා සසඳන කල රාත්තල් දශ ලක්ෂ 20 ක ප්‍රමාණයක් මිල දී ගැනීමෙන් තුන් වන ස්ථානය ගත්තේ ය. කලින් වර්ෂයේ දී රාත්තල් දශ ලක්ෂ 27 ක් ද, මෙම වර්ෂයේ දී රාත්තල් දශ ලක්ෂ 18 ක් ද මිල දී ගැනීමෙන්, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය සිව් වැනි ස්ථානයට පත් වීය. ජපානය සහ රුමේනියාව 1967 දී පිළිවෙළින් රාත්තල් දශ ලක්ෂ 11 ක් හා දශ ලක්ෂ 18 ක් ලබා ගෙන ඇති අතර, 1968 දී පිළිවෙළින් රාත්තල් දශ ලක්ෂ 11 ක් හා රාත්තල් දශ ලක්ෂ 10 ක් මිල දී ගත්තෝය.

1967 දෙසැම්බරයේ දී, කොළඹ වෙළෙඳ පොලෙහි නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක සාමාන්‍ය මිල ශත 0.86 ක් දක්වා ඉහළ ගිය අතර, 1968 ජනවාරි සහ පෙබරවාරි මාසවල දී, පිළිවෙළින් රාත්තල ශත 0.81 සහ ශත 0.77 දක්වා පහළ වැටිණ. මින් අනතුරුව,

---

1. ලන්ඩනයේ තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය මගින් 1969 ජනවාරි 3 වැනිද නිකුත්වූ නොම්මර 845 දරණ තේ වෙළඳ වාර්තාව.
2. සීමාසහිත ජෝන් කීල්, තොම්සන්, වයිට් සහ සමාගම මගින් 1969 මාර්තු 9 වැනිද නිකුත්වූ සතිපතා තේ වෙළඳ වාර්තාව.
3. 1968 නොවැම්බර් මාසයේ රබර් නිෂ්පාදනය, ඉකුත් වර්ෂයේ එම කාලඡේදයට වඩා රාත්තල් දශලක්ෂ 16.7 කින් වැඩිවූ අතර, ඉකුත් මාසයට වඩා රාත්තල් දශ ලක්ෂ 13.5 කින් වැඩිවිය. මෙලෙස නිෂ්පාදනයෙහි වූ වැඩිවීමෙන්, ඔක්තෝබර් අවසානය තෙක් වූ අඩුවීම මඟ හැරී ගියේය.
4. 1968 අපනයන කළ රාත්තල් දශ ලක්ෂ 328 ක රබර් ප්‍රමාණය පදනම් වී ඇත්තේ අපනයන සඳහා සම්මත වූ සටහන් මතය. රේගු වාර්තාව පැහැදිලි කිරීමේ අධෝලිපියක් මගින් 1968 ජනවාරි සිට දෙසැම්බරය දක්වා කාලයේදී නැව් ගතකළ නියම ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 314 ක් බව සඳහන් කරයි.

අගෝස්තු මාසයේ රාත්තල ශතයකින් පහළ වැටීම හැරුණු කල, වෙළෙඳ මිල මට්ටම ඉහළ යෑමේ උපනතියක් අනුගමනය කළේය. 1968 දී ආර්. එස්. එස්. වර්ගයේ වාර්ෂික සාමාන්‍ය මිල 1967 වාර්ෂික සාමාන්‍ය මිල හා සසඳන කල්හි, රාත්තල ශත 9 කින් හෙවත් සියයට 11 කින්, ශත 0.88 දක්වා වැඩි විය. ලේටෙක්ස් ක්‍රෙප් රබර් අංක.1X, ආර්. එස්. එස්. නො. 1 වර්ගයේ මිල වෙනස් වීමේ රටාවම අනුගමනය කළේය. 1967 වර්ෂය හා සසඳන කල, 1968 දී ලේටෙක්ස් ක්‍රෙප් රබර් අංක 9යේ වාර්ෂික සාමාන්‍ය මිල 0.23 කින් හෙවත් සියයට 26 කින් රාත්තල රු. 1.11 ක් දක්වා වැඩි විය.

II (ඒ) 7 වැනි සංඛ්‍යා සටහනින් මෑත වර්ෂයන්හි රබර් නිෂ්පාදනය, අපනයන සහ මිල දැක්වේ.

### II (ඒ) 7 වැනි සංඛ්‍යා සටහන

**රබර් : නිෂ්පාදනය අපනයන සහ මිල**

| වර්ෂය | නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ | අපනයන රාත්තල් දශ ලක්ෂ | රාත්තලක නැ.වි.ස. මිල රු. ශත. | ආර්. එස්. එස්. නො. 1 ෂීට් රබර් රාත්තලක කොළඹ වෙළෙඳ පොලේ මිල රු. ශත |
|---|---|---|---|---|
| 1963 | 231 | 209 | 1.23 | 0.93 |
| 1964 | 246 | 253 | 1.15 | 0.90 |
| 1965 | 261 | 267 | 1.14 | 0.91 |
| 1966 | 289 | 298 | 1.13 | 0.89 |
| 1967 | 316 | 291 | 0.97 | 0.79 |
| 1968 | 328 | 328 | 1.01 | 0.88 |

මූලය : රබර් පාලක තැනගේ පරිපාලන වාර්තා — ලංකා රේගු වාර්තා
කොළඹ රබර් වෙළෙඳුන්ගේ සංගමය.

ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයන් හි සවාභාවික රබර් මිල ස්ථිර ලෙස ඉහළ ගිය නමුදු, සමාලෝචනයට භාජන වන වර්ෂයෙහි මුල් දෙමස තුළ දී 1967 දෙසැම්බරයෙහි පැවති මට්ටමට වඩා අඩු විය. වර්ෂයේ දෙ වැනි මාසයේ දී ලෝක රබර් වෙළෙඳ පොලෙහි ස්වාභාවික රබර් මිල පහළ වැටිණ. ඇස්තමේන්තු කරන ලද නිෂ්පාදන ප්‍රමාණයෙහි අධිකකමත්, පෙරදිග රටවල තොග ප්‍රමාණයන්හි වැඩි කමත්, මිල දී ගැනීමේ උද්යෝගය අඩුවී යෑමත්, යන කරුණු පෙබරවාරි මාසයේ මුල් සතියේ දී සිංගප්පූරු මිල, 1949 න් පසු අඩුම මට්ටමකට ( එනම්, ඩොලර් ශත 43 දක්වා ) පත්වීමට හේතු විය. පසු කාලච්ඡේදයේ දී මිල ඉහළ යාම ඇත පෙරදිග දේශපාලන තත්වයෙහි ප්‍රතිඵලයක් විය. ප්‍රධාන මුදල් වෙළෙඳ පොළවල වැඩ කටයුතු මගින් වූ අනිස්ථිර තාවයක් හේතු කොට තවදුරටත් මිල ඉහළ ගියේ ය. ලංඩන් වෙළෙඳ පොලෙහි ෂීට් රබර් ආර්. එස්. එස්. නො. 1 හි වාර්ෂික සාමාන්‍ය එතැන් මිල රාත්තල පැ.1 15/32 කින් රාත්තල සිලිං 1 පැන්ස 6 25/32 දක්වා වැඩි විය. ෂීට් රබර් රාත්තලක නැ. වි. ස. මිල වූ සිංගප්පූරු ශත 53.12, 1967 වාර්ෂික සාමාන්‍යයට වඩා රාත්තලකට ශත 0.96 ක පහළ වැටීමක් සටහන් කෙළේය. සියුම් ලෝක දේශපාලන තත්වයත් සමග ප්‍රධාන පාරිභෝජනය කරන රටවල ඉල්ලුමේ වැඩිවීම, මිල ඉහළ යෑමේ උපනතිය කෙරෙහි බල පෑ සාධකයන් වූහ.

නිෂ්පාදනයෙහි වැඩිවීමක් සිදු වුවද, පාරිභෝජනය ද වැඩි වූ [1] අතර, තොග සාමාන්‍ය වශයෙන් අඩු විය. ලබා ගත හැකි අන්තිම සංඛ්‍යා තොරතුරු අනුව, 1968 ජනවාරි — ඔක්තෝබර් තුළ දී ඇමෙරිකා එක්සත් ජනපදයේ රැස්කොට තිබූ තොග මුදා හැරීම් ඇතුළුව, ලෝක සවාභාවික රබර් සැපයුම ටොන්, 21,72,500, ක් වූ අතර, 1967 එම කාලච්ඡේදයේ දී ටොන් 21,07,500 ක් විය. 1968 ජනවාරි—ඔක්තෝබර් කාලච්ඡේදය තුළ දී පාරිභෝජනය වූ සවාභාවික රබර් ප්‍රමාණය ටොන් 22,67,500 ක් වූ අතර 1967 එම කාලච්ඡේදය තුළ දී ටොන් 20,57,500 ක් පාරිභෝජනය විය. 1967 දෙසැම්බර් මාසයේ දී රැස් කොට තිබූ තොගය ටොන් 9,80,000 හා සසඳන විට ඔක්තෝබර් මාසය අවසානයේ දී පැවති තොගය ටොන්, 9,37,500 විය. ලෝක කෘත්‍රිම රබර් නිෂ්පාදනය 1967 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා ටොන් 27,85,000 ක් වූ අතර,

1. රබර් සංඛ්‍යා විවරණිකාව, 1969 ජනවාරි.

1968 එම කාලච්ඡේදයේ දී ටොන් 32,45,000 වූහ. මේ අතර, කෘත්‍රිම රබර් පාරිභෝජනය 1967 ජනවාරි — ඔක්තෝබර් කාලච්ඡේදයේ දී ටොන්, 27,50,000 ක් වූ අතර, 1968 එම කාල ඡේදයේ දී ටොන් 32,12,000 ක් වෙතැයි ගණන් බලා තිබේ.

**පොල් නිෂ්පාදිත**

ලෝක වෙළෙඳ පොලෙහි 1967 වර්ෂයෙහි සැප්තැම්බර් මාසයේ අවසානයේ දී සිට වැඩි වීමට පටන් ගත් කොප්පරාවලින් සකසන ලෝරික් තෙල් මිල, 1968 මුල් භාගයේ දී ද ඉහළ මට්ටමක පැවතිණ. මිල ඉහළ යැමට හේතු වූයේ යුරෝපීය රටවලින් ඉල්ලුම වැඩිවීම, පිලිපීනයෙහි කොප්පරා නිෂ්පාදනය අඩුවීම[1] සහ නයිජීරියාවෙහි දේශපාලන නොසන්සුන් තාවයන් කරණකොට ගෙන තාලවර්ගයේ ගෙඩි මද සහ තාල වර්ගයේ ගස්වලින් ලබා ගන්නා තෙල්, නැව් ගතකිරීම අඩුවීම වෙයි.

වරින් වර ඇති වූ පහත වැටීම් අත් හැරි කල්හි 1968 මැයි දක්වා කොප්පරා වෙළෙඳ පොලෙහි පැවතියේ නොවෙනස් වන උපනතියකි. මෙය මෙසේ පැවතියේ පිලිපීනයේ සැපයුම් අඩුවීම නිසා එක්සත් ජනපදය විසින් වෙළෙඳ පොළ කෙරෙහි දක් වූ අනුග්‍රහය නිසා ය.[2] මැයි මාසයේ අවසානය වන විට පිලිපීනයේ සැපයුම් තත්වය යහපත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිල පහළ වැටිණි. ජූලි මාසයේ දී මිල පහත වැටීම යුරෝපා වෙළෙඳ පොලෙහි ඇති වූ හිභයක් නිසා තාවකාලික වශයෙන් වැලකුණි. නිෂ්පාදන හැකියාවන් යහපත් වීමත් සමග, මිල නොනැවතී ම පහළ වැටුණු අතර, ඔක්තෝබර් මාසයේ දී අවම වී පහත්ම මට්ටමට වැටිණි. එහෙත්, 1967 ලබා ගත් මිලට වඩා මෙම මිල සතුටුදයක තරමින් වැඩි වී තිබුණි. එසේ නමුදු, පිලිපීනයේ සුළි සුළඟින් ඇති වූ විනාශය නිසා නොවැම්බර් සහ දෙසැම්බර් යන මාස වල දී මිලෙහි යහපත් බවක් දක්නට ලැබිණි. පොල් තෙල් මිල ද, කොප්පරා මිල රටාව ම අනුගමනය කළේ ය.

1968 මුල් භාගයේ දී ලෝක වෙළෙඳ පොලෙහි පොල් නිෂ්පාදිතයන් ගේ මිල කොළඹ වෙළෙඳ පොලෙහි ද විද්‍යාමාන වුවද, දෙ වැනි භාගයේ දී මෙම රටාව වෙනස් විය. 1968 මුල් මාස හතර තුළ දී සාමාන්‍ය වශයෙන් මිල ඉහළ ගියේ ය. මැයි සහ ජූනි මාසවල දී මිල පහත වැටුණ නමුත්, ජූලි සහ අගෝස්තු මාසවල දී නැවතත් පෙර තත්වයට ම පත් විය. මින් අනතුරුව සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසයන්හි දී මිල පහත වැටුණ මුත්, වර්ෂයේ අවසාන මාස දෙක තුළ දී මිල යහපත් විය. එහෙත් සැප්තැම්බරයේ දී පටන් ගැණුනු කපාපු පොල් මිල පහත වැටීම දෙසැම්බරය තෙක් එලෙසින් ම පැවැතියේ ය. මෙයට හේතු වූයේ පිලිපීනයේ කපාපු පොල් නිමැවුමේ ඇති වූ ඌනතාවය හේතු කොට ගෙන මෙම කාණ්ඩයේ සීඝ්‍ර මිල ඉහළ යාමක් ඇති වීමය. කොළඹ වෙළෙඳ පොළෙහි වතු කොප්පරා නොම්මර 1 කේ පාරමක 1968 වසර සඳහා වූ වාර්ෂික මිල සාමාන්‍ය රුපියල් 256/ ක් වූයෙන් පාරමක් රු. 57.93 කින් හෝ සියයට 29 කින් වැඩි වී ඇති බැව් වාර්තා විය. මේ අතර, පොල් තෙල් ටොන් එකක් රු. 1,513.03 ක් ද කපාපු පොල් රාත්තලක් රු. 0.79 ක් ද වූ අතර, 1967 වාර්ෂික මිල සාමාන්‍යය ඉක්මවාලමින් පිළිවෙලින් ටොන් එකක් සියයට 31 කින් සහ සියයට 61 කින් වැඩිවිණි.

1968 දී ප්‍රධාන පොල් නිෂ්පාදිතයන් ගේ මුළු අපනයන පරිමාව ( මහ බැංකු වෙළෙඳ දර්ශකයන්ට අනුව බලන කල ) 1967 තේ මට්ටම ඉක්මවා සියයට 17 කින් වැඩි වී තිබේ. මෙය 1967 දී වාර්තාගත වූ සියයට 8 ටේ පහත වැටීම හා ගත් කල එයට ප්‍රතිවිරුද්ධ සිදුවීමකි. ආනයන ඉපැයීම් උසස් මට්ටමකින් තිබීමට හේතු වූයේ පොල් අපනයන පරිමාව පුළුල් වීමත්, ජාත්‍යන්තර වෙළෙඳ පොලවල මිල ඉහල මට්ටමකින් පැවතීමත් ය. 1967 හා සසඳන කල කොප්පරා හා කපාපු පොල්වල අපනයන පරිමාවන්හි වැඩිවීම දක්නට ලැබුණ අතර, පොල් තෙල් සම්බන්ධයෙන් වාර්තාගත වූයේ අඩුවීමෙකි. කොප්පරා අපනයන පරිමාව හොණ්ඩර 425 දහසක් සහ කපාපු පොල් හොන්ඩර 1382 දහසක්ව පැවැති අතර, පිළිවෙලින් හොණ්ඩර 109 දහසකින් හෙවත් සියයට 34 කින් සහ හොන්ඩර 456 දහසකින් හෙවත් සියයට 49 කින් වැඩි වී තිබිණ. මේ අතර, 1967 අනුව බලන කල පොල් තෙල් ආනයන පරිමාව හොණ්ඩර 1,261 දහසක්ව පැවැති අතර, හොණ්ඩර 73 දහසක් හෙවත් සියයට 5 ක අඩුවීමක් දක්විය. පොල් තෙල් අපනයන පරිමාවේ සංකෝචනයට හේතුව වශයෙන් කපාපු පොල් මිල සීඝ්‍රව ඉහල යැම නිසා පොල් තෙල් වෙනුවට කපාපු පොල් නිෂ්පාදනය කිරීමට නැඹුරු වීම දක්විය හැකිය.

---

1. පිලිපීනයෙන් අපනයනය කළ කොප්පරා පරිමාව, 1968 දී ටොන් 6,53,825 ක් වූ අතර, 1967 පරිමාවට වඩා එය ටොන් 99,748 කින් හෙවත් සියයට 13 කින් පහත වැටී ඇති බව වාර්තා වී තිබේ.
2. පබ්ලික් ලෙජර්, — 1968 දෙසැම්බර් 28 — පිටුව 11.

1968 දී නිෂ්පාදිත තුනෙහි ම වාර්ෂික සාමාන්‍ය නැ. වි. ස. මිල 1967 දීට වඩා වැඩි වී ඇත. කොප්පරා, කපාපු පොල්, පොල් තෙල් සහ කපාපු පොල්වල වාර්ෂික සාමාන්‍ය නැ. වි. ස. මිල පිළිවෙලින් පාරම රුපියල් 3.96, ටොන් එක රුපියල් 2,109, සහ රාත්තල රු. 1.06 යනාදී වශයෙන් පැවති අතර, එය පිළිවෙලින් පාරම රු. 103/– කින් හෙවත් සියයට 35 කින්, ටොන් එක රු. 795 කින් හෙවත් සියයට 60 කින් සහ රාත්තල ශත 47 කින් හෙවත් සියයට 80 කින් පිළිවෙලින් 1967 දී පැවැති මට්ටම ඉක්මවාලිය.

II (ඒ) 8 සංඛ්‍යා සටහනෙහි ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි ම අපනයන පරිමාව, සහ අපනයන මිල දැක්වේ.

## II (ඒ) 8 වැනි සංඛ්‍යා සටහන

### ප්‍රධාන පොල් නිෂ්පාදිත – අපනයන, පරිමාව සහ මිල 1964 – 68

| වර්ෂය | ප්‍රමාණය | | | නැ. වි. ස. මිල | | | |
|---|---|---|---|---|---|---|---|
| | පොල් තෙල් හොණ්ඩර දහස් ගණනින් | කොප්පරා හොණ්ඩර දහස් ගණනින් | කාපාපු පොල් හොණ්ඩර දහස් ගණනින් | එකතුව (නිෂ්පාදනය සඳහා වැය වූ පොල් ගෙඩි ප්‍රමාණය) ගෙඩි දශ ලක්ෂ | පොල් තෙල් ටොන් එකක මිල රු. ශත | කොප්පරා පාරමක මිල රු. ශත. | කපාපු පොල් රාත්තලක මිල රු. ශත. |
| 1964 | 2,351 | 1,162 | 1,080 | 1,618 | 1,308.40 | 237.20 | 0.53 |
| 1965 | 1,738 | 819 | 1,041 | 1,270 | 1,661.80 | 296.30 | 0.71 |
| 1966 | 1,457 | 417 | 930 | 1,017 | 1,489.00 | 294.60 | 0.60 |
| 1967 | 1,334 | 316 | 926 | 940 | 1,314.00 | 293.07 | 0.59 |
| 1968 | 1,261 | 425 | 1,382 | 1,096 | 2,108.80 | 396.25 | 1.06 |

මූලය: ලංකා රේගු වාර්තා.

**කොප්පරා**

ඉන්දියාව කොප්පරා සඳහා එකම විශාලතම වෙළෙඳ පොල වෙමින් තවදුරටත් පැවති අතර, හොණ්ඩර 239 දහසක් හෙවත් අපනයන කළ මුළු පරිමාවෙන් සියයට 56 ක් මිල දී ගත්තාය. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය සහ පකිස්ථානය මිළහට ඉතා වැදගත් ගැනුම්කරුවන් වූ අතර, පිළිවෙලින් මෙම රටවල්වලට අපනයනය කළ ප්‍රමාණය මුළු අපනයන ප්‍රමාණයෙන් හොණ්ඩර 102 දහසක් හෙවත් මුළු අපනයන ප්‍රමාණයෙන් සියයට 24 ක් සහ හොණ්ඩර 74 දහසක් හෙවත් මුළු අපනයන කළ ප්‍රමාණයෙන් සියයට 17ක් මිලදී ගත් එම රටවල් දෙක ඊළඟ වැදගත් ගැණුම් කරුවන් වූහ.

**පොල් තෙල්**

සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය 1968 වර්ෂයේ දී පොල් තෙල් හොණ්ඩර 406 දහසක් හෙවත් අපනයන කළ මුළු ප්‍රමාණයෙන් සියයට 32ක් අපනයනය කරමින්, මෙම භාණ්ඩ යෙහි විශාලතම ගැනුම්කරු බවට පත් විය. පකිස්ථානය, ඉතාලිය සහ මහජන චීන සමූහාණ්ඩුව යන රටවල් ලංකාවේ මුළු පොල් තෙල් පරිමාවෙන් පිළිවෙලින් හොණ්ඩර 174 දහසක් හෙවත් සියයට 14 ක්, හොණ්ඩර 161 දහසක් හෝ සියයට 13 ක් සහ හොණ්ඩර 150 දහසක් හෙවත් සියයට 12 ක් ද ලබා ගනිමින් 1968 වර්ෂයේ දී මිළහට ඉතා වැදගත් ගැනුම්කරුවෝ වූහ.

**කපාපුපොල්**

මුළු අපනයන ප්‍රමාණයෙන් හොණ්ඩර 358 දහසක් හෙවත් සියයට 26 ක් ලබා ගනිමින් තවදුරටත් එක්සත් රාජධානිය,කපාපු පොල් සඳහා ප්‍රධානතම වෙළෙඳ පොළ බවට පත් වූවාය. ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව, කැනඩාව සහ නෙදර්ලන්තය මුළු කපාපු පොල් අපනයන පරිමාවෙන්, පිළිවෙලින් හොණ්ඩර 182 දහසක් හෙවත් මුළු කපාපු පොල් අපනයන පරිමාවෙන් සියයට 13 ක්, හොණ්ඩර 116 දහසක් හෙවත් සියයට 8 ක්, සහ හොණ්ඩර 86 දහසක් හෙවත් සියයට 6 ක් ද ලබා ගනිමින් මීලඟ විශාලතම ගැනුම්කරුවෝ වූහ. කෙසේ වුවද, 1967 දී මෙම භාණ්ඩයේ මුළු අපනයන එකතුවෙන් කැනඩාව සතුවූ කොටස හොණ්ඩර 18 දහස හෙවත් සියයට 2 ක් පමණි. ඉකුත් වර්ෂයේ දී කපාපු පොල් ආනයනය නොකළ ඇමෙරිකා එක්සත් ජනපදය 1968 වර්ෂයේ දී ලංකාවෙන් කපාපු පොල් හොණ්ඩර 13 දහසක් මිල දී ගත්තා ය.

## II (ඒ) 9 වැනි සංඛ්‍යා සටහන
## තෝරාගත් සුළු අපනයන නිෂ්පාදිතයන්ගේ අපනයන පරිමාවන්, වටිනාකම සහ සාමාන්‍ය නැ. වි. ස. මිල

| | ප්‍රමාණයෙහි ඒකකය | පරිමාව | | | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | සාමාන්‍ය නැ. වි. ස. මිල (ඒකකයක මිල) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1967 | 1968 | 1967 ට වඩා 1968 හි වෙනස % | 1967 | 1968 | 1967 ට වඩා 1968 හි වෙනස % | 1967 | 1968 | 1967 ට වඩා 1968 හි වෙනස % |
| **පොල් නිෂ්පාදිත ගණය** | | | | | | | | | | |
| කොහු — කෙඳි ... ... ... ... | හොන්ඩර දහස් | 538.0 | 563.9 | + 4.8 | 22.0 | 25.6 | + 16.4 | 40.94 | 43.35 | + 10.8 |
| කොහු — මෙට්ට ... ... ... | ,, | 1065.0 | 1260.3 | + 18.3 | 19.4 | 25.5 | + 31.4 | 18.24 | 20.23 | + 10.9 |
| පොල්කටු අඟුරු ... ... ... ... | ,, | 273.0 | 319.1 | + 16.9 | 4.9 | 5.2 | + 6.1 | 18.02 | 16.34 | — 9.3 |
| අමු පොල් ... ... ... ... | ගෙඩි දහස් | 10.2 | 7.6 | — 25.5 | 3.1 | 3.3 | + 6.5 | 0.30 | 0.44 | + 46.7 |
| **කුළු බඩු ගණය** | | | | | | | | | | |
| කුරුඳු කූරු ... ... ... ... | හොන්ඩර දහස් | 52.8 | 61.8 | + 17.0 | 29.8 | 32.9 | + 10.4 | 564.71 | 531.79 | — 5.8 |
| කුරුඳු පොතු ... ... ... ... | ,, | 7.9 | 16.6 | +110.1 | 1.2 | 2.3 | + 91.7 | 153.27 | 141.30 | — 7.8 |
| ගම්මිරිස් ... ... ... ... | ,, | 2.0 | 16.2 | +710.0 | 0.4 | 2.4 | +500.0 | 215.21 | 146.53 | — 31.9 |
| කරදමුංගු ... ... ... ... | ,, | 2.4 | 2.5 | + 4.2 | 3.3 | 4.1 | + 24.2 | 1,341.65 | 1639.22 | + 22.2 |
| **ඛනිජ ගණය** | | | | | | | | | | |
| මිනිරන් ... ... ... ... | ,, | 204.1 | 212.6 | + 4.2 | 6.7 | 7.8 | + 16.4 | 32.83 | 36.91 | + 12.4 |
| ඉල්මනයිට් ... ... ... ... | ,, | 1764.4 | 1455.0 | — 17.5 | 1.5 | 2.6 | + 73.3 | 0.86 | 1.78 | +107.0 |
| **අනිකුත් කෘෂිකාර්මික නිෂ්පාදිතයන්** | | | | | | | | | | |
| කොකෝවා ඇට ... ... ... ... | ,, | 23.2 | 34.8 | + 50.0 | 4.1 | 7.3 | + 78.0 | 178.36 | 211.16 | + 18.4 |
| සකස් කළ දුම්කොළ ... ... ... | රාත්. දශ ලක්ෂ | 0.9 | 1.3 | + 44.4 | 2.8 | 5.1 | + 82.1 | 3.00 | 3.81 | + 27.0 |
| පැඟිරි තෙල් ... ... ... ... | රාත්. දහස් | 337.7 | 297.8 | — 11.8 | 0.8 | 1.2 | + 50.0 | 2.44 | 3.99 | + 63.5 |
| **මේද අම්ල ගණය** | | | | | | | | | | |
| ගිලිසරොල් ... ... ... ... | හොන්ඩර දහස් | 21.8 | 24.8 | + 13.8 | 2.0 | 1.9 | — 5.0 | 89.65 | 78.61 | — 12.3 |
| ගිලිසරින් ... ... ... ... | ,, | — | 21.0 | — | — | 2.0 | — | — | 93.16 | — |
| **නිෂ්පාදිත භාණ්ඩ** | | | | | | | | | | |
| පදම් කළ හම් ... ... ... ... | ,, | 7.7 | 10.1 | + 31.2 | 1.6 | 1.8 | + 12.5 | 202.65 | 180.02 | — 11.2 |
| එළු හම් ... ... ... ... | ,, | 2.5 | 3.3 | + 32.0 | 0.9 | 1.1 | + 22.2 | 344.52 | 338 23 | — 1.8 |
| වටිනා සහ වටිනාකමින් අඩු මැණික් ගල් ... | කැරට් දහස් | 24.9 | 196.0 | +687.1 | 3.4 | 2.0 | — 14.2 | — | — | — |
| ස්වර්ණාභරණ සහ රන්කරුවන් ගේ භාණ්ඩ ... | ,, | — | — | — | 2.3 | 1.2 | — 47.8 | — | — | — |
| රෙදිවලින් නිම වූ ඇඳුම් ... ... ... | දුසිම් දහස් | 3.7 | 32.3 | +773.0 | ... | 4.2 | — | — | — | — |
| ඉහත සඳහන් වන ශීර්ෂයන්ගේ මුළු වටිනාකම | | | | | 110.2 | 139.5 | + 26.6 | | | |
| සියළු ම සුළු අපනයන නිෂ්පාදිතයන්ගේ මුළු වටිනාකම ... ... ... | | | | | 121.2 | 152.2 | + 26.3 | | | |
| ඇතුළත් වූ ශීර්ෂයන්ගේ ප්‍රතිශතය ... ... | | | | | 90.9 | 91.7 | | | | |

වි. වි. හි ස. සඳහා හිමිකම් නොමැත.

මූලය: ලංකා රේගු වාර්තා

## වෙනත් දේශීය අපනයනයන්

1967 වර්ෂය හා සසඳන විට මුළු අපනයන නිෂ්පාදිතයන් ගෙන් 1968 වර්ෂයේ දී ලබාගත් මුළු අපනයන ඉපැයුම රුපියල් දශ ලක්ෂ 31.0 කින් හෙවත් සියයට 25.6 කින් වැඩි වුයේය. මෙය ( ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයන්ට අනුව ) අපනයන පරිමාව සියයට 17 කින් ප්‍රසාරණය වී යෑම සහ සාමාන්‍ය අපනයන මිල සියයට 11 කින් ඉහළ යෑම යන කරුණු දෙක නිසා සිදු වීය. වෙනත් දේශීය අපනයනයන්හි ඉපැයුම් ඉහළ යෑමට දිරි ගැන්වීමට බොහෝ දුරට හේතු වූයේ 1968 මැයි මාසයේ දී ආරම්භ කළ විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමය. මෙම ක්‍රමය යටතේ සුළු අපනයන භාණ්ඩ අපනයන කිරීමෙන් ඉපැයූ විදේශ විනිමය ප්‍රමාණයෙන් සියයට 44 ක ප්‍රසාද දීමනාවක් රුපියල්වලින් ලැබීමට සුදුසුකම් ලැබේ. II (ඒ) 9 වැනි සංඛ්‍යා සටහනින් තෝරා ගත් සුළු අපනයන භාණ්ඩයන් ගේ අපනයන පරිමාවන්, අපනයන වටිනාකම් සහ සාමාන්‍ය නැ. වි. ස. මිල දැක්වේ.

ඉහත දැක්වෙන සංඛ්‍යා සටහනට, 1967 සහ 1968 වර්ෂයන් සඳහා සටහන් වී ඇති අනෙකුත් දේශීය අපනයනවල මුළු වටිනාකමින් දළ වශයෙන් සියයට 92 ක් අයත් වෙයි. පොල් නිෂ්පාදිත ගණයෙහි දැක්වෙන රුපියල් දශ ලක්ෂ 51 ක් වූ පොල් කොහු කෙඳිවල අපනයන වටිනාකම, සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 10 කින් හෙවත් සියයට 24 කින් වැඩි වූ අතර, මෙය අපනයන පරිමාව සියයට 14 කින් වැඩිවීම හා සාමාන්‍ය නැ. වි. ස. මිල සියයට 8 කින් ඉහළ යාම යන කරුණු දෙකෙහි ප්‍රතිඵලය විය. පීරන ලද සහ ගුදිරි කෙඳිවල අපනයන ඉපැයුම 1968 දී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 26 ක් සහ 25 ක් වන අතර, 1967 වර්ෂයේදී ඉපැයුම්වලට වඩා පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 4 කින් සහ රුපියල් දශ ලක්ෂ 6 කින් වැඩිවීමක් වාර්තාගත වී ඇත. අපනයනය කරන ලද පීරපු කෙඳි සහ ගුදිරි කෙඳි ප්‍රමාණය පිළිවෙලින් හොණ්ඩර 564 දහසක් සහ හොණ්ඩර 1260 දහසක් වූ අතර, මෙය පිළිවෙලින් හොණ්ඩර 26 දහසක් හෙවත් සියයට 5 කින් සහ හොණ්ඩර 195 දහසක් හෙවත් සියයට 18 ක් වැඩිවී ඇතැයි වාර්තාගත වී තිබේ. පොල් කටු අඟුරුවල ආන්තික අපනයන ඉපැයුම්වල වැඩිවීම සම්පූර්ණයෙන්ම වාගේ අපනයන කළ පරිමාවෙහි සියයට 17 ක ප්‍රසාරණයක් නිසා වන අතර, ඉකුත් වර්ෂය හා සසඳන කල අපනයන මිල සියයට 9 කින් පහළ වැටී ඇත.

කුළුබඩු ගණයෙහි දැක්වෙන, කුරුඳුවල ( කුරුඳු කූරු සහ කුරුඳු කැබෙලි ) අපනයනය වටිනාකම රුපි. දශ ලක්ෂ 35 ක් පෙන්නුම් කරන අතර, මෙය රුපියල් දශ ලක්ෂ 4 කින් හෙවත් සියයට 13 කින් වැඩිවීමකි. අපනයන ලැබීම් වැඩිවීම සම්පූර්ණයෙන්ම වාගේ අපනයන පරිමාවෙහි සියයට 29 ක සීඝ්‍ර ඉහළ යෑමක ප්‍රතිඵලයක් වන අතර, සාමාන්‍ය නැ. වි. ස. මිලෙහි සියයට 12 ක පහළ වැටීමක් මගින් තරමක් දුරට මෙම බලපෑම කැපී ගොස් තිබේ. 1968 දී කුරුඳු කූරු සහ කුරුඳු කැබෙලිවල අපනයන ලැබීම් පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 33 ක් හා රුපියල් දශ ලක්ෂ 2 ක් වන අතර, 1967 වර්ෂයේ ඉපැයුම් මට්ටමට වඩා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2 ක් සහ රුපියල් දශ ලක්ෂ 1 ක වැඩිවීමක් සිදුවී ඇත. 1968 වර්ෂයේදී, කුරුඳු කූරු සහ කැබෙලිවල අපනයනය කළ ප්‍රමාණය හොණ්ඩර 9 දහස බැගින් වැඩි වූ අතර පිළිවෙලින් හොණ්ඩර 62 දහසක් සහ හොණ්ඩර 17 දහසක් විය. ගම්මිරිස් අපනයනය ඉපැයුම් රුපියල් දශ ලක්ෂ 2 කින් වැඩි වූ අතර, මෙය වනාහි සම්පූර්ණයෙන්ම, අපනයන පරිමාවේ ඇතිවූ හොණ්ඩර 14 දහසක ප්‍රසාරණයක් නිසා සිදුවූවක් විය. සියයට 32 කින් සාමාන්‍ය අපනයන මිල පහත වැටීමක් නිසා තරමක් දුරට අපනයන ප්‍රසාරණයෙහි බලපෑම මැකී ගියේය.

ඛණිජ ද්‍රව්‍ය ගණයෙහි, 1968 දී ස්වභාවික මිනිරන් වලින් ලැබුණ අපනයන ලැබීම් රුපියල් දශ ලක්ෂ 8 ක් වූ අතර, 1967 ඉපැයුම් මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 1 ක වැඩිවීමක් වාර්තාගත වී ඇත. මිනිරන් වලින් ලැබුණ අපනයන ඉපැයුම් වැඩිවීම, අපනයන පරිමාව සියයට 4 කින් වැඩිවීම සහ සාමාන්‍ය නැ. වි. ස. මිල සියයට 12 කින් ඉහළ යෑම යන කරුණු දෙක කරණ කොට ගෙන සිදු විය.

සෙසු කෘෂි නිෂ්පාදිත ගණයෙහි, කොකෝවා වලින් ලැබුනු අපනයන ඉපැයුම් රුපියල් දශ ලක්ෂ 7 ක් වී ඇතැයි වාර්තාගත වී ඇති අතර, මෙය ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 3 කින් හෙවත් සියයට 75 කින් වැඩිවීමකි. මෙම වැඩිවීම, අපනයන පරිමාව සියයට 50 කින් ප්‍රසාරණයවීම ( එනම්, හොණ්ඩර 23 දහසේ සිට හොණ්ඩර 35 දහස දක්වා ) සහ සාමාන්‍ය අපනයන මිල සියයට 18 කින් වැඩිවීම යන කරුණු දෙක කරණ කොට ගෙන සිදු විය. සකස් නොකරන ලද දුම්කොළවල අපනයන ලැබීම 1967 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 3 සිට 1968 දී රුපියල් දශ ලක්ෂ 5 දක්වා වැඩි වූ අතර, අපනයන පරිමාවේ සියයට 44 ක වැඩිවීමක් හා ඉකුත් වර්ෂයට වඩා සාමාන්‍ය අපනයන මිල සියයට 27 ක වැඩිවීමක ප්‍රතිඵලය නිසා මෙය සිදු වී තිබේ.

**ආනයනයන් :**

231 වැනි පිටුවේ දැක්වූ අයුරු රේගු වාර්තාවල සඳහන් වන, 1968 මුළු ආනයනයන් හි වටිනාකම රුපි. දශ ලක්ෂ 435 කින් වැඩිවීම වටහා ගතයුත්තේ යම් යම් ගැලපීම් සඳහා ඉඩ තැබීමෙන් පසුවය. මෙම වැඩි වීමට තරමක් දුරට හේතු වූයේ, ලංකා රුපියල අවප්‍රමාණය කිරීමේ ප්‍රති විපාකයන් වශයෙන් රුපියල් මිල ඉහල යාම නිසා යැයි දක්වා ඇති නමුත්, එය එසේ වීමට තරමක් දුරට හේතු වූයේ නියම වශයෙන් ආනයන කළ භාණ්ඩයන්ගේ වටිනාකම, රේගු සංඛ්‍යා තොරතුරු මගින්, පමණ ඉක්මවා සඳහන් කිරීම නිසාත් ය. වර්ෂය තුළදී නියම වශයෙන් ලැබුණු ආනයන යන්ගේ වටිනාකම් වල වෙනස්කම් මුළු ආනයන සංඛ්‍යාවෙන් පමණ ඉක්මවා සඳහන් කොට ඇති අතර, ඉකුත් වර්ෂයේ ආනයනයන් හි වටිනාකම අඩුවෙන් දක්වා ඇත. නිදර්ශනයක් වශයෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වල '' ආහාර සහ පාන'' උප ගණයේ සහල්, පිටි සහ සීනි ආනයන වල රේගු සංඛ්‍යාව ( 1968 දී ) රුපි. දශ ලක්ෂ 688 ක්ව පැවති අතර, ආහාර කොමසාරිස් වරයාට ඇත්ත වශයෙන්ම ලැබුණු මෙම වෙළෙඳ ද්‍රව්‍ය ආනයනයන්හි වටිනාකම රුපි. දශ ලක්ෂ 34 කින් වැඩි කොට දක්වා ඇත. ඊට කලින් වර්ෂයේ දී රේගු සංඛ්‍යා විසින් මෙකී ආනයනයන් ගේ වටිනාකම රුපි. දශ ලක්ෂ 35 කින් අඩු කොට දක්වා තිබුණි. මෙකී වෙනස්කම් සඳහා ගැලපීම් වලින් පසුව, ආනයනයන්හි ඇස්තමේන්තු වටිනාකම ඉකුත් වසරට වඩා රුපි. දශ ලක්ෂ 366 කින් වැඩි වී ඇති අතර, රුපියල අව ප්‍රමාණය කිරීමේ ප්‍රති විපාකය වශයෙන් රුපියල් මිල ඉහළ යාම ඊට බොහෝ සෙයින් හේතු වීය. සියයට 41 කින් වැඩි වූ සහල් ආනයන වටිනාකම රුපි. දශ ලක්ෂ 345 ක් වූයේ සහල් වල මි. සහ ගැ. මිල සාමාන්‍යයේ ඇතිවූ ටොන් එකකට රුපි. 363 ක හෙවත් සියයට 57 ක තියුණු වැඩිවීමේ ප්‍රතිඵලයක් මුල් කොටගෙනය. ආනයන කළ, සහල් පරිමාව ඉකුත් වසරට වඩා සියයට 10 කින් අඩුවිය. ආහාර කොමසාරිස් වරයා විසින් නියම වශයෙන් ආනයනය කරන ලද සහල්, පිටි සහ සීනි ආනයනයන් ට රේගු සංඛ්‍යා තොරතුරු ගැලපීමෙන් පසු ලැබෙන නියම තත්වය II (ඒ) 10 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

## II (ඒ) 10 වැනි සංඛ්‍යා සටහන

### ආහාර කොමසාරිස්වරයාගේ ආනයනයන් අනුව ගලපන ලද රේගු සංඛ්‍යා

| | වටිනාකම රුපියල් දශ ලක්ෂවලින් | |
|---|---|---|
| | 1967 | 1968 |
| 1. පාරිභෝගික භාණ්ඩ ... ... ... | 966 | 1,113 |
| ඒ අතුරින් | | |
| (අ) ආහාර පාන ... ... ... | 818 | 955 |
| (1) සහල් ... ... ... | 244 | 345 |
| (2) පිටි ... ... ... | 234 | 218 |
| (3) සීනි, (සුදු) ... ... | 71 | 91 |
| (ආ) රෙදිපිළි ... ... ... | 73 | 77 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ... | 75 | 81 |
| 2. අන්තර් භාණ්ඩ ... ... ... | 441 | 629 |
| 3. ආයෝජන භාණ්ඩ ... ... ... | 330 | 383 |
| 4. වර්ග නොකළ ආනයන ... ... ... | 36 | 14 |
| 5. ආනයන එකතුව ... ... ... | 1,773 | 2,139 |

ආහාර කොමසාරිස්වරයා විසින් නියම වශයෙන් ආනයනය කරන ලද සහල්, පිටි සහ සීනි ආනයනයන් පිළිබිඹු වන පරිදි ගලපා ගත් සංඛ්‍යා පදනමට අනුව 1968 මුළු ආනයන වටිනාකම රුපි. දශ ලක්ෂ 366 කින් හෙවත් සියයට 21 කින් වැඩි වී ඇත. මෙම ආනයන වටිනාකමෙහි වැඩිවීම ප්‍රධාන ආනයන ගණයන් තුනක් අතර බෙදී ගොස් ඇත. ඉකුත් වසර අනුව බලන කල '' පාරිභෝගික භාණ්ඩ '' ආනයන රුපි. දශ ලක්ෂ 147 කින් හෙවත් සියයට 15 කින්

හෙවත් වැඩි වූ නමුත්, මුළු ආනයනයන්හි ලා ඒවායේ කොටස සියයට 52 ක් වූයේ සියයට 2 කින් පහත වැටෙමිනි. " අන්තර් භාණ්ඩ " ආනයනයන් රුපි. දශ ලක්ෂ 188 කින් හෙවත් සියයට 43 කින් ප්‍රසාරණය වී ඇති බව දක්වෙන අතර, මුළු ආනයනයන් හි ලා ඒවායේ කොටස සියයට 4 රේ සිට සියයට 29 දක්වා ඉහල ගොස් ඇත. මේ අතර " ආයෝජන භාණ්ඩ " ආනයනයන් රුපි. දශ ලක්ෂ 53 කින් හෙවත් සියයට 16 කින් වැඩි වී ඇත. එසේ වුවද, මුළු ආනයන සංඛ්‍යාවෙහි ලා ආයෝජන භාණ්ඩ කොටස සමාලෝචනයට භාජන ව ඇති වසර තුළදී සියයට 1 කින් සියයට 18 දක්වා පහළ වැටිනි.

" පාරිභෝගික භාණ්ඩ " ගණයේ ආනයන වටිනාකමෙහි වැඩිවීම එකී ගණය සෑදී ගත් උප ගණ තුන, එනම්, " ආහාර පාන " " රෙදි පිලි " සහ " වෙනත් පාරිභෝගික භාණ්ඩ " යන ගණයන් අතර බෙදී ගියේය.

1967 සහ 1968 වර්ෂයන් සම්බන්ධයෙන් වාර්තා වී ඇති ආහාර කොමසාරිස් වරයාගේ සහ රේගුවේ සහල්, පිටි සහ සීනි ආනයන වල පරිමාවන් හි වටිනාකම් සහ සාමාන්‍ය මි. සහ ගැ. මිල II (ඒ) II වැනි සංඛ්‍යා සටහනෙන් දක් වේ.

## II (ඒ) 11 වැනි සංඛ්‍යා සටහන

සහල්, තිරිඟු පිටි සහ සීනි ද්‍රව්‍යයන්ගේ රේගු සංඛ්‍යා සහ නියම වශයෙන් ලද ආනයන සංඛ්‍යා

| | ආහාර කොමසාරිස්වරයාගේ සංඛ්‍යා | | | | රේගු සංඛ්‍යා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1967 | 1968 | වෙනස: නිරපේක්ෂ | වෙනස: % ගණන | 1967 | 1968 | වෙනස: නිරපේක්ෂ | වෙනස: % ගණන |
| **සහල්** | | | | | | | | |
| ප්‍රමාණය : ටොන් දහස් ... | 381 | 344 | — 37 | — 9.7 | 349 | 364 | + 15 | + 4.3 |
| වටිනාකම : රුපි. දශ ලක්ෂ ... | 244 | 345 | +101 | +41.4 | 211 | 341 | +130 | +61.6 |
| මි.ගැ. මිල : ටොන් එකකට රු. ... | 640.80 | 1003.44 | +362.64 | +56.6 | 603.01 | 936.84 | +333.83 | +55.4 |
| **තිරිඟු පිටි** | | | | | | | | |
| ප්‍රමාණය : ටොන් දහස් ... | 517 | 359 | —158 | —30.6 | 505 | 422 | —83 | — 16.4 |
| වටිනාකම : රුපි. දශ ලක්ෂ ... | 234 | 218 | — 16 | — 6.8 | 229 | 250 | + 21 | + 9.2 |
| මි.ගැ. මිල : ටොන් එකකට රු. ... | 453.26 | 607.90 | +154.64 | +34.1 | 452.74 | 592.52 | +139.78 | +30.9 |
| **සීනි** | | | | | | | | |
| ප්‍රමාණය : ටොන් දහස් ... | 226 | 220 | — 6 | — 2.7 | 243 | 242 | — 1 | — 0.4 |
| වටිනාකම : රුපි. දශ ලක්ෂ ... | 71 | 91 | + 20 | +28.2 | 74 | 97 | + 23 | + 31.1 |
| මි.ගැ. මිල : ටොන් එකකට රු. ... | 313.70 | 413.25 | + 99.55 | +31.7 | 302.53 | 401.82 | + 99.29 | +32.8 |
| සහල්, තිරිඟු පිටි හා සීනිවල මුළු වටිනාකම රුපි. දශ ලක්ෂ ... | 549 | 654 | +105 | +19.1 | 514 | 688 | +174 | +33.9 |

මූලය: ආහාර කොමසාරිස්තැනගේ දෙපාර්තමේන්තුව,
ලංකා රේගු වාර්තා.

1968 දී ආහාර කොමසාරිස්වරයා විසින් ආනයනය කල සහල් පිටි සහ සීනි ආනයනයන් ගේ මුලු ප්‍රමාණය, ඇත්ත වශයෙන්ම රුපි. දශ ලක්ෂ 654 ක්ව පැවති අතර, එය 1967 දීට වඩා රුපි. දශ ලක්ෂ 105 කින් හෙවත් සියයට 19 කින් වැඩි වී ඇති බැව් ඉහත සංඛ්‍යා වලින් අනාවරණය වෙයි. ආහාර කොමසාරිස්වරයා විසින් ගෙන්වූ සහල් සහ පිටි ආනයනයන් හි වටිනාකම් පිළිවෙලින්, රුපි. දශ ලක්ෂ 345 ක් සහ රුපි. දශ ලක්ෂ 91 ක්ව පැවති අතර, ඔහු විසින් දක්වා ඇති පරිදි මෙකී සංඛ්‍යාවන් පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 101 කින් හෙවත් සියයට 41 කින් සහ රුපි. දශ ලක්ෂ 20 කින් හෙවත් සියයට 28 කින් ඉකුත් වසරේ සංඛ්‍යාවන් අභිබවා ලීය. මේ අතර පිටි ආනයනයන්හි වටිනාකම පහත වැටු . මෙහි වටිනාකම රුපි. දශ ලක්ෂ 218 ක් ව පැවති අතර ඉකුත් වසරට වඩා මෙම සංඛ්‍යාව රුපි. දශ ලක්ෂ 16 කින් හෙවත් සියයට 7 කින් අඩු වීය.

සමාලෝචනයට භාජන වන වසර තුලදී සහල් ආනයන වටිනාකම වැඩිවීමට මුළුමනින්ම පාහේ හේතු වූයේ සාමාන්‍ය මි. සහ ගැ. මිල, ටොන් එක රුපි. 363 ක හෙවත් සියයට 57 ක තියුණු වැඩිවීමේ ප්‍රති විපාකයයි. මෙහි බලපෑම හේතුකොට ගෙන මෙම ද්‍රව්‍ය ආනයනයන්හි පරිමාවේ ටොන් 37 දහසක හෙවත් සියයට 10 ක පහත වැටීම, පමණටත් වැඩියෙන් මැකී ගියේය. සහල් වල සාමාන්‍ය මි. සහ ගැ. මිල තියුණු ලෙස වැඩි වීම ලෝක වෙළෙඳ පොලේ මිල උපනතියට අනුකූල වූ අතර මෙය එතෙර රටවල අස්වැන්න අඩු වීමෙන් ඒ නිසා හිඟකම් ඇති වීමෙත් ප්‍රතිඵලයක් වන අතර, ලංකා රුපියල අව ප්‍රමාණය කිරීමෙන් රුපියල් මිල ඉහළ යාමේත් ප්‍රතිඵලයක් ද විය.

පිටි ආනයනයන් හි වටිනාකම රුපි. දශ ලක්ෂ 16 කින් හෙවත් සියයට 7 කින් අඩු වූයේ, ආනයනය කළ ප්‍රමාණයෙහි ඇති වූ රාත්තල් දශ ලක්ෂ 158 ක හෙවත් සියයට 31 ක තියුණු සංකෝචනයේ ප්‍රති විපාකයක් වශයෙනි. මෙහි බලපෑම මි. සහ ගැ. මිල සාමාන්‍යයෙහි ටොන් එකකට රුපි. 155/– ක හෙවත් සියයට 34 ක තියුණු වැඩිවීම නිසා බොහෝ දුරට මැකී ගියේය. රුපියල් මිලෙහි මෙම වැඩිවීමට බොහෝ සෙයින්ම හේතු වූයේ ලංකා රුපියල අවප්‍රමාණ කිරීමය. සමාලෝචනයට භාජනව ඇති වර්ෂය තුළදී ආනයනය කළ පිටි පරිමාව පහත වැටීමට හේතු වූයේ ඉකුත් වසරේ දී රැස්කර ගත් විශාල තොග පැවතීම නිසාය. තවද 1967 දී ආනයනය කළ පරිමාව විශේෂ වශයෙන්ම[1] වැඩි වීමය.

1967 වසර හා සංසන්දනය කර බලන කල, 1968 සීනි ආනයන වටිනාකම රුපි. දශ ලක්ෂ 20 කින් වැඩි වීමට හේතු වූයේ මි. සහ ගැ. මිල සාමාන්‍යයෙහි ටොන් එකකට රුපි. 100/– ක හෙවත් සියයට 32 ක වැඩි වීමකි. එහෙත් ආනයන පරිමාව ටොන් 6 දහසකින් හෙවත් සියයට 3 කින් ඉකුත් වසරට වඩා සංකෝචනය වීය. සීනි වල මි. සහ ගැ. මිල සාමාන්‍යය වැඩි වූයේ ජාත්‍යන්තර වෙළෙඳ පොල[2] වල පැවති මිල වැඩිවීමේ ප්‍රතිඵලයත් ලංකා රුපියල අවප්‍රමාණය කිරීමේ ප්‍රතිඵලයත් හේතුකොට ගෙනය.

රේගු වාර්තා වලින් පිළිබිඹු වන පරිදි ප්‍රධාන ගණයන් සහ ද්‍රව්‍යයන් හෝ ද්‍රව්‍ය භාණ්ඩයන් අනුව ආනයනයන් බෙද දක්වා ඇති අයුරු II (ඒ) 12 වැනි සටහනින් දැක්වේ.

---

1. 1967 මහ බැංකු වාර්ෂික වාර්තාවේ 159 වැනි පිටුවේ. II (ඒ) 9 සංඛ්‍යා සටහන බලන්න.

2. බී 96 සීනි සඳහා ලංඩන් දෛනික මිලෙහි වාර්ෂික සාමාන්‍යය එ. ජ. මි. ර. ගැ. තොග පදනම අනුව, 1967 දී ටොන් එකකට පවුම් 19.41 ක් වූ අතර 1968 දී පවුම් 21.65 ක් විය.

## ආනයන-ප්‍රධාන භාණ්ඩ ගණ සහ භාණ්ඩ හෝ

| | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | |
|---|---|---|---|
| | 1964 | 1965 | 1966 |
| 1. පාරිභෝගික භාණ්ඩ … … … | 1,263 | 779 | 1,161 |
| එයින්, | | | |
| (අ) ආහාර පාන … … … | 1,008 | 604 | 956 |
| (1) සහල් … … … | 326 | 144 | 367 |
| (2) තිරිඟු පිටි … … … | 137 | 98 | 113 |
| (3) (අ) සීනි, (සුදු) … … | 185 | 71 | 103 |
| (ආ) සීනි, අනෙකුත් සක්කරා, හකුරු සහ සූකිරි … … … | 2 | 1 | 2 |
| (4) කිරි හා කිරි නිෂ්පාදිත … … | 94 | 77 | 77 |
| (5) මස්, මාළු හා බිත්තර … … | 74 | 61 | 101 |
| එයින්, (අ) කරවල (උම්බලකඩ හැර එහෙත් වියලි ඉස්සන් ඇතුළුව) | 52 | 43 | 75 |
| (ආ) අනෙකුත් මාළු … … | 17 | 13 | 19 |
| (ඇ) මස් සහ පිළියෙල කළ මස් … | 5 | 5 | 4 |
| (ඈ) බිත්තර … … | — | … | — |
| (6) අනෙකුත් ආහාර … … … | 164 | 124 | 170 |
| එයින්, (අ) අර්තාපල් … … | 25 | 18 | 24 |
| (ආ) කඩල සහ ධාන්‍ය ඇට වර්ග … | 51 | 39 | 64 |
| (ඇ) ලූණු… … … | 26 | 21 | 20 |
| (ඈ) මිරිස් … … | 46 | 30 | 43 |
| (7) බීම සහ සකස් කළ දුම්කොළ … | 3 | 2 | 2 |
| (ආ) රෙදිපිළි (ඇඳුම් ඇතුළුව) … … | 165 | 107 | 119 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ … … | 90 | 68 | 86 |
| එයින්, | | | |
| (1) මෝටර් රථ … … | 3 | 3 | 3 |
| (2) ඔරලෝසු සහ අත් ඔරලෝසු … | … | … | … |
| (3) ගුවන් විදුලි යන්ත්‍ර … … | … | … | … |
| (4) රබර් ටයර් සහ ටියුබ් … … | 4 | 7 | 5 |
| (5) ඖෂධ සහ ඖෂධීය සංයෝග … | 26 | 21 | 35 |
| 2. අන්තර් භාණ්ඩ … … … … | 397 | 414 | 470 |
| එයින්, | | | |
| (1) පොහොර … … … | 78 | 88 | 91 |
| (2) ඛණිජ තෙල් නිෂ්පාදිත … … | 93 | 109 | 130 |
| (3) ගල් අඟුරු … … … | 12 | 10 | 3 |
| (4) රසායනික ද්‍රව්‍ය සහ සංයෝග … | 37 | 30 | 36 |
| (5) ඩයි වර්ග, පදනම් කිරීමේ සහ වර්ණ ද්‍රව්‍ය | 12 | 9 | 13 |
| (6) තේ සහ අනෙකුත් ලී පෙට්ටි … | 15 | 12 | 18 |
| (7) කඩදාසි සහ කඩදාසි බෝඩ … | 35 | 28 | 50 |
| (8) කැටි නූල් සහ නූල් … … | 22 | 41 | 42 |
| (9) සකස් නොකළ දුම්කොළ … | 7 | 9 | 8 |
| 3. ආයෝජන භාණ්ඩ … … … … | 305 | 261 | 361 |
| එයින්, | | | |
| (1) ගොඩනැගිලි උපකරණ … … | 93 | 54 | 70 |
| මෙයින්, (අ) සිමෙන්ති … … | 15 | 17 | 20 |
| (2) ගමනාගමන උපකරණ … … | 58 | 96 | 116 |
| (3) යන්ත්‍රෝපකරණ … … | 145 | 100 | 162 |
| 4. එකතුව (1, 2 සහ 3 ශීර්ෂවල) … … … | 1,965 | 1,454 | 1,992 |
| 5. වර්ග නොකළ ආනයන … … … | 10 | 20 | 36 |
| 6. මුළු ආනයන … … … … | 1,975 | 1,474 | 2,028 |

මූලය: ලංකා රේගු වාර්තා.

## භාණ්ඩ වර්ග අනුව 1964 — 1968

| | | මුළු ආනයනවලින් සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|
| 1967 | 1968 | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
| 931 | 1,147 | 63.9 | 52.8 | 57.2 | 53.6 | 52.8 |
| 783 | 989 | 51.0 | 41.0 | 47.1 | 45.1 | 45.5 |
| 211 | 341 | 16.5 | 9.8 | 18.1 | 12.1 | 15.7 |
| 229 | 250 | 6.9 | 6.6 | 5.6 | 13.2 | 11.5 |
| 74 | 97 | 9.4 | 4.8 | 5.1 | 4.3 | 4.5 |
| ... | ... | 0.1 | 0.1 | 0.1 | ... | ... |
| 66 | 74 | 4.8 | 5.2 | 3.8 | 3.8 | 3.4 |
| 56 | 70 | 3.7 | 4.1 | 5.0 | 3.2 | 3.2 |
| 44 | 58 | 2.6 | 2.9 | 3.7 | 2.5 | 2.7 |
| 9 | 11 | 0.9 | 0.9 | 0.9 | 0.5 | 0.5 |
| 3 | 1 | 0.3 | 0.3 | 0.2 | 0.2 | ... |
| — | — | ... | ... | — | — | — |
| 126 | 125 | 8.3 | 8.4 | 8.4 | 7.2 | 5.8 |
| 7 | ... | 1.3 | 1.2 | 1.2 | 0.4 | ... |
| 53 | 56 | 2.6 | 2.6 | 3.1 | 3.0 | 2.6 |
| 19 | 17 | 1.3 | 1.4 | 1.0 | 1.1 | 0.8 |
| 29 | 34 | 2.3 | 2.0 | 2.0 | 1.7 | 1.6 |
| 2 | 2 | 0.2 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| 73 | 77 | 8.4 | 7.3 | 5.9 | 4.2 | 3.5 |
| 75 | 81 | 4.6 | 4.6 | 4.2 | 4.3 | 3.7 |
| 10 | 7 | 0.2 | 0.2 | 0.1 | 0.6 | 0.3 |
| .... | ... | ... | ... | ... | ... | ... |
| ... | 3 | ... | 0.1 | 1 | ... | 0.1 |
| 4 | 3 | 0.2 | 0.5 | 0.2 | 0.2 | 0.1 |
| 22 | 23 | 1.3 | 1.4 | 1.7 | 1.3 | 1.1 |
| 441 | 629 | 20.1 | 28.1 | 23.2 | 25.4 | 29.0 |
| 80 | 110 | 3.9 | 6.0 | 4.5 | 4.6 | 5.1 |
| 112 | 196 | 4.7 | 7.4 | 6.4 | 6.4 | 9.0 |
| 9 | 4 | 0.6 | 0.7 | 0.1 | 0.5 | 0.2 |
| 38 | 45 | 1.9 | 2.0 | 1.8 | 2.2 | 2.1 |
| 10 | 15 | 0.6 | 0.6 | 0.6 | 0.6 | 0.7 |
| 9 | 10 | 0.8 | 0.8 | 0.9 | 0.6 | 0.5 |
| 41 | 37 | 1.8 | 1.9 | 2.5 | 2.4 | 1.7 |
| 45 | 71 | 1.1 | 2.8 | 2.1 | 2.6 | 3.3 |
| 6 | 10 | 0.4 | 0.6 | 0.4 | 0.3 | 0.5 |
| 330 | 383 | 15.4 | 17.7 | 17.8 | 19.0 | 17.6 |
| 48 | 95 | 4.7 | 3.3 | 3.4 | 2.8 | 4.5 |
| 9 | 17 | 0.8 | 1.2 | 1.0 | 0.5 | 0.8 |
| 89 | 80 | 2.9 | 6.5 | 5.7 | 5.1 | 3.7 |
| 175 | 195 | 7.3 | 6.8 | 8.0 | 10.1 | 9.0 |
| 1,702 | 2,159 | 99.5 | 98.6 | 98.2 | 97.9 | 99.4 |
| 36 | 14 | 0.5 | 1.4 | 1.8 | 2.1 | 0.6 |
| 1,738 | 2,173 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

1968 සඳහා වූ රේගු වාර්තා වල සඳහන් රුපි. දශ ලක්ෂ 435 ක ආනයන වටිනාකම්හි වැඩිවීම, ප්‍රධාන ආනයන ගණයන් තුන අතර බෙදී ගියේය. විශාලතම වැඩිවීම ඇති වූයේ '' පාරිභෝගික භාණ්ඩ '' ගණයේ ය. මෙහි ආනයන වටිනාකම රුපි. දශ ලක්ෂ 216 කින් හෙවත් සියයට 23 කින් ඉකුත් වසර අභිබවා වැඩිවිණි. 1967 වර්ෂයේදී මුළු ආනයන ගණයෙහි මෙකී ආනයන කොටස සියයට 54 ක්ව පැවති අතර, සමාලෝචනයට භාජනය වන වසරේ දී එය සියයට 1 කින් පහළ වැටී, සියයට 53 ක් විය.

පාරිභෝගික භාණ්ඩ ආනයනය තියුණු අන්දමින් වැඩි වීමට බොහෝ සේ හේතු වූයේ '' ආහාර පාන '' ශීර්ෂයන් යටතේ වන ආනයනයන් වටිනාකමින් වැඩි වීමය. මෙකී ආනයන යන් ගේ වටිනාකම 1968 දී රුපි. දශ ලක්ෂ 989 ක්ව පැවති අතර, රුපි. දශ ලක්ෂ 206 ක හෙවත් සියයට 26 ක වැඩිවීමක් දක්වා ලිය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රජයේ සහල්, පිටි සහ සීනි ආනයනයන්ට අදල රේගු සටහන්වල සඳහන් ප්‍රමාණයන් මුළු සංඛ්‍යාවට වඩා රුපි. දශ ලක්ෂ 174 කින් හෙවත් සියයට 34 කින් වැඩි වීමය. මෙකී ද්‍රව්‍යයන්ගේ නියම ආනයනයන් හි වෙනස්කම් කෙසේ හෝ රේගු සටහන් වලට වඩා වෙනස් වූ අතර, මේ පිළිබඳව කලින් කොටසක විස්තර සහිතව දක්වා ඇත. '' කිරි සහ කිරි නිෂ්පාදිත '' සහ '' මස් සහ මාළු '' ආනයනයන් පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 74 ක් සහ රුපි. දශ ලක්ෂ 70 ක්ව පැවති අතර, ඉකුත් වසර හා සසඳන කල්හි, ඒවා රුපි. දශ ලක්ෂ 8 කින් හෙවත් සියයට 12 කින් සහ රුපි. දශ ලක්ෂ 14 කින් හෙවත් සියයට 24 කින් වැඩි විය. දෙවැනිව කී උප ගණයේ වැඩිවීමට බොහෝ කොටම හේතු වූයේ කරවල ආනයනයන් වැඩිවීමය. '' වෙනත් ආහාර '' ( කඩල, මැ වර්ග, කුළු බඩු ඇතුළත්ය. ) ආනයනයන් සම්බන්ධයෙන් 1968 දී ආනයන වටිනාකම රුපි. දශ ලක්ෂ 1 කින් හෙවත් සියයට 1 කින් පහළ වැටී රුපි. දශ ලක්ෂ 125 ක් වූ බැව් සටහන් වී තිබේ. මෙම ගණයෙහි කඩල, මැ වර්ග, වියළි මිරිස්, ආනයනයන් වැඩි වූ අතර ළූණු ආනයනයන් පහල වැටුණි.

අනෙකුත් පාරිභෝගික භාණ්ඩ උප ගණ දෙක සම්බන්ධයෙන් සලකා බැලීමේදී '' රෙදි පිලි සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ '' යන දෙකෙහිම ආනයන වටිනාකම පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 4 කින් සහ 6 කින් වැඩි වූ අතර, සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී ඒවා පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 77 ක් සහ රුපි. දශ ලක්ෂ 81 ක් විය. මුළු ආනයන එකතුවෙහිලා '' රෙදි පිලි '' වලට මෙන්ම '' වෙනත් පාරිභෝගික භාණ්ඩ '' වලට ඇති කොටස් සියයට 4 ක් වූ අතර, ඉකුත් වසරට වඩා මෙහි වෙනසක් දක්නට නොවිය. '' වෙනත් පාරිභෝගික භාණ්ඩ '' උප ගණයෙහි '' ඖෂධීය හා භෛෂජ්ජික නිෂ්පාදිත '' ආනයන ඉකුත් වසර හා සසඳා බලන කල රුපි. දශ ලක්ෂ එකක හෙවත් සියයට 5 ක වැඩි වීමක් දක් විය. '' රේඩියෝ රිසීවර '' ආනයන ඉකුත් වසර දෙකෙහි දී සැලකිල්ලට ගත යුතු තරමේ සංඛ්‍යාවක් නොවූවද, 1968 දී රුපි. දශ ලක්ෂ 3 කින් වැඩි විය. එහෙත් මෝටර් කාර් ආනයන සමාලෝචනය වන වර්ෂය තුළදී රුපි. දශ ලක්ෂ 7 දක්වා රුපි. දශ ලක්ෂ 3 කින් පහළ වැටුණි.

'' අන්තර් භාණ්ඩ '' ගණයේ '' ඛනිජ තෙල් නිෂ්පාදිත '' රුපි. දශ ලක්ෂ 196 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ දී සටහන් වූ වටිනාකමට වඩා මෙය සියයට 84 කින් වැඩි විය. මෙම භාණ්ඩයේ ආනයන වටිනාකම මෙසේ සීඝ්‍ර ලෙස ඉහළ යාමට හේතු වූයේ ආනයනය කරන ලද ප්‍රමාණය ගැලුම් දශ ලක්ෂ 99 කින් හෙවත් සියයට 37 කින් වැඩිවීම සහ සාමාන්‍ය මි. ර. ගැ. මිල ගැලුමක් ශත 10 කින් හෙවත් සියයට 24 කින් වැඩි වීමය. 1968 දී ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදිත පරිමාව රුපි. දශ ලක්ෂ 365 ක් වූ අතර, ගැලුමක සාමාන්‍ය මි. ර. ගැ. මිල ශත 52 ක් විය. සූවස් ඇල වැසීම හේතුකොට ගෙන කේප් තුඩුව හරහා දීර්ඝ මාර්ගයක් ඔස්සේ ඒමට සිදුවූ නිසාත්, රන් පවුම අවප්‍රමාණය කිරිම නිසාත් නැව් සමාගම් සම්මේලනය විසින් ගැල් කුලී අධිභාරයන් පණවන ලදී. මෙහි ප්‍රතිඵලයන් වශයෙන් 1968 දී සෝ. ස. ස. සං. වෙතින් අනයනය කල නිෂ්පාදිතයන්ගේ මි. ර. ගැ. මිල සාමාන්‍යය ගැලුමක් ශත 65 දක්වා ශත 26 කින් වැඩිවිය. මුළු ආනයනයන්හි ඛනිජ තෙල් ආනයන කොටස සියයට 9 ක්ව පැවතුන අතර ඉකුත් වසරට වඩා සියයට 3 කින් වැඩි විය. ''පොහොර '' ආනයනය ද 1968 දී ඉහළ ගියේ ය. රුපි. දශ ලක්ෂ 110 ක්ව පැවති මෙකී ආනයන යන්ගේ වටිනාකම 1967 දී පැවති ආනයන මට්ටම අනුව සසඳා බලන කල රුපියල් දශ ලක්ෂ 30 කින් හෙවත් සියයට 38 කින් වැඩි වී තිබුණි. 1968 පොහොර ආනයන පරිමාව ටොන් 338 දහසක්ව පැවති අතර, එමගින් ටොන් 61 දහසක හෙවත් සියයට 22 ක වැඩිවීමක් පිළිබිඹු වූවාය. ටොන් එකක සාමාන්‍ය මි. ර. ගැ. මිල රුපි. 326 ක්ව පැවති අතර, ටොන් එකක් රුපියල් 34 කින් හෙවත් සියයට 12 කින් ඉහළ ගියේය. '' රෙදි විවීමට ගන්නා නූල් සහ වෙනත් නූල් '' 1968 දී රුපියල් දශ ලක්ෂ 26 කින් හෙවත් සියයට 58 කින් රුපියල් දශ ලක්ෂ 71 දක්වා වැඩිවිණි. ' අන්තර් භාණ්ඩ ' ගණයේ වෙනත් සැලකිය යුතු වෙනස්කම් අතර රසායනික මූල ද්‍රව්‍ය හා සංයෝගයන් '' සායම් කිරීමේ, සම් පදම් කිරීමේ සහ පාට කිරීමේ

ද්‍රව්‍ය " සහ " සකස් නොකළ දුම්කොළ " යන මේවාට පිළිවෙළින්, රුපියල් දශ ලක්ෂ 7 කින් හෙවත් සියයට 8 කින්, රුපියල් දශ ලක්ෂ 2 කින් හෙවත් සියයට 50 කින් සහ රුපියල් දශ ලක්ෂ 4 කින් හෙවත් සියයට 67 කින් වූ වැඩිවීම් ඇතුළත් වෙයි. " ගල් අඟුරු " සහ " කඩදාසි සහ කඩදාසි බෝඩ් " ආනයනයන් කෙසේ හෝ පහත වැටී ඇති බැව් වාර්තා වී ඇත.

" ආයෝජන භාණ්ඩ " ගණයේ " ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ආනයනයන් පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 95 ක් සහ රුපියල් දශ ලක්ෂ 195 ක්ව පැවති අතර, ඒවා පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 47 කින් හෙවත් සියයට 98 කින් සහ රුපියල දශ ලක්ෂ 20 කින් හෙවත් සියයට 11 කින් වැඩි වී තිබේ. අනෙක් අතට, " ප්‍රවාහන උපකරණ " ආනයනයන්හි වටිනාකම ඉකුත් වසර හා බලන කල රුපියල් දශ ලක්ෂ 9 ක හෙවත් සියයට 10 ක සංකෝචනයක් පළ කැරිණ. " ගොඩනැගිලි ද්‍රව්‍ය " උප ගණයේ " සිමෙන්ති " ආනයනයන්හි වටිනාකම රුපියල් දශ ලක්ෂ 17 ක් වූ අතර, මෙය 1967 දී ආනයනය කළ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 8 ක හෙවත් සියයට 89 ක තියුණු ඉහළ නැගීමක් වාර්තා කැරිණි. සිමෙන්ති ආනයන වටිනාකමෙහි වැඩිවීමට බොහෝ සෙයින් ම හේතු වූයේ ආනයනය කළ ප්‍රමාණය සීඝ්‍ර ලෙස වැඩිවීමය. 1967 දී ටොන්, 99 දහසක් ව පැවති මෙම ප්‍රමාණය සමාලෝචනයට භාජන වර්ෂය තුළදී ටොන් 180 දහසක් දක්වා වැඩි වී තිබුණි. ටොන් එකක සාමාන්‍ය මි. ර. ගැ. මිල රු. 2 කින් වැඩිවීම නිසාමෙහි බලපෑම ප්‍රබල විය. සිමෙන්ති ටොන් එකක සාමාන්‍ය මි. ර. ගැ මිල රු. 92 ක් වෙයි.

මහ බැංකු දර්ශකය අනුව බලන කල රේගු සටහන් පදනම් කොට ගත් මුළු ආනයන පරිමාව ඉකුත් වසරේදී සීඝ්‍රයෙන් පහත වැටී තිබුණ අතර, සමාලෝචනයට ලක්ව ඇති මේ වසරේ තවත් සියයට 2 කින් පහත වැටී සියයට 83 ක් විය. ( පාදය 1958 = 100 ) පරිමාවෙහි ඇති වූ මෙම සංකෝචනය පාරිභෝගික හා ආයෝජන භාණ්ඩ කාණ්ඩවලට පමණක් සීමා වී ඇති බව ප්‍රධාන ආනයන ගණවල ඒ ඒ දර්ශකයන් ගෙන් හෙළි වෙයි. අනෙක් අතට අන්තර් භාණ්ඩවල ආනයන පරිමා දර්ශකයෙහි ප්‍රසාරණයන් වාර්තාගත වී ඇත. පිළිවෙළින් 75 ක් සහ 55 ක් ව පැවති පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ පරිමා දර්ශකයන් පිළිවෙළින් සියයට 5 කින් හා සියයට 15 කින් අඩු වූ අතර, 141 ක්ව පැවති අන්තර් භාණ්ඩ සියයට 10 කින් වැඩි වී ඇත. පාරිභෝගික භාණ්ඩ ගණය තුළ ඇති වූ ආනයන පරිමාවේ පහත වැටීම උප ගණ තුනට ම එනම්, " ආහාර පාන ", රෙදිපිළි " සහ වෙනත් පාරිභෝගික භාණ්ඩ කෙරෙහි බල පැවැත් විය. මෙකී උප ගණයන්ගේ දර්ශකයන්, පිළිවෙලින්, 100 හි, 34 හි, සහ 31 හි පැවති අතර, ඒවා පිළිවෙළින් සියයට 3 කින්, සියයට 13 කින් සහ සියයට 12 කින් පහත වැටී ඇති බැව් ඉකුත් වසර හා සසඳන කල පෙනී යයි.

මෑත වර්ෂවල දී ඉහළයාමේ උපනතියක් දක් වූ සියළු ම ආනයනවල මිල සාමාන්‍යය 1968 තුළ දී එලෙසම නො කඩවා පවතින්නට විය 1968 දී 160 ක සාමාන්‍යයක් දක් වූ මහ බැංකුවේ ආනයන මිල දර්ශකය ( පාදය 1958 = 100 ) 1967 දීට වඩා සියයට 30 කින් වැඩි විය. සමාලෝචනයට භාජන යවූ වර්ෂය තුළ දී පාරිභෝගික හා අන්තර් භාණ්ඩ පිළිවෙළින් සියයට 36 කින් හා සියයට 22 කින් වැඩි වී පිළිවෙලින් 155 ක් හා 105 ක් වී ඇති බවත්, ආයෝජන භාණ්ඩ මඳ වේගයකින් වැඩි වී, එනම්, සියයට 18 කින් වැඩි වී 241 ක් වූ බවත්, ප්‍රධාන ආනයන ගණයන්හි මිල දර්ශකයන් ගෙන් පිළිබිඹු කරයි. පාරිභෝගික භාණ්ඩ ගණයේ උප ගණයන් තුනෙහි ම මිල වැඩිවීම් වාර්තාගත වී තිබේ. 1968 තුළ දී ' ආහාර පාන ' සහ ' රෙදි පිළි ' මිල දර්ශකයන් පිළිවෙළින් සියයට 40 කින් සහ සියයට 27 කින් වැඩි වී පිළිවෙළින් 154 ක් සහ 128 ක්ව පැවති අතර, වෙනත් පාරිභෝගික භාණ්ඩ සියයට 32 කින් වැඩි වී 178 ක් විය.

**කොළඹ වරායේ සිදු වූ වර්ධනයන්**

1966 යේ සහ 1967 තේ වර්ෂවල දී කොළඹ වරායේ බඩු තොග පැටවීමේ හා බෑමේ කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතු දියුණුවක් ලබා ඇති බැව් එම වර්ෂවල වාර්ෂික වාර්තාවල සඳහන් වී තිබේ. එහෙත්, 1968 වර්ෂයේ දී වරායේ මෙම තත්වයෙහි පරිහානියක් දක්නට ලැබිණ.

කොළඹ වරායට ඇතුළු වූ නැව් සංඛ්‍යාව වසර තුළ දී සියයට 2 කින් වැඩි වූ නමුත් මෙකී නැව් බඩු තොග බා ආපසු පිට වීමේ වේගයෙහි තියුණු පසු බැස්මක් ඇති විය. එකී නැව් වරායේ රැඳී සිටි සාමාන්‍ය කාල සීමාව 1967 දී පැවැති දින 7.5 කාල සීමාවේ සිට 1968 දී දින 11.7 දක්වා දීර්ඝ විය. මෙය වනාහී සියයට 65 ක[1] පිරිහීමකි. 1965, 1966 සහ 1967 වර්ෂවල සංඛ්‍යා හා සසඳමින් 1968 වසර තුළ දී කොළඹ වරායට සේන්දු වී නික්ම ගිය නැව් පිළිබඳ විස්තර II (ඒ) 13 සංඛ්‍යා සටහනින් දක්වේ.

1. 1968 දී ගෙවන ලද නැව් ප්‍රමාද වන්දි ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 11.7ක් විය. (රන්පවුම් 818,000).

## II (ඒ) 13 වැනි සංඛ්‍යා සටහන

### 1965 — 68 සාමාන්‍ය නැව් බඩු ගෙන ආ යාත්‍රාවන්හි නික්ම යෑම

| වර්ෂය | නැව් (ටොන් 50 ට) වැඩි) | එක් නැවක් පැමිණි වේලේ සිට වැඩ අර ඹන තෙක් වරාය තුළ නවතා තිබූ සාමාන්‍ය කාලසීමාව (දින) | එක් නැවක බඩු බා අවසන් කිරීමට ගත වූ සාමාන්‍ය කාලය (දින) | එක් නැවක් රැඳී සිටි සාමාන්‍ය කාල සීමාව (දින) |
|---|---|---|---|---|
| 1965 | 504 | 2.04 | 8.03 | 10.1 |
| 1966 | 632 | 0.47 | 7.02 | 7.5 |
| 1967 | 644 | 0.39 | 6.75 | 7.1 |
| 1968 | 658 | 2.75 | 8.97 | 11.7 |

මූලය: වරාය ( නැව් බඩු) සංයුක්ත මණ්ඩලය.

එහෙත් 1968 දී වරායේ දී ගොඩබාන ලද හා පටවන ලද නැව් බඩු තොග පරිමාව ඉකුත් වසර හා සසඳන කල නාවික ටොන් 1,40,255 ක් හෙවත් සියයට 5 කින් වැඩි වී ඇත. මේ අතර, අපනයන නැව් බඩු තොග පරිමාව නාවික ටොන් 24,175 කින් හෙවත් සියයට 3 කින් වැඩිවීමත් සමග ආනයන නැව් බඩු තොග පරිමාව නාවික ටොන් 1,16,080 කින් හෙවත් සියයට 5 කින් ඉකුත් වසර[1] අභිබවා වඩාත් කැපී පෙනෙන ලෙස ඉහළ නැංගේය.

1967 ජූනි මාසයේ දී සූවස් ඇල වැසීම හේතු කොට ගෙන කේප් තුඩුව හරහා දීර්ග මාර්ගයන් ඔස්සේ යාත්‍රා කිරීමට සිදු වීම නිසාත්, නැවත 1967 නොවැම්බර් මාසයේ දී රන් පවුම අවප්‍රමාණය කිරීම නිසාත්, නැව් සමාගම් සම්මේලනය විසින් අපනයන සහ ආනයන නැව්බඩු තොග සඳහා ගැල් කුලී අධිභාරයන් නැවත පැනවීම පිළිබඳව 1967 වාර්ෂික වාර්තාවේ සඳහන් වී තිබේ. වර්ෂය මුළුල්ලේ ම නොකඩවා අය කෙරුණු මෙකී අධිභාරයන් හි වෙනස්වීමක් 1968 වසරේ දී දක්නට නොවීය.[2]

### ආනයන සහ අපනයන නැව්බඩු

නැව් ටොන් වෙනස

| | 1967 | 1968 | නියම | % |
|---|---|---|---|---|
| 1 වැනි කාර්තුව ... ... | 8,43,299 | 7,58,681 | — 84,618 | —10.0 |
| 2 වැනි කාර්තුව ... ... | 7,20,255 | 6,98,433 | — 21,822 | — 3.0 |
| 3 වැනි කාර්තුව ... ... | 6,71,137 | 7,99,745 | +1,28,608 | +19.2 |
| 4 වැනි කාර්තුව ... ... | 6,99,801 | 8,17,888 | +1,18,087 | +16.9 |
| වර්ෂයේ ම ... ... | 29,34,492 | 30,74,747 | +1,40,255 | + 4.8 |

මූලය: වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය.

### වෙළෙඳ රටාව

1968 දී ප්‍රධාන මුදල් කලාප හා ප්‍රදේශ වෙත කරන ලද ලංකාවේ අපනයන වල වටිනාකම් ( ඉකුත් වර්ෂයේ එම වටිනාකම් හා සසඳන විට ) විවිධ ප්‍රමාණයේ වැඩිවීම් පෙන්නුම් කළේ ය. යුරෝපීය ආර්ථික හවුල හැරුනු විට, මෙම කලාප හා ප්‍රදේශ වෙතින් වූ ආනයනවල වටිනාකම වැඩි විය. යුරෝපීය ආර්ථික හවුල ලබාගත් ආනයන වටිනාකමෙහි පිරිහීමක් සටහන් වීය. ප්‍රධාන මූල්‍ය කලාප හා ප්‍රාදේශ අනුව වෙළෙඳ රටාව II (ඒ) 14 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

1. 1967 අනුරූපී කාර්තුව හා සැසැඳීමේ දී මෙම වසරේ එක් එක් කාර්තුව තුළදී කොළඹ වරාය මඟින් පටවන ලද හා බාන ලද ටොන් ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දක්වේ :—

2. මෙකී ආහාරයන්හි වැඩිවීම පිළිබඳ විස්තර සඳහා 1967 වාර්ෂික වාර්තාවේ 182 පිටුව බලන්න.

## II (ඒ) 14 වැනි සංඛ්‍යා සටහන

### වෙළඳ භාණ්ඩ සම්බන්ධව ලංකාණ්ඩුවේ ජාත්‍යන්තර වෙළඳාම

ප්‍රදේශ හා මුදල් කලාප වශයෙන්

රුපියල් දශ ලක්ෂ

| | මුළු අපනයන (අ) නැ. වි. ස. | | මුළු ආනයන මි. ර. ගැ. | | වෙළඳ ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | 1967 | 1968 | 1967 | 1968 | 1967 | 1968 |
| රන් පවුම් කලාපය ... ... | 795.3 | 863.9 | 615.8 | 761.2 | +179.5 | +102.7 |
| ඩොලර් කලාපය ... ... | 205.6 | 218.9 | 124.0 | 235.9 | + 81.6 | -17.0 |
| වෙනත් ... ... ... | 636.0 | 893.5 | 998.6 | 1,176.0 | —362.6 | -282.5 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ... | 750.8 | 813.7 | 623.3 | 788.7 | +127.5 | +24.9 |
| විදේශීය රටවල් (ආ) ... ... | 886.1 | 1,162.7 | 1,115.1 | 1,384.4 | —229.0 | -221.7 |
| යුරෝපීය ආර්ථික ප්‍රජාව (ඇ) ... | 139.9 | 195.3 | 269.4 | 259.9 | —129.5 | -64.6 |
| යුරෝපීය නිදහස් වෙළඳ සංගමය (ඈ) ... ... | 483.7 | 504.9 | 312.5 | 354.9 | +171.2 | +150.0 |
| ආ. ඇ. පෙ. ආ. කො. ප්‍රදේශ (ඉ) ... | 398.5 | 492.1 | 736.2 | 952.7 | —337.7 | -460.0 |

මූලය: ලංකා රේගු වාර්තා

(අ) වරායේදී නැව්, සිය පාරිභෝජනය සඳහා ලබාගන්නා භාණ්ඩ, බංකර යනාදිය ඇතුළත් නැත.

(ආ) 1965 සංඛ්‍යාවනට දකුණු අප්‍රිකානු සංගමය සමග කළ වෙළඳාම ඇතුළත්ය.

(ඇ) බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ලක්සැම්බර්ග් සහ නෙදර්ලන්තය.

(ඈ) ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය, නෝර්වේ, පෘතුගාලය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය සහ එක්සත් රාජධානිය.

(ඉ) ඇප්ගනිස්ථානය, ඕස්ට්‍රේලියාව, (1964 සිට) බෲනි, බුරුමය, කාම්බෝජය, ලංකාව, මහජන චීන සමූහාණ්ඩුව, තායිවාන්, මැලේසියාව (මලයාව, උතුරු බෝනියෝව සහ සරවක්), හොංකොං, ඉන්දියාව, ඉන්දුනීසියාව, අයිරානය, ජපානය, උතුරු කොරියාව, දකුණු කොරියාව, ලාඕසය, මොන්ගෝලියාව, නේපාලය, නවසීලන්තය, (1964 සිට) පකිස්ථානය, පිලිපයිනය, සිංගප්පූරුව, බටහිර සැමොවා, (1964 සිට) තායිලන්තය, උතුරු වියට්නාමය හා දකුණු වියට්නාමය.

ඉකුත් වර්ෂයේ වටිනාකමට වඩා රුපි. දශ ලක්ෂ 69 ක නැතහොත් සියයට 9 ක වැඩි වීමක් සටහන් කරමින්, 1968 වර්ෂය තුල රන් පවුම් කලාපය වෙත කරන ලද අපනයන වල වටිනාකම රුපි. දශ ලක්ෂ 864 ක් විය. එසේ වුවද, ලංකාවේ මුළු අපනයන වලින් කලාපයේ කොටස සියයට 42 ක් වීමෙන්, සියයට 5 කින් පිරිහුණි. රන් පවුම් කලාපය වෙතින් කරන ලද ආනයන රුපි. දශ ලක්ෂ 761 ක් වීමෙන් සීඝ්‍ර ලෙස — එනම් රු. දශ ලක්ෂ 145 කින් නැතහොත් සියයට 24 කින් — වැඩි විය. ලංකාවේ මුළු ආනයන වලින්, රන් පවුම් කලාපයේ කොටස සියයට 35 ක් වූ අතර, 1967 හා සසඳන විට, එහි වෙනසක් සිදු වී නොමැත. 1968 තුළදී කලාපය සමග භාණ්ඩ වෙළඳාමේ ශේෂයෙහි රු. දශ ලක්ෂ 103 ක අතිරික්තයක් සඳහන් විය. 1967 වර්ෂය තුළ දී සඳහන් වූ අතිරික්තය වන රු. දශ ලක්ෂ 179 හා මෙය සැසඳේ.

සමාලෝචනයට භාජන වන වර්ෂය තුලදී ඩොලර් කලාපය වෙත කරන ලද අපනයන, ඉකුත් වර්ෂයට අදල වන අපනයන වලට වඩා රු. දශ ලක්ෂ 13 ක, නැතහොත් සියයට 6 ක වැඩි වීමක් දක්වමින්, රු. දශ ලක්ෂ 219 ක් විය. අනෙක් අතට , කලාපය වෙතින් කරන ලද ආනයන රු. දශ ලක්ෂ 112 කින් නැතහොත් සියයට 90 1 කින් වඩා තියුණු ඉහළ යාමෙන් රු. දශ ලක්ෂ 216 ක් විය. 1967 වර්ෂය හා සසඳන විට මුළු අපනයන වලින් ඩොලර්

1. රුපි. දශ ලක්ෂ 236 ක් වූ මුළු ප්‍රමාණයෙන් ඩොලර් කලාපය වෙතින් කළ ආනයන වටිනාකමින් රුපි. දශ ලක්ෂ 137 ක් හෙවත් සියයට 58 ක් ද්‍රව්‍යාධාර ස්වරූපයෙන් යුක්තවිය.

කලාපයේ කොටස සියයට 1 ක පහල වැටීමක් දක්වමින්, සියයට 11 ක් වූ අතර, මුළු ආනයන වලින් එහි කොටස සියයට 4 කින් වැඩි වීමෙන් සියයට 11 ක් විය. ඉකුත් වර්ෂය වෙනුවෙන් සටහන් වී ඇති රු. දශ ලක්ෂ 82 ක අතිරික්තය හා තියුණු ලෙස ප්‍රති විරෝධී අන්දමින්, 1968 තුල ඩොලර් කලාපය සමග කරන ලද භාණ්ඩ වෙළඳාම් ශේෂයෙහි රු. දශ ලක්ෂ 17 ක හිඟයක් සටහන් විය.

1968 වර්ෂය තුල පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වෙත කරන ලද අපනයන වල වටිනාකම, රු. දශ ලක්ෂ 814 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ අපනයන වලට වඩා රු. දශ ලක්ෂ 63 කින් නැතහොත් සියයට 8 කින් වැඩි වීමකි. පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් වෙතින් කරන ලද ආනයන රු. දශ ලක්ෂ 789 ක් වූයෙන්, රු. දශ ලක්ෂ 166 ක නැතහොත් සියයට 27 ක කැපී පෙනෙන වැඩිවීමක් දක් විය. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළදී මුළු අපනයන වලින් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල කොටස සියයට 4 කින් පහළ වැටීමෙන් සියයට 40 ක් වූ අතර, මුළු ආනයන වලින් එම රටවල කොටස සියයට 36 ක් වූයෙන්, 1967 වර්ෂය හා සසඳන විට එහි වෙනසක් සිදු නොවීය. පොදු රාජ්‍ය මණ්ඩලය රටවල් සමග වෙළඳාමෙන් ලංකාවේ අතිරික්තය රු. දශ ලක්ෂ 25 ක් වූ අතර, එය 1967 දී සඳහන් වූ අතිරික්තයට වඩා රු. දශ ලක්ෂ 103 කින් අඩු වීමකි.

1968 තුළදී යුරෝපීය ආර්ථික සමාජය වෙත යවන ලද අපනයන, ඉකුත් වර්ෂය තුළදී කරන ලද අපනයන වලට වඩා රු. දශ ලක්ෂ 55 ක නැතහොත් සියයට 39 ක වැඩිවීමක් සඳහන් කරමින්, රු. දශ ලක්ෂ 195 ක් වූ අතර, සමාජය වෙතින් ලබාගත් ආනයන රු. දශ ලක්ෂ 9 කින් නැත හොත් සියයට 3 කින් අඩු වී රු. දශ ලක්ෂ 260 ක් විය. මුළු අපනයන වලින් සමාජයේ කොටස, සියයට 2 ක වැඩිවීමක් දක්වමින් සියයට 10 ක් වූ අතර, මුළු ආනයන වලින් එහි කොටස සියයට 3 ක පහළ වැටීමක් දක්වමින් සියයට 12 ක් විය. 1968 තුල යුරෝපීය ආර්ථික සමාජය සමග කල වෙළඳාමේ ශේෂයෙහි රු. දශ ලක්ෂ 65 ක හිඟයක් සඳහන් විය. 1967 හිඟය හා සසඳන විට, මෙය වර්ධනයක් සේ සැලකිය හැක.

1968 තුළදී යුරෝපීය නිදහස් වෙළෙඳ සංගමයේ රටවල් වෙත කරන ලද අපනයන, ඉකුත් වර්ෂය තුළදී අපනයන වලට වඩා රු. දශ ලක්ෂ 21 ක නැතහොත් සියයට 4 ක වැඩිවීමක් දක්වමින්, රු. දශ ලක්ෂ 505 ක් වූ අතර, මෙම රටවල් වෙතින් ලබාගත් ආනයන රු. දශ ලක්ෂ 42 කින් නැතහොත් සියයට 13 කින් පහල වැටී, රු. දශ ලක්ෂ 355 ක් විය. මුළු අපනයන වලින් හා මුළු ආනයන වලින් සංගමයේ කොටස පිළිවෙලින් සියයට 25 ක් හා සියයට 16 ක් විය. මේ වූ කලී පිළිවෙලින් සියයට 4 ක හා සියයට 2 ක පහල වැටීමකි. 1967 තුළදී රු. දශ ලක්ෂ 171 ක් වූ සංගමයේ රටවල් සමග භාණ්ඩ වෙළෙඳාමේ ශේෂය සමාලෝචනයට භාජනය වන වර්ෂයේ දී රු. දශ ලක්ෂ 150 දක්වා අඩු විය.

ආසියානු හා ඈත පෙරදිග ආර්ථික කොමිසමට අයත් ( ඉකැෆේ ) කලාපීය රටවල් වෙත කරන ලද අපනයන රු. දශ ලක්ෂ 492 ක් වූ අතර, රු. දශ ලක්ෂ 93 ක නැතහොත් සියයට 23 ක ප්‍රසාරණයක් එයින් දක්වීනි. මෙම කලාපය වෙතින් ලබාගත් ආනයන ද සමාලෝචනයට භාජන වන වර්ෂය තුළදී රු. දශ ලක්ෂ 217 කින් නැතහොත් සියයට 29 කින් වැඩි වී, රු. දශ ලක්ෂ 953 ක් විය. මුළු අපනයන වලින් කලාපයේ කොටස සියයට 24 ක් වූයෙන්, ඉකුත් වර්ෂයේ කොටස හා සසඳන විට වෙනසක් සිදු වී නොමැති අතර, මුළු ආනයන වලින් කලාපයේ කොටස සියයට 2 කින් වැඩි වී සියයට 44 ක් විය. 1967 තුලදී රු. දශ ලක්ෂ 337 ක හිඟයක් දක් වූ කලාපය සමග කළ වෙළඳාමෙහි ශේෂය 1968 තුළදී රු. දශ ලක්ෂ 461 ක් වූයෙන් රු. දශ ලක්ෂ 124 කින් තවදුරටත් පිරිහුණි.

### චීන මහජන සමූහාණ්ඩුව සමග වෙළෙඳාම

ඉකුත් වර්ෂයේ පිරිවැටුම හා සසඳන විට, 1968 මහජන චීන සමූහාණ්ඩුව හා ලංකාව අතර, වෙළෙඳාමේ මුළු පිරිවැටුමෙහි කැපී පෙනෙන වැඩිවීමක් දක්විණි. සමාලෝචනයට භාජන වන වර්ෂය තුළ දී අපනයනවල වටිනාකම 1967 වටිනාකමට වඩා රුපියල දශ ලක්ෂ 42 කින් නැතහොත් සියයට 27 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 195 ක් වූ අතර, ආනයනවල වටිනාකම 1968 තුළ දී කැපී පෙනෙන ලෙස, එනම්, රුපියල් දශ ලක්ෂ 60 කින් නැතහොත් සියයට 32 කින් වැඩි වූයෙන්, රුපියල් දශ ලක්ෂ 245 ක් විය. 1967 හිඟය රුපියල් දශ ලක්ෂ 32 ක් වූ අතර, 1968 දී රුපි. දස ලක්ෂ 50ක හිගයක් පෙන්විය.

චීන මහජන සමූහාණ්ඩුව වෙත අපනයන කරන ලද ප්‍රධාන භාණ්ඩය වූයේ රබර් ය. අප නයනවල වටිනාකමෙහි වැඩිවීමට බොහෝසේ හේතුවූයේ රබර්වලින් ලද ආදයම් වැඩිවීමය.

1968 තුළ රබර් අපනයනවල වටිනාකම, ඉකුත් වර්ෂයේ වටිනාකම ට වඩා රුපියල් දශ ලක්ෂ 39.9 කින් නැතහොත් සියයට 29 කින් වැඩි වී, රුපියල් දශ ලක්ෂ 179.7ක් විය. අපනයන කොට ඇති රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 182.7 ( මෙට්‍රික් ටොන් 82,871 ) ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අපනයන කොට ඇති ප්‍රමාණය වන රාත්තල් දශ ලක්ෂ 130.9 ( මෙට්‍රික් ටොන් 59,376 ) හා සැසැඳේ. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී අපනයනය කොට ඇති පොල් තෙල් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1.2 කින් නැතහොත් සියයට 9 කින් පහළ වැටීමෙන් රුපියල් දශ ලක්ෂ 14.9ක් විය.

ලංකාව විසින් චීන මහජන සමූහාණ්ඩුවෙන් ආනයන කරන ලද ප්‍රධාන භාණ්ඩය වූයේ සහල් ය. රේගු වාර්තාවල සඳහන් වී ඇති අයුරු, 1968 තුළ ආනයන කරන ලද සහල්වල වටිනාකම, ඉකුත් වර්ෂයේ වටිනාකමට වඩා රුපියල් දශ ලක්ෂ 75.8 ක නැතහොත්, සියයට 71 ක වැඩිවීමක් දක්වමින් රුපියල් දශ ලක්ෂ 181 .9 ක් විය

1967 නොවැම්බර් මස 6 වැනි දින වෙළෙඳ සහ ගෙවීම් ගිවිසුම යටතේ චීන මහජන සමූහාණ්ඩුව හා සමග 1968 වර්ෂය වෙනුවෙන් අත්සන් තබන ලද නීත්‍යානුකූල ලියකියවිලි අනුව සහල් මෙට්‍රික් ටොන් 2,00,000 ආනයනය කිරීමටත්, ලංකාවෙන් රබර් මෙට්‍රික් ටොන් 75,000 ක් අපනයනය කිරීමටත් ඉඩ සැලසුනි.

මෙම රටින් ආනයනය කරනු ලබන තවත් ප්‍රධාන භාණ්ඩයක් වන රෙදිපිළිවල ආනයන ප්‍රමාණය 1968 දී රුපි. දස ලක්ෂ 4.1 කින් හෙවත් සියයට 18 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 26.7 ක් විය. වියලි මිරිස් ආනයනයෙහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 12.0 ක් විය. මේ වූකලී 19671 වර්ෂයේ දී ආනයනය කරන ලද ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 5.4 කින් නැතහොත් සියයට 82 කින් වැඩිවීමකි. අනෙක් ආනයනවලට සුදු සීනි ( රුපියල් දශ ලක්ෂ 5.0 ), මුං ඇට ( රුපියල් දශ ලක්ෂ 3.0 ), රෙදිවිවීම සඳහා ගනු ලබන නූල් සහ වෙනත් නූල් ( රුපියල් දශ ලක්ෂ 1.7 ) හා සුදු ලූණු ( රුපියල් දශ ලක්ෂ 1.2 ) ඇතුළත් විය.

**සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය සහ නැගෙනහිර යුරෝපය සමග කළ වෙළෙඳාම**

1967 අනුරූප කාලච්ඡේදය හා සසඳන විට 1968 දී සෝ. ස. ස. සං. සහ නැගෙනහිර යුරෝපීය රටවල් සමග ලංකාව පවත්වා ගෙන යනු ලබන වෙළෙඳාමෙහි සැලකිය යුතු ප්‍රසාරණයක් දක්නට තිබුණු අතර, අපනයන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 58.6 කින් නැතහොත් සියයට 56 කින් වැඩි වූයෙන්, රුපියල් දශ ලක්ෂ 162.6 ක් විය. එම කාලච්ඡේදය තුළ දී කලාපය වෙතින් ලබාගත් අපනයන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15.6 කින් නැතහොත් සියයට 10 කින්, රුපියල් දශ ලක්ෂ 179.7 දක්වා වැඩි විය. කලාපය සමගකල වෙළෙඳාමේ ශේෂයෙහි රුපියල් දශ ලක්ෂ 17.1 ක හිඟයක් දක්විණි. එහෙත්, 1567 දී දක්වුනු හිඟය වන රුපියල් දශ ලක්ෂ 60.1 හා සසඳන විට, එය වර්ධනයක් ලෙස සැලකිය හැකිය. එම කලාපය සමග ලංකාවේ වෙළෙඳාමෙහි වටිනාකම මුළු විදේශීය වෙළෙඳාමෙන් සියයට 8 ක් විය.

ඉකුත් වර්ෂයන්හි දී කලාපය තුළ ලංකාවේ ප්‍රධාන ගනුදෙනුකාරයෙකු වූ සෝ. ස. ස. සං. 1968 දී රුපියල් දශ ලක්ෂ 94.3 ක් නැතහොත් කලාපය වෙත කරන ලද මුළු අපනයන වලින් සියයට 58 ක් ලබා ගැනීමෙන් එම තත්වය තවදුරටත් වර්ධනය විය. 1968 දී සෝ. ස. ස. සං වෙත කරන ලද අපනයන 1967 දී කළ අපනයනවලට වඩා රුපියල් දශ ලක්ෂ 37.2 කින් නැතහොත්, සියයට 65 කින් ප්‍රසාරණය විය. සෝ. ස. ස. සං. වෙත කරන ලද අපනයනවල ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, අපනයනය කරනලද පොල්තෙල් වල වටිනාකම 1967 දී රුපියල් දශලක්ෂ 14.8 සිට රුපියල් දශ ලක්ෂ 43.2 දක්වා වැඩිවීමය. සෝ. ස. ස. සං වෙත අපනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩය පොල් තෙල් වූ අතර, ඉකුත් වර්ෂයන්හි දී ප්‍රධාන අපනයන භාණ්ඩය වූයේ රබර්ය. සෝ. ස. ස. සං වෙත අපනයනය කරන ලද පොල් තෙල් ප්‍රමාණයෙහි සැලකිය යුතු වැඩිවීමක් දක්විණි. 1967 දී හොණ්ඩර 209 දහසේ සිට 1968 දී හොණ්ඩර 406 දහස දක්වා සිදු වූ මෙය සියයට 94 ක වැඩිවීමකි. 1968 දී රබර් අපනයන, රුපියල් දශ ලක්ෂ 20.5 දක්වා රුපියල් දශ ලක්ෂ 2.9 කින් පිරිහීමට පත් විය. සමාලෝචනයට භාජන වන වර්ෂය තුළ දී තේ අපනයන රුපියල් දශ ලක්ෂ 14.1 දක්වා රුපියල් දශ ලක්ෂ 0.1 කින් සුළු වශයෙන් පිරිහිණි. අපනයනයකළ කොප්පරා වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 8.1 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ වටිනා කමට වඩා රුපියල් දශ ලක්ෂ 5.1 කින් වැඩි වීමකි.

1. 1968 දී ආනයනය කල වියලි මිරිස් පරිමාව හොණ්ඩර 351.8 දහසක් වූ අතර මෙය 1967 දී හොණ්ඩර 290.2 ක් විය; මෙය වනාහි දේශීය නිෂ්පාදනය සියයට 68 කින් වැඩිව තිබිය දීය.

පෝලන්ත මහජන සමූහාණ්ඩුව වෙත කරන ලද අපනයනවල වටිනාකම රුපි. දශ ලක්ෂ 14.9 කින් නැතහොත් සියයට 119 කින් සැලකිය යුතු ලෙස වැඩිවී, රුපි. දශ ලක්ෂ 27.4 ක් නැතහොත් කලාපය වෙත කරන ලද මුළු අපනයනවලින් සියයට 17 ක් විය. ඉකුත් වර්ෂයන් හිදී මෙන්ම ප්‍රධාන අපනයන භාණ්ඩය රබර්වූ අතර එහි වටිනාකම රුපි. දශ ලක්ෂ 11.3 ක් වූයේ 1967 දීට වඩා රුපි. දශ ලක්ෂ 4.5 ක නැතහොත් සියයට 66 ක වැඩිවීමක් දක්වමිනි. අපනයන කරන ලද කොප්පරා, පොල් තෙල්, සහ තේවල වටිනාකම්, පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 1.8 කින්, දශ ලක්ෂ 3.1 කින්, හා රුපි. දශ ලක්ෂ 5.2 කින් වැඩි වූයෙන්, ඒවායේ වටිනාකම් පිළිවෙලින් රුපි. දශ ලක්ෂ 2.6 ක්, රුපි. දශ ලක්ෂ 4.4 ක් හා රුපි. දශ ලක්ෂ 8.3ක් විය.

රුමේනියානු මහජන සමූහාණ්ඩුව වෙත කරන ලද අපනයනවල වටිනාකම 1967 දීට වඩා රුපි. දශ ලක්ෂ 4.8 කින් නැතහොත් සියයට 26 කින් අඩු වී, රුපි. දශ ලක්ෂ 13.9 ක් නැතහොත් කලාපය වෙත කරන ලද මුළු අපනයනවලින් සියයට 9 ක් විය. රුමේනියාව වෙත අපනයන කරන ලද රබර්වල වටිනාකම රුපි. දශ ලක්ෂ 5.8 කින් නැතහොත් සියයට 36කින් අඩුවූයෙන් රු. දශ ලක්ෂ 10 .1 ක් වීය.

ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් සමූහාණ්ඩුව වෙත කරන ලද අපනයනවල වටිනාකම රුපි. දශ ලක්ෂ 4.2 කින් නැතහොත් සියයට 53 කින් රුපි. දශ ලක්ෂ 12.1 දක්වා වැඩිවූ අතර,එය, කලාපය වෙත කරන ලද, අපනයනවලින් සියයට 7 ක් විය. කපාපු පොල් අපනයන රුපි. දශ ලක්ෂ 6.0 දක්වා රුපි. දශ ලක්ෂ 5.1 කින් වැඩි වූ අතර අපනයන කළ පොල්තෙල්වල වටිනාකම ඉකුත් වර්ෂයේදීට වඩා රුපි. දශ ලක්ෂ 0.8 ක පහළ වැටීමක් සඳහන් කරමින්, රුපි. දශ ලක්ෂ 6.1 ක් විය. 1968 දී ලංකාවෙන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව වෙත අපනයන කරන ලද්දේ කපාපු පොල් සහ පොල්තෙල් පමණි. චෙකොස්ලොවේකියානු සමූහාණ්ඩුව වෙත කරන ලද අපනයනවල වටිනාකම රුපි. දශ ලක්ෂ 1.4 කින් හෙවත් සියයට 56 කින්, රුපි. දශ ලක්ෂ 3.8 දක්වා වැඩිවිණි. ප්‍රධාන අපනයන භාණ්ඩය වූ කපාපු පොල්වල වටිනාකම රුපි. දශ ලක්ෂ 2.1 ක් වූ අතර, එය ලංකාවෙන් එම රට වෙත කරන ලද මුළු අපනයන ප්‍රමාණයෙන් සියයට 54 ක් වීය. යුගෝස්ලේවියානු සමාජවාදී ෆෙඩරල් සමූහාණ්ඩුව වෙත කරන ලද අපනයනවල වටිනාකම 1967 දීට වඩා රුපියල් දශ ලක්ෂ 8.6 දක්වා, රුපියල් දශ ලක්ෂ 5.4 කින් වැඩි වීය. යුගෝස්ලේවියාව වෙත අපනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වූයේ පොල් තෙල් (රුපි. දශ ලක්ෂ 2.0 ) සහ රබර් ( රුපි. දශ ලක්ෂ 2.0 ) ය. හන්ගේරියානු මහජන සමූහාණ්ඩුව වෙත කරන ලද අපනයන, රුපි. දශ ලක්ෂ 2.4 දක්වා 1967 දීට වඩා රුපි. දශ ලක්ෂ 1.4 කින්, වැඩි වීය. රුපි. දශ ලක්ෂ 1.1 ක් වූ පොල් අපනයනවල වටිනාකම එම රට වෙත කරන ලද මුළු අපනයන ප්‍රමාණයෙන් සියයට 46 ක් වීය. 1967 දී රුපියල් දශ ලක්ෂ 1.1 ක් වූ බල්ගේරියානුමහජන සමූහාණ්ඩුව වෙත කරනලද අපනයන වල වටිනාකම 1968 දී රුපියල් දශලක්ෂ 1 ටත් වඩා අඩුවීය. සමාලෝචනයට භාජනවන වර්ෂය තුළ දී ලංකාවෙන් අපනයනය කරන ලද මුළු කොකෝවා ප්‍රමාණයෙන් සියයට 78 ක් ම ලබා ගෙන ඇත්තේ මෙම කලාපය විසින් වූ අතර, සෝ. ස. ස. සං. විසින් ලබාගත් ප්‍රමාණය මුළු අපනයන වලින් සියයට 59 ක් වීය. එමෙන් ම 1968 දී අපනයනය කරන ලද මුළු කොප්පරා ප්‍රමාණයෙන් ද සියයට 24 ක් ම මෙම කලාපය විසින් ලබා ගෙන ඇත.

කලාපය තුළ ප්‍රධාන ආනයන සැපැයුම්කරුවන් වූ සෝ. ස. ස. සං., පෝලන්තය සහ රුමේනියාව විසින් 1968 දී සපයන ලද ආනයනවල වටිනාකම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 96.9 ක්, රුපියල් දශ ලක්ෂ 34.0 ක් සහ රුපියල් දශ ලක්ෂ 28.3 ක් වූ අතර, එම සංඛ්‍යා, කලාපය වෙතින් ලබාගත් ආනයන ප්‍රමාණයේ වටිනාකමින් පිළිවෙළින් සියයට 54 ක්, 19 ක් හා 16 ක් වීය. කලාපය වෙතින් ලබාගත් ආනයනවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 179.7 දක්වා රුපියල් දශ ලක්ෂ 15.6 කින් නැතහොත් සියයට 10 කින් වැඩි වීය. සෝ. ස. ස. සං. වෙතින් ආනයනය කරනු ලැබූ ප්‍රධාන භාණ්ඩය සීනි වූ අතර, එහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 34.1 දක්වා 1967 දීට වඩා රුපියල් දශ ලක්ෂ 3.1 කින් නැතහොත් සියයට 8 කින් අඩු වීය. සෝ ස. ස. සං. වෙතින් කැරුනු ආනයන වල වටිනාකම වැඩි වූ වැදගත් භාණ්ඩ වූයේ රුපියල් දශ ලක්ෂ 8.6 දක්වා රුපියල් දශ ලක්ෂ 3.3 කින් වැඩි වූ තේ පෙට්ටි සහ රුපියල් දශ ලක්ෂ 6.4 දක්වා රුපියල් දශ ලක්ෂ 3.3 කින් වැඩි වූ සිමෙන්ති වීය. වටිනාකමින් රුපියල් දශ ලක්ෂ 36.4 ක් වූ ඛනිජ තෙල්, රුපියල් දශ ලක්ෂ 3.3 ක් වූ රෙදිපිළි, සහ රුපියල් දශ ලක්ෂ 2.4 ක් වූ යකඩ සහ වානේවල ආනයන පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 10.7 කින්, රුපියල් දශ ලක්ෂ 0.8 කින්, සහ රුපියල් දශ ලක්ෂ 4.6 කින් පිරිහිණ. පෝලන්ත මහජන සමූහාණ්ඩුව වෙතින් ආනයනය කළ ප්‍රධාන භාණ්ඩය සීනි වූ අතර, එහි වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 21.4 එම රට වෙතින් ලංකාව ලබාගත් මුළු ආනයන ප්‍රමාණයෙන් සියයට 63 ක් වීය. පෝලන්ත

මහජන සමූහාණ්ඩුව වෙතින් ආනයනය කළ රෙදිපිළිවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 7.2 දක්වා, රුපියල් දශ ලක්ෂ 5.5 කින් වැඩි විය. බල්ගේරියානු මහජන සමූහාණ්ඩුව වෙතින් කරන ලද ආනයන 1967 දීට වඩා රුපියල් දශ ලක්ෂ 1.4 ක වැඩිවීමක් දක්වමින් රුපියල් දශ ලක්ෂ 5.2 ක් විය. සීනි ආනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 5.1 ක් විය. චෙකෝස් ලෝවැකියානු සමූහාණ්ඩුව වෙතින් කරන ලද ආනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 7.0 ක් විය. එය 1967 දීට වඩා රුපියල් දශලක්ෂ 2.4 කින් පිරිහීමකි. රුපියල් දශ ලක්ෂ 3.6 දක්වා රුපියල් දශ ලක්ෂ 2.5 කින් වැඩි වූ රෙදිපිළි ආනයන හැර, චෙකෝස්ලෝවැකියාව වෙතින් ගෙන් වූ අනෙක් ආනයනවල පිරිහීම් සඳහන් විය. හංගේරියානු මහජන සමූහාණ්ඩුව වෙතින්ගෙනවූ ආනයන රුපියල් දශ ලක්ෂ 3.5 දක්වා රුපියල් දශ ලක්ෂ 0.1 කින් නැතහොත් සියයට 3 කින් ආන්තික ලෙස වැඩි විය. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව වෙතින් වූ ආනයන රුපියල් දශ ලක්ෂ 1.4 දක්වා රුපියල් දශ ලක්ෂ 3.8 කින් නැතහොත් සියයට 73 කින් තියුණු ලෙස පිරිහිණි. යුගෝස්ලේවියානු සමාජවාදී ෆෙඩරල් සමූහාණ්ඩුව වෙතින් වූ ආනයන රුපියල් දශ ලක්ෂ 4.4 කින් නැතහොත් සියයට 56 කින් පිරිහිණි.

මුළු කලාපය වෙතින් ආනයන කරන ලද සීනිවල වටිනාකම 1968 දී රුපියල් දශ ලක්ෂ 60.6 ක් වූ අතර, එය මෙරට වෙත ආනයනය කරන ලද මුළු සීනි ප්‍රමාණයෙන් සියයට 62 ක් වීම සඳහන් කළ යුතු ය. එසේ ම, 1968 දී අනායන කරන ලද මුළු ඛනිජ තෙල් නිෂ්පාදන වලින් සියයට 32 ක් ද, ආනයන කරන ලද මුළු සිමෙන්ති ප්‍රමාණයෙන් සියයට 43 ක් ද, ආනයන කරන ලද තේ පෙට්ටිවලින් සියයට 88 ක් ද මෙම කලාපය විසින් සපයා ඇත.

**ද්වි — පාර්ශ්වීය නිෂ්කාෂණ ගිණුම්**

II (ඒ) 15 සංඛ්‍යා සටහන, මහජන චීන සමූහාණ්ඩුව, සෝ. ස. ස. සංගමය, සහ සමහර නැගෙනහිර යුරෝපීය සහ මැද පෙරදිග රටවල් සමග ලංකාව ඇති කර ගත් ගෙවීම් ගිවිසුම් අනුව පවත්වා ගෙන යනු ලබන ද්වි — පාර්ශ්වීය ගිණුම්වල ඒ ඒ කාර්තු අවසානයේ දී වූ ශුද්ධ සමස්ත තත්වය දක්වෙයි. ඉකුත් වසරේ තත්වය අනුව සසඳන කල ලංකාව විසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් රුපියල් දශ ලක්ෂ 78.8 කින් වැඩි වී ඇති බැව් 1968 සඳහා වූ වර්ෂාවසාන තත්වයෙන් හෙළි වෙයි.

**II (ඒ) 15 වැනි සංඛ්‍යා සටහන**

**ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම්**

**1966 — 1968 නිෂ්කාශන ගිණුම්වල ශුද්ධ සමස්තය කාර්තු වශයෙන්**

(රුපියල් දශ ලක්ෂ)

| අවසානයට ගිණුම් තතු (ශුද්ධ) | චීනය, සෝ. ස. ස. සං සහ වෙනත් නැගෙනහිර යුරෝපීය රටවල්* | | මැද පෙරදිග රටවල්** | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | බැර | හර | බැර | හර |
| 1966 මාර්තු | — | 49.3 | — | 13.2 | — | 62.5 |
| ජූනි ... | — | 6.3 | — | 3.3 | — | 9.6 |
| සැප්තැම්බර් | — | 27.7 | — | 1.8 | — | 29.5 |
| දෙසැම්බර් | 8.1 | — | — | 4.1 | 4.0 | — |
| 1967 මාර්තු ... | 3.3 | — | — | 2.4 | 0.9 | — |
| ජූනි ... | — | 2.1 | — | 2.4 | — | 4.5 |
| සැප්තැම්බර් | 42.7 | — | — | 3.8 | 38.9 | — |
| දෙසැම්බර් | 104.3 | — | — | 2.4 | 101.9 | — |
| 1968 මාර්තු ... | 146.8 | — | 0.9 | — | 147.7 | — |
| ජූනි ... | 132.2 | — | — | 2.2 | 130.0 | — |
| සැප්තැම්බර් | 163.9 | — | — | 5.9 | 158.0 | — |
| දෙසැම්බර් | 183.1 | — | — | 2.4 | 180.7 | — |

*බල්ගේරියාව, චෙකෝස්ලෝවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හන්ගේරියාව, පෝලන්තය රුමේනියාව, යුගෝස්ලේවියාව ( 1965 මාර්තු සිට ) සහ ප්‍රජාතන්ත්‍රවාදී කොරියානු මහජන සමූහාණ්ඩුව ( 1965 මාර්තු සිට ).

** එක්සත් අරාබි සමූහාණ්ඩුව, ( 1966 නොවැම්බර් දක්වා ) සහ සිරියාව.

සටහන : බැර = ලංකාවෙන් අය විය යුතු
හර = ලංකාවට අය විය යුතු

**වෙළෙඳ ප්‍රතිපත්තියෙහි හැඩගැස්ම**

**අපනයන පාලනය**

(අ) ඇමෙරිකා එක්සත් ජනපදය හා කැනඩාව වෙත නැව්ගත කිරීම සඳහා වෙන්දේසියෙන් පිට පෞද්ගලික තේ අලෙවි කිරීම් වෙනුවෙන් වූ කාල සීමාව 1968 ජනවාරි මාසයේ සිට දීර්ඝ කරන ලදී. ( ලංකාණ්ඩුවේ ගැසට් පත්‍ර අංක : 14,873/1, 14,791/2, 14,799/2, 14,813/5, සහ 14,828/1 ).

(ආ) 1968 ජනවාරි මස 20 වැනි දින සිට සමුපකාර සමිති සමාගම්වලට පමණක් සීමා කොට තිබූ සිප්පි කටු අපනයනය කිරීම ඉවත් කොට පෞද්ගලික අපනයනකරුවන් හට ද ඒවා අපනයනය කිරීමට අවසර දෙන ලදී. ( ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදන අංක : 14,785/3 ).

(ඇ) 1968 ජූලි මස 15 දින පහත සඳහන් භාණ්ඩයන් වාණිජ පදනමක් මත ලංකාවෙන් අපනයනය කිරීම තහනම් කරන ලදී. ( ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදන අංක: 14,810/4:

1. වන සතුන් හා ඔවුන් ගේ කොටස්
2. යකඩ හා යකඩ නොවන ලෝහ සුන්බුන්, ලෝහ කුඩු, අළු සහ මණ්ඩි. සමහර පෙරස් නොවන ලෝහ ද්‍රව්‍යයන් ගේ සුන්බුන් අපනයනය කිරීමේ අවසර පත් ලබාගත හැකි වනුයේ කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්මික සංවර්ධන අධ්‍යක්ෂ වරයා විසින් නිර්දේශ කළහොත් පමණි.
3. ඉවත දමන කඩදාසි
4. මී ඉටි
5. පොල් පුන්නක්කු
6. කෝපි
7. හිස්බෝතල
8. හිස් ගෝනි මලු; කෙසේ වුවද, ආනයන කළ රසායණික පොහොර සහ සත්වාහාර බහාලූ ගෝනි මුලු, අවසරපත් ලබා ගැනීමෙන් පසු අපනයනය කළ හැකි වනු ඇත.
9. තල ඇට, ඉඹුල් පුළුන් ඇට සහ කපු පුළුන් ඇට
10. සහල්
11. පාවිච්චි කරන ලද ටයර් සහ ටියුබ්
12. කළුවර ලී
13. ඉබි කටු.

(ඇ) II. පහත සඳහන් භාණ්ඩයන් අපනයන පාලනය යටතේ පවතින අතර, සෑම භාණ්ඩයක් සඳහා ම අපනයන බලපත්‍ර සඳහා අදාළ තොරතුරු ඒ ඒ භාණ්ඩයට ඉදිරියෙන් සඳහන් කොට ඇත.

දේශීය වශයෙන් නිපදවන ලද හෝ දේශීය වශයෙන් සකස් කරන ලද වෙනත් සියළුම වර්ගයේ භාණ්ඩයන් අපනයන බලපත්‍ර රහිතව නිදහසේ අපනයනය කළ හැකිය.

| භාණ්ඩ | අවසර පත්‍ර හෝ නිර්දේශ කිරීම හෝ වෙනත් නියමකිරීම වෙතින් | බලපත්‍ර නිකුත් කිරීම |
|---|---|---|
| 1. තේ | — | තේ අපනයන කොමසාරිස් |
| 2. ඕනෑම තේ ගසක ඇට, මුල්, අංකුර හෝ රිකිලි | — | තේ පාලක |
| 3. කොප්පරා, කපාපු පොල් සහ පොල් තෙල් | — | ලංකා පොල් මණ්ඩලය |
| 4. රබර් (ෂීට් රබර් පමණක්) | — | වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස් |
| 5. රබර් : ඕනෑම රබර් ගසක ඇට, මුල් අංකුර හෝ රිකිලි | — | රබර් පාලක |
| 6. පැපොල් කිරි | රජයේ රස පරීක්ෂකගෙන් ගුණය පිළිබඳ සහතික පතක්. | ආනයන හා අපනයන පාලක |
| 7. පොල් කොහු කෙඳි | කලින් කල, නිර්දේශ කෙරෙන විශේෂ කොන්දේසිවලට යටත්ව | — එම — |
| 8. මැණික් හා වටිනා ගල් වර්ග | කපන ලද සහ ඔප මට්ටම කරන ලද පමණයි. | — එම — |
| 9. බීජ පොල් | කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් නිර්දේශයක් | — එම — |
| 10. ඕකිඩ් මල් — උද :- වෙසක්, අනුරාධපුර සහ ප්‍රිම්රෝස් | වනසත්ව දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ නිර්දේශයක් | — එම — |
| 11. බටහිර ඖෂධ හා භෛෂජ්ජික ද්‍රව්‍ය | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ නිර්දේශයක් | — එම — |
| 12. බුරුත ලී | වන රක්ෂක තැනගේ නිර්දේශයක් | — එම — |
| 13. පෞරාණික භාණ්ඩ | පුරාවිද්‍යා කොමසාරිස් ගේ නිර්දේශයක් | — එම — |
| 14. ඛණිජ ද්‍රව්‍ය (මිනිරන් සහ මාඩිකා හැර වෙනත් ) | භූ විද්‍යාත්මක සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ නිර්දේශයක් | — එම — |
| 15. මුහුදු බෙල්ලෝ | ධීවර අධ්‍යක්ෂ තැනගේ නිර්දේශයක් | — එම — |
| 16. හක් | — එම — | — එම — |
| 17. ඇඹර් | කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්මික සංවර්ධන අධ්‍යක්ෂගේ නිර්දේශය | — එම — |
| 18. පදම් නොකළ හම් (මී හරක්, එළ හරක්, එළු සහ බැටළු) | — එම — | — එම — |
| 19. බෙහෙත් කොළ වර්ග | ආයුර්වේද කොමසාරිස් ගේ නිර්දේශය | — එම — |

## ආනයන පාලනය

1968 වර්ෂයේ දී ආනයන පාලන බලපත්‍ර පිළිවෙතෙහි ප්‍රධාන වෙනස්කමක් දකින්නට ලැබුනේ ය. යොදා ගන්නා ලද විධිවිධාන සමාලෝචනයට භාජනය කරන වර්ෂයට ඉහතින් වර්ෂවල දී ඇති කරන ලද ආනයන සීමා කිරීම, ලිහිල් කිරීම සඳහා විය. 1968 මැයි මස 6 වැනි දින, විදේශ විනිමය හිමිකම් සහතික පත් වැඩ පිළිවෙල පිහිටුවීමත් සමගම, කලින් පැවති ආනයන පාලන බලපත්‍ර පිළිවෙත අවසන් වූ අතර, අළුත් ආනයන පාලන විධිවිධානයන් ක්‍රියාත්මක විය. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ආනයන පාලන දැන්වීම අංක: 2/68 යනුවෙන් පළ කරන ලද අළුත් ආනයන ක්‍රියා පිළිවෙත යටතේ ආනයන ද්‍රව්‍යයන් 'අ' වර්ගය සහ 'ආ' වර්ගය යනුවෙන් කොටස් කරනු ලැබීය. විදේශීය විනිමය සහතිකපත් අනවශ්‍යවූ ආනයන බලපත්‍ර අනුව කොටස් කරනු ලැබීය. විදේශ විනිමය මුදා හරිනු ලැබූ ආනයනයන් 'අ' ගණයේ ආයතනයන් ලෙස හැඳින්වේ. ආනයනය සඳහා විදේශ විනිමය ලබා ගැනීමට ආනයන බලපත්‍රයක් සමග විදේශ විනිමය හිමිකම් සහතික පත් ඉදිරිපත් කළ යුතු ද්‍රව්‍යයන් 'ආ' වර්ගයේ ආනයනයන් වශයෙන් සඳහන් කරනු ලැබේ.

### ''අ'' වර්ගයේ ආනයනයන්

(1) වෙළෙඳ අංශය විසින් ආනයනය කළ හැකි ''අ'' වර්ගයට අයත් වන භාණ්ඩයන් අංක: 2/68 දරන ආනයන පාලන නිවේදනයෙහි 1 වැනි ලේඛනයෙහි දක්වා ඇත. ( ලංකාණ්ඩුවෙහි අති විශේෂ ගැසට් පත්‍රය අංක: 14,800/3 සහ අනතුරුව සංශෝධිත අයුරු )

(2) ලියාපදිංචි කරන ලද ආනයනිකයන්ට සලාක ප්‍රමාණයන් ද සහිතව ආනයන බලපත්‍ර ලබා දෙනු ලැබේ. ( ආනයනිකයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන්, 1968 මැයි මස 15 වැනි දින අංක : 4/68 දරන ආනයන පාලන නිවේදනය කරුණාකර බලන්න ).

(3) ඕනෑම භාණ්ඩයක හෝ පංතියක කර්මාන්ත සඳහා 'අ' වර්ගයට අයත් අපනයනයන් වෙනුවෙන් විශේෂ නියත පරිභරණීක බලපත්‍ර, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය විසින් නිකුත් කළ හැකි ය.

(4) ''අ'' වර්ගයේ භාණ්ඩයන් ආනයන කිරීමට සමහර රාජ්‍යයන් හා අධිරාජ්‍ය නියෝජ නායතන සහ සංයුක්ත මණ්ඩල වලට අවසර දෙනු ඇත.

(5) මෙම ආනයනයන් සඳහා බලපත්‍ර ගාස්තු අය නො කරනු ඇත.

### '' ආ '' වර්ගයේ ආනයන

(1) මෙම වර්ගය යටතේ දැක්වෙන ආනයනයන් සඳහා,

(අ) පෞද්ගලික ආනයත බලපත්‍ර ; හෝ

(ආ) විවෘත පොදු බලපත්‍ර යටතේ අවසර දෙනු ලැබේ.

(2) පෞද්ගලික ආනයන බලපත්‍රයන් යටතේ ආනයනය කළ හැකි භාණ්ඩයන් අංක 2/68 දරන ආනයන පාලන නිවේදනයෙහි 11 වැනි ලේඛනයෙහි දක්වා ඇත. ( ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනය අංක 14, 800/3 සහ අනතුරුව සංශෝධිත අයුරු මෙම වර්ගයේ ආනයන සඳහා නියත පරිභරනික බලපත්‍ර කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය විසින් හෝ ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය විසින් හෝ නිකුත් කරනු ඇත.

(3) විවෘත සාමාන්‍ය බලපත්‍රයන් යටතේ ආනයනය කළ හැකි භාණ්ඩයන් අංක 2/68 දරන ආනයන පාලන නිවේදනයෙහි II ලේඛනයෙහි සඳහන් කොට ඇත. (ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් අංක: 14,800/3 සහ අනතුරුව සංශෝධනය කළ අයුරින් ).

(4) (අ) ' වෙළඳාම ' වෙත දෙනු ලබන ආනයන බලපත්‍ර, ලියා පදිංචි කල ආනයනිකයන් වෙත නිකුත් කැරෙන අතර II ලේඛනයේ සඳහන් වන භාණ්ඩ සඳහා ආනයන සලාක ප්‍රමාණය ද සැපයෙනු ඇත.

(ආ) ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි වී ඇති ආනයනික යින්ට සහ කර්මාන්ත සහ ධීවර අමාත්‍යාංශයෙහි ලියාපදිංචි වී ඇති කාර්මික යන්ට, විවෘත පොදු බලපත්‍ර යටතේ දෙවෙනි ලේඛනයෙහි සඳහන් කොට ඇති ද්‍රව්‍යයන් ආනයනය කළ හැකි වේ.

(5) මෙකී ආනයනයන් සම්බන්ධයෙන් කිසිම බලපත්‍ර ගාස්තුවක් අය නො කරනු ඇත.

(6) ශ්‍රී ලංකා මහ බැංකුවේ බලධාරීත්වය යටතේ නිකුත් කොට ඇති විදේශ විනිමය හිමිකම් සහතික පත්‍රයන් පවරා ගැනීමෙන් වෙළඳ බැංකු විසින් '' ආ '' වර්ගයේ ආනයනයන් සඳහා විදේශ විනිමය නිකුත් කෙරෙනු ඇත. ( 1968 මැයි 5 දින ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් අංක. 14,800/3 ).

'' අ'' සහ '' ආ'' වර්ගයේ ආනයනයන් පිළිබඳව වූ වෙනස්වීම්, 1968 මැයි මස 31 වැනි දින සහ 1968 ඔක්තෝබර් මස 19 වැනි දින පිළිවෙළින් අංක : 14,803/7 සහ අංක : 14,824/1 දරන ලංකාණ්ඩුවේ දින අති විශේෂ ගැසට් පත්‍ර මගින් නිවේදනය කොට ඇත.

අංක: 2/68 දරන ආනයන පාලන නිවේදනයෙහි III වැනි ලේඛනයෙහි දක්වා ඇති භාණ්ඩ යන්, විදේශ ආධාර හෝ ණය ගිවිසුම් යටතේ ආනයනය කළ යුතු වූයේ නම් විදේශ විනිමය සහතිකයන් අනවශ්‍ය වූ විශේෂ ආධාර බලපත්‍ර නිකුත් කරනු ඇත. කෙසේ වුවද, මෙම බලපත්‍ර සඳහා 1968 අංක : 2 දරන ආනයන බලපත්‍ර ( ගාස්තු අය කිරීම ) රෙගුලාසි යටතේ, සියයට 15 ක බලපත්‍ර ගාස්තුවක් දැරීමට සිදු වෙයි.

## විදේශ විනිමය අයවැය ලේඛනය

1968 මැයි මස විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර වැඩ පිළිවෙල ආරම්භ කරන තෙක්, සියළු ම ආනයනයන් සඳහා විනිමය සම්පත් වෙන් කිරීමේ උපකරණයක් වශයෙන්, විදේශ විනිමය අය වැය ලේඛනය ක්‍රියාත්මක වූයේ ය. විදේශ විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය ආරම්භ වීම සහ ඒ සමග විවෘත පොදු බලපත්‍ර යටතේ පුළුල් වර්ගයේ ආනයනයන් විශාල සංඛ්‍යාවක් ගෙන්වීමට හැකි වන පරිදි ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් සමග ම, මීට පෙර විදේශ විනිමය වෙන් කිරීමේ යන්ත්‍රණයක් වශයෙන් ක්‍රියාත්මක වූ විදේශ විනිමය අය-වැය ලේඛනය අඩ වශයෙන් අත්හැර දැමිණි. 1968 වර්ෂය සඳහා විදේශ විනිමය අය-වැය ලේඛනය සකස් කිරීමේ දී වැදගත් ප්‍රතිපත්තීන් දෙකක් සැලකිල්ලට භාජනය විය. එනම්, 1967 නොවැම්බර් මාසයේ දී ලංකා රුපියල අවප්‍රමාණය කිරීම සහ 1968 මැයි මාසයේ දී විදේශ විනිමය සහතික පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීම යන ප්‍රතිපත්ති දෙක විය. ආනයනයන් සඳහා සම්පත් මාර්ගයන් වූයේ, 1968 වර්ෂයේ අපනයන ලැබීම්, 1965, 1966 සහ 1967 දී ගිවිස ගනු ලැබූ ආධාරවල ඉතිරිය ඇතුළු, 1968 වර්ෂයේදී අපේක්ෂිත භාණ්ඩ ආධාර විය.

ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව විසින් '' ලංකාවට ආධාර සපයන සමූහය '' වෙත ඉදිරිපත් කරනු ලැබූ ඇස්තමේන්තුවට අනුකූල වූ 1968 සඳහා මූල්‍ය පරතරයක් සහිතව පිළියෙල වුනු විදේශ විනිමය අය–වැය ලේඛනයක කෙටුම්පතක් පදනම් කර ගනිමින් 1968 මුල් භාගය තුළ ආනයනයන් සඳහා විදේශ විනිමය මුදා හරිනු ලැබීය. වි. වි. හි. ස. ක්‍රමය ඇති කරනු ලැබූ 1968 මැයි මස 6 වැනි දින වන විට, ආනයන බලපත්‍රයන් බොහොමයක් ම දෙනු ලැබුවේ මෙකී විදේශ විනිමය වෙන් කිරීම් හා බැඳීම් අනුවය.

1968 මැයි මස 6 වැනි දින සිට, සියළු ම ගෙවීම් සහ ලැබීම් ගණ දෙකකට වර්ග කරන ලදී. මින් පළමුවන ( 'අ' ගණය ) ගණයෙහි විදේශ විනිමය ලැබීම් සඳහා විදේශ විනිමය සහතික පත් හිමි නොවූවා මෙන් ම 'අ' ගණයෙහි ආනයනයන් වෙනුවෙන් වූ විදේශීය විනිමය ගෙවීම් සඳහා සහතික පත් භාර දීම අවශ්‍ය නොවිය. දෙවැනි (' ආ ' ගණය ) ගණයෙහි ලැබීම් සඳහා විදේශ විනිමය සහතික පත් හිමි වූ අතර, ගෙවීම් වෙනුවෙන් සහතික පත් අවශ්‍ය විය.

'' අ '' වර්ගයට අඩංගු වන ප්‍රධාන වෙළෙඳ භාණ්ඩයන් වූයේ ආහාරපාන, බෙහෙත් වර්ග, රසායනික පොහොර, ඉන්ධන සහ මෝටර් රථ තෙල්, රජයේ දෙපාර්තමේන්තු, පලාත් පාලන ආයතන සහ සෙසු රජයේ සහ අර්ධ රාජ්‍ය ආයතනයන් මගින් ගෙන් වනු ලබන ආනයනයන් ය. මෙකී භාණ්ඩයන් 'අ' වර්ගයට ඇතුළත් කොට ඇත්තේ, ඒවා ජීවන වියදම් කෙරෙහි මූලික වශයෙන් බලපාන හෙයින් හෝ සෞඛ්‍ය සහ ප්‍රවාහනය වැනි මූලික සේවා සපයන ආයතනයන් මගින් ආනයනය කරන ද්‍රව්‍යයන් වන හෙයින් ය.

විවෘත සාමාන්‍ය බලපත්‍රයන් යටතේ ආනයනය කළ හැකි භාණ්ඩයන් 1968 මැයි මස 5 වැනි දින ගැසට් පත්‍රය මගින් නිවේදනය කොට ඇති අතර, අළුත් භාණ්ඩ කිහිපයක් අඩංගු කිරීම සඳහා මින් අනතුරුව එය සංශෝධනය කරන ලදී.[1] 'ආ' ගණය යටතේ වර්ග කොට ඇති අනිකුත් ආනයනයන් සඳහා ආනයනය සහ අපනයන පාලක තැන හෝ කර්මාන්ත සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් නිකුත් කළ බලපත්‍ර අවශ්‍ය වෙයි. II (ඒ) 16 වැනි සංඛ්‍යා සටහනින් 1967 සහ 1968 වර්ෂවලදී නිකුත් කරනු ලැබූ බලපත්‍ර පිළිබඳ තොරතුරු දක්වෙයි.*

## II (ඒ) 16 වැනි සංඛ්‍යා සටහන*

### 1968 ආනයන සැලැස්ම සහ 1967 සඳහා සංසන්දනාත්මක සංඛ්‍යා

රුපියල් දශ ලක්ෂ

| | 1967 දී නිකුත් ලද බල පත්‍ර | 1968 දී නිකුත් කරන ලද බල පත්‍ර | | එකතුව |
|---|---|---|---|---|
| | | 'අ' කොටස | 'ආ' කොටස | |
| ආහාර කොමසාරිස්ගේ ආනයනයන් ... ... ... | 581 | 704 | — | 704 |
| අනෙකුත් ආහාර ද්‍රව්‍ය ... ... ... ... | 253 | 281 | 10 | 291 |
| රෙදිපිළි ... ... ... ... ... | 65 | 43 | 26 | 69 |
| පෝර ... ... ... ... ... ... | 101 | 132 | — | 132 |
| මිහිතෙල් නිෂ්පාදිත ... ... ... ... | 152† | 202‡ | 11 | 213 |
| ඖෂධ ... ... ... ... ... | 17 | 20 | — | 20 |
| සිමෙන්ති ... ... ... ... ... | 15 | 13 | 14 | 27 |
| රජයේ දෙපාර්තමේන්තු ... ... ... ... | 203 | 216 | — | 216 |
| කාර්මික නොවන ආයතන ... ... ... | 68 | 132 | 3 | 135 |
| පෞද්ගලික අංශයේ කර්මාන්ත සහ ධීවර ගෘහකර්මාන්ත සහ සමූපකාර ... ... ... | 305 | 262 | 136 | 398 |
| කාර්මික සමා යතන | 97 | 100 | 202 (අ) | 302 |
| අනෙකුත් වෙළෙඳ සලාක ශීර්ෂ ... ... ... | 185 | 100 | 33 (ආ) | 133 |
| කෙලින්ම පාවිච්චියට ගනු ලබන දේවල් ... ... | 70 | 51 | 200 | 251 |
| එකතුව ... ... ... ... ... | 2,112 | 2,256 | 635 | 2,891 |

මූලය: ආර්ථික හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

* 1967 සහ 1968 සංඛ්‍යා සැසැඳිය නොහැක. මේ දෙවර්ෂය සඳහා මෙම සංඛ්‍යා සැසැඳීමේ දී 1967 නොවැම්බර් මස ලංකා රුපියල් අවප්‍රමාණය කිරීම සහ 1968 සංඛ්‍යා වලට වි. සා. බලපත්‍ර ඇතුළත් කිරීමට ප්‍රතිශතයක් තැබිය යුතුය.

† '' විනිමය පදනමක් නැතිව'' ආනයනය කළ නාවික භාගුවන් ඉන්ධන සඳහා වූ රු. දශ ලක්ෂ 48 ඇතුලුව.

‡ '' විනිමය පදනමක් නැතිව '' ආනයනය කළ නාවික භාගුවන් ඉන්ධන සඳහා වූ රු. දශ ලක්ෂ 71 ඇතුලුව.

(අ) විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතේ සඳහා වූ අමු ද්‍රව්‍ය ආනයනය සඳහා විවෘත වූ රු. දශ ලක්ෂ 135 සඳහා වූ ණය වර ලිපි ඇතුලුව.

(ආ) විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතේ වූ භාණ්ඩ ආනයනය සඳහා විවෘත වූ රු. දශ ලක්ෂ 173 ක් සඳහා වූ ණය වර ලිපි ඇතුලුව.

---

* 1967 සහ 1968 වර්ෂයන් සඳහා ඇති සංඛ්‍යා තොරතුරු සංසන්දනය කළ නො හැකි ය. මෙම වර්ෂයන් දෙක සඳහා සංඛ්‍යා තොරතුරු සැසැඳීමේ දී, 1967 නොවැම්බරයේ දී ලංකා රුපියල අවප්‍රමාණය කිරීම වෙනුවෙන් ඉඩ තැබිය යුතු වන අතර, 1968 සංඛ්‍යා තොරතුරුවලට විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතේ ඇති භාණ්ඩයන් ඇතුළත් කළ යුතු වේ.

1. ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය 1965 මැයි 5 වැනි දින, අංක: 14,800/3 1968 මැයි 31 වැනි දින අංක: 14,800/7, 1968 ඔක්තෝබර් 19 වැනි දින අංක: 14,824/1.

1968 දී නිකුත් කරනු ලැබූ මුළු ආනයන බලපත්‍රයන්ගේ වටිනාකම ( වි. සා. බ. යටතේ ඇති භාණ්ඩ ආනයනය කිරීම සඳහා විවෘත කළ ණයවර ලිපි ද ඇතුළුව ) රුපියල් දශ ලක්ෂ 2,891 ක්වූ අතර, මෙය 1967 දී නිකුත් කළ බලපත්‍ර වටිනාකමට වඩා රුපියල් දශ ලක්ෂ 779 කින් වැඩි විය. මෙය එක් අතකින් බලන කල 1967 නොවැම්බර් මස ලංකා රුපියල අව ප්‍රමාණය කිරීම නිසා බලපත්‍ර ප්‍රතිප්‍රමාණය වීම සහ අනික් අතින් බලන විට, 1968 දී, රුපියල් දශ ලක්ෂ 110 ක ප්‍රමාණයක් 1967 වර්ෂයේ ආනයනය සඳහා නිකුත් කළ බලපත්‍ර, වලංගු කිරීම නිසා යන හේතූන් දෙක කරණ කොට ගෙන සිදු විය.

1968 දී ' අ ' ගණයෙහි ආනයනයන් සඳහා නිකුත් කළ බලපත්‍රවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,256 ක් හෙවත් නිකුත් කළ මුළු බලපත්‍රවල වටිනාකමින් සියයට 75 ක්වූ අතර, '' ආ '' ගණය සම්බන්ධයෙන් බලන විට නිකුත් කළ ආනයන බලපත්‍රවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 635 ක් හෙවත් සියයට 22 ක් විය. දෙවැනි ගණයෙහි එන රාජ්‍ය කාර්මික සංයුක්ත මණ්ඩලයන් සඳහා අමු ද්‍රව්‍ය ආනයනය කිරීමට රුපියල් දශ ලක්ෂ 135 ක් වටිනා ණයවර ලිපි විවෘත කරනු ලැබීය. පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙහි භාණ්ඩ, ආධාර වැඩ සටහන් සතර යටතේ, 1968 දී ආනයනය කළ භාණ්ඩවල මුළු වටිනාකම දැක්වෙයි.

## II (ඒ) 17 වැනි සංඛ්‍යා සටහන

### ද්‍රව්‍යාධාර සැලැස්ම – 1968 දී ලැබීම්

රුපියල් දශ ලක්ෂ

| | සැලැස්ම යටතේ පාරිභෝගික භාණ්ඩ 1 | 2 | 3 | 4 | එකතුව | අන්තර් සහ ආයෝජන භාණ්ඩ 1 | 2 | 3 | 4 | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව ... | — | — | 1.11 | 3.79 | 4.90 | — | — | 0.61 | 0.97 | 1.58 | 6.48 |
| ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව | — | — | — | 0.92 | 0.92 | — | 12.76 | 11.02 | 1.81 | 25.59 | 26.51 |
| ඉන්දියාව ... | — | — | — | — | — | — | — | 6.43 | — | 6.43 | 6.43 |
| ජපානය ... | — | — | 0.61 | — | 0.61 | — | 6.33 | 21.74 | — | 28.07 | 28.68 |
| ප්‍රංශය ... | — | 0.14 | — | — | 0.14 | — | 12.65 | — | — | 12.65 | 12.79 |
| එක්සත් රාජධානිය | — | — | — | — | — | 3.36 | 12.68 | 37.43 | 24.0 | 55.87 | 55.87 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 0.03 | 57.56 | 49.87 | — | 107.46 | 1.81 | 15.13 | — | — | 16.94 | 124.40 |
| කැනඩාව ... | — | — | ... | 11.00 | 11.00 | 0.09 | 1.50 | 0.41 | | 2.00 | 13.00 |
| එකතුව ... | 0.03 | 57.70 | 51.59 | 15.71 | 125.03 | 5.26 | 61.05 | 77.64 | 5.18 | 149.13 | 274.16 |

මූලය: ආර්ථික හා ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව

1968 දී වැඩ සටහන් සතර යටතේ ගෙන්වනු ලැබූ භාණ්ඩ ආධාරයන්හි මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 274.16 ක් වූ අතර, මින් රුපියල් දශ ලක්ෂ 149.13 ක් හෙවත් සියයට 54.5 ක් අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩයන්ගෙන් ද, රුපියල් දශ ලක්ෂ 125.03 ක් හෙවත් සියයට 45.5 ක් පාරිභෝජන භාණ්ඩවලින් ද සමන්විත වූහ. ගලා ආ ආධාරවලින් විශාල කොටසක්, එනම් රුපියල් දශ ලක්ෂ 129.23 ක් තුන්වන වැඩ සටහන යටතේ වූ අතර, පළමුවන, දෙවන සහ සිව්වන ආධාර වැඩ සටහන් යටතේ ගලා ආ ආධාර ප්‍රමාණය පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 5.29, රුපි. දශ ලක්ෂ 118.75 සහ රුපියල් දශ ලක්ෂ 20.89 ක් විය. වැඩ සටහන් සතර යටතේ රටවල් අටක් ආධාර සපයනු ලැබීය.

II (ඒ) 18 වැනි සංඛ්‍යා සටහන, 1968 දී ගලා ආ ආධාර ප්‍රමාණය, භාණ්ඩයන්ට අනුව වර්ගකොට ඇත. අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ කොටසෙහි, පොහොර කාර්මික අමු ද්‍රව්‍ය හා යන්ත්‍ර සූත්‍ර සහ වෙළෙඳාම සඳහා ගෙන්වන ලද රථ වාහන, ගලා ආ ආධාරවලින් විශාල ම කොටස වූ අතර, 1968 දී මෙවා, පිළිවෙලින් සියයට 22.7 ක්, සියයට 9.2 ක් සහ, සියයට 8.2 ක් විය. පාරිභෝජන භාණ්ඩ අතුරින් තිරිඟු පිටි, සහ ටයර් හා ටියුබ් ප්‍රධාන ආනයනයන් වූ අතර, 1968 දී රට වෙත ගලා ආ ආධාර ප්‍රමාණයෙහි මුළු වටිනාකමින්, පිළිවෙලින්, සියයට 42.2 ක් සහ සියයට 1.9 ක් විය.

## II (ඒ) 18 වැනි සංඛ්‍යා සටහන

### 1968 දී ආධාර ලැබීම—භාණ්ඩ අනුව

| භාණ්ඩ | වටිනාකම රු. දශ ලක්ෂ | සියයට ගණන |
|---|---|---|
| අන්තර් සහ ආයෝජන භාණ්ඩ | 62.32 | 22.7 |
| පෝර ... ... ... ... ... ...... | 25.25 | 9.2 |
| කාර්මික අමුද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ... ... ... ... | 6.28 | 2.3 |
| ට්‍රැක්ටර් සහ අමතර කොටස් ... ... ... ... | 1.81 | 0.7 |
| අනෙකුත් යන්ත්‍රෝපකරණ සහ අමතර කොටස් ... ... ... | 22.47 | 8.2 |
| වාණිජමය රථවාහන ... ... ... ... ... | 3.83 | 1.4 |
| ගොඩනැගිලි උපකරණ ... ... ... ... ... | 2.17 | 0.8 |
| කාර්මික ද්‍රව්‍ය ... ... ... ... ... ... | 0.41 | 0.2 |
| කඩදාසි සහ මුද්‍රණ කඩදාසි ... ... ... ... ... | 0.61 | 0.2 |
| නාවික ඇන්ජින් යන්ත්‍ර ... ... ... ... ... | 0.02 | ... |
| නීච ලෝහ ... ... ... ... ... ... | 13.37 | 4.9 |
| රජයේ දෙපාර්තමේන්තු සහ සමායතන සහ අනෙකුත් ආයතනයන් ... | 1.37 | 0.5 |
| පෞද්ගලික අංශය සඳහා අනෙකුත් උපකරණ ... ... ... | 7.37 | 2.7 |
| රථවාහන අමතර කොටස් ... ... ... ... ... | 0.53 | 0.2 |
| බීර අර්තාපල් ... ... ... ... ... ... | 0.43 | 0.2 |
| යෝග්‍යතා නිරීක්ෂණ ... ... ... ... ... | 0.89 | 0.3 |
| උක් වැවීමේ උපකරණ ... ... ... ... ... | 149.13 | 54.5 |
| එකතුව ... ... ... ... ... | | |
| පාරිභෝගික භාණ්ඩ | 115.78 | 42.2 |
| තිරිඟු පිටි ... ... ... ... ... ... | 2.99 | 1.1 |
| ඉරිඟු ... ... ... ... ... ... | 5.34 | 1.9 |
| ටයර් සහ ටියුබ්... ... ... ... ... ... | 0.55 | 0.2 |
| ඖෂධ ... ... ... ... ... ... | 0.37 | 0.1 |
| කිරි ආහාර ... ... ... ... ... ... | 125.03 | 45.5 |
| එකතුව ... ... | | |
| මුළු එකතුව ... ... ... ... ... | 274.16 | 100.0 |

මූලය: ආර්ථික හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය

**තීරුබදු :—** වර්ෂය තුළදී ආනයන සහ අපනයන, තීරු බදු සම්බන්ධයෙන් පහත සඳහන් වෙනස්වීම් සිදු කෙරුණි.

**අපනයන බදු :—** 8. 5. 1968 — පැකට් කරන ලද තේ සම්බන්ධයෙන් වූ අපනයන බද්ද, රාත්තලකට ශත 25 දක්වා, රාත්තලකට ශත 15 කින් අඩු කරන ලදී. සෑම පැකට්ටුවකම ශුද්ධ බර රාත්තල් 2.20 කට හෙවත් කිලෝග්‍රෑම් 1 කට වඩා වැඩි නොවිය යුතු වන අතරම, සෑම පැකට්ටුවකම ආවරණයෙහි හෝ පිට කවරයෙහි '' ලංකාවේ පැකට් කරන ලද පිරිසිදු ලංකා තේ '' යනුවෙන් සඳහන් විය යුතුය. ( ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය, අංක 14,813,9 ).

9. 10. 1968 — ක්ෂණික තේ රාත්තලක් සඳහා වූ ශත 40 ක අපනයන තීරුබද්ද අහෝසි කරන ලදී. ( ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය, අංක 14,822,4 ).

16. 11. 1968 — වටිනා සහ අර්ධ — වටිනා ගල් වර්ග සඳහා වූ සියයට 5 ක වටිනාකම අනුව ඇති තීරුව අහෝසි කරන ලදී. ( ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය, අංක 14,828,1 ).

**ආනයන තිරුබදු :—** 3. 8. 1968 — මෙතෙක් පැවති එස්. අයි. ටී. සී. මත පදනම් වූ රේගු තීරු බදු වෙනුවට, 1968 අගෝස්තු මස 3 දින පටන්, බ්‍රසල්ස් නාමාවලිය පදනම් වූ නව රේගු තීරුබදු ක්‍රියාත්මක විය. නව තීරු බදු ක්‍රමය යටතේ සියළුම ගණයේ ආනයනයන් නිශ්චිත වශයෙන් වර්ගීකරණය කර ඇති අතර, පහත දැක්වෙන පදනම් මත ආනයන බදු ප්‍රමිත කර ඇත.

(අ) තීරු බද්දෙන් නිදහස් : ආහාර ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය, අත්‍යාවශ්‍යක පාරිභෝගික භාණ්ඩ, කාර්මික සහ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ.

(ආ) අත්‍යාවශ්‍යක නොවන භාණ්ඩ සඳහා සියයට 10 ක වරණීය සහ සියයට 20 ක සාමාන්‍ය තීරු බද්දක්.

(ඇ) ඡායාරූප ගැනීමේ කටයුතු සඳහා ගෙන්වන භාණ්ඩ, විදුලි ආලෝකය සැපයීම සහ සංඥා දීමේ උපකරණ, මයික්‍රොෆෝන් යනාදිය වෙනුවෙන් රජයේ ආදායම සඳහා පැණ වුනු සියයට 50 සිට 60 අතර වූ තීරු බදු.

(ඈ) සියයට 100 ආරක්ෂණ තීරු බදු — විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතේ ගෙන්වන සමහර භාණ්ඩයන් සඳහා තීරු බදු පැණවූයේ අතිරික්ත ආනයනය වැළැක්වීමට සහ දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට ය.

(ඉ) සියයට 300 දක්වා තහනම් තීරු බදු — මත්පැන්, දුම්කොළ, සුඛෝපභෝගී රථවාහන යනාදිය සඳහා.

## වෙළඳ ගිවිසුම්[1]

### රුමේනියානු සමාජවාදී ජන රජය

1956 මාර්තු මස 16 දින ඇති කළ වෙළඳ සහ ගෙවුම් පිළිබඳ ගිවිසුමෙහි ආකෘතියට අනුව, 1968 පෙබරවාරි මස 9 වන දින, රුමේනියානු සමාජවාදී ජන රජය සමග, ආර්ථික සහ කාර්මික ශිල්පීය සහයෝගතා ගිවිසුමක් අත්සන් කරනු ලැබිය. මෙම ගිවිසුමට අනුව, රුමේනියානු අර්ථ ක්‍රමයට අවශ්‍ය ලාංකික භාණ්ඩයන් සැපයීමට ලංකාව එකඟ වූ අතර, ඒ වෙනුවට රුමේනියාව විසින් ප්‍රාග්ධන භාණ්ඩ, සේවා සහ කාර්මික ශිල්පීය ආධාර ලබා දීමට කැමැත්ත පළ කළේය. එදින හුවමාරු කර ගන්නා ලද ලියකියවිලි මගින්, 1968 සිට 1975 දක්වා වාර්ෂිකව රබර් ටොන් 10,000 ක් රුමේනියානු සමූහාණ්ඩුවට සැපයීමට ලංකාව එකඟ වූවාය. දෙපක්ෂය විසින් සෑම වර්ෂයක් ආරම්භයේදී ම, එම වර්ෂයේ දී නැව්ගත කළ යුතු නියමිත භාණ්ඩ ප්‍රමාණය සහ කොන්දේසි පිළිබඳ එකඟතාවයක් ඇති කරගත යුතුය.

### සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය

1968 අගෝස්තු මස 4 වැනි දින, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය සමග 1969 ජනවාරි 1 වැනිද සිට ක්‍රියාත්මක වන පරිදි, 1969 සහ 1970 වර්ෂයන් තුලදී ගිවිසුමක් ඇතිකර ගන්නා ලදී. 1958 පෙබරවාරි 8 දින ඇති කර ගන්නා ලද වෙළඳ සහ ගෙවුම් පිළිබඳ ගිවිසුමෙහි විධිවිධානයන් අනුව, මෙම භාණ්ඩය හුවමාරු කර ගැනීම් ක්‍රියාත්මක කළ යුතු විය.

---

1. මෙම ඡේදයෙහි සාකච්ඡා කරන ලද වෙළඳ ගිවිසුම් හැරුනු විට, තවත් රටවල් කිහිපයක් ම සමග වෙළඳ සහ හෝ ගෙවුම් පිළිබඳ ගිවිසුම් පවත්වා ගෙන යන ලදී.